# දෙවැනි කොටස

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පටුන |
|---|---|
| ගිණුම් සහ බැංකු ක්‍රියාකාරිත්වය | (I) |
| ව්‍යවහාර මුදල් නිකුතුව | (VI) |
| බැංකු සංවර්ධන | (VII) |
| බැංකු අධීක්ෂණ | (XI) |
| බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | (XIV) |
| සංවර්ධන මුදල් | (XVII) |
| ග්‍රාමීය ණය | (XX) |
| මූල්‍ය වෙළෙඳපොළ | (XXVIII) |
| පර්යේෂණ කටයුතු | (XXXI) |
| සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ | (XXXII) |
| සේවක අර්ථ සාධක අරමුදල | (XXXV) |
| විනිමය පාලන | (XXXVIII) |
| රාජ්‍ය ණය | (XL) |
| බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය | (XLVI) |
| ලේකම් දෙපාර්තමේන්තුව | (XLVIII) |
| නීති | (XLIX) |
| පරිශ්‍ර | (XLIX) |
| නව ගොඩනැගිලි | (XLIX) |
| ආරක්ෂක සේවා | (L) |
| ප්‍රවෘත්ති | (L) |
| තොරතුරු තාක්ෂණ | (LI) |
| කළමනාකාරිත්ව විගණන | (LII) |
| පුහුණු වැඩ කටයුතු | (LIII) |
| සුභසාධන | (LV) |
| කාර්ය මණ්ඩල පුවත් | (LV) |

# ගිණුම් සහ බැංකු ක්‍රියාකාරිත්වය

## ගිණුම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 6.3 ක වර්ධනයක් පෙන්නුම් කරමින් බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය 1999 අග වනවිට රුපියල් දශ ලක්ෂ 200,586 ක් ලෙස වාර්තා විය. ජාත්‍යන්තර සංචිතයෙහි සාපේක්ෂ තත්ත්වය 1998 පැවැති සියයට 67.4 සිට සියයට 54.4 දක්වා අඩු වුවද, එය තවදුරටත් බැංකුවේ විශාලතම තනි වත්කම් කාණ්ඩය ලෙස පැවතිණ. ජාත්‍යන්තර සංචිතයෙහි වූ මෙම අඩු වීමට බලපෑ හේතු සාධක වූයේ විදේශීය රාජ්‍ය ණය ආපසු ගෙවීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කරන ලද ගෙවීම් සහ මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට අලෙවි කරන ලද (ශුද්ධ) විදේශ විනිමය ප්‍රමාණයයි.

මේ අතර බැංකුවේ දේශීය වත්කම් ප්‍රමාණය 1998 අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 40,465 සිට 1999 අවසානයේ රුපියල් දශ ලක්ෂ 62,598 දක්වා සියයට 54.7ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර 2000 ට අදාළ වූ පරිගණක ගැටළුව පෙරදැරි කරගෙන දක්නට ලැබුණු රුපියල් ද්‍රවශීලතා දැඩියාව අඩු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ විවට වෙළඳපළ කටයුතු නිසා බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජන ප්‍රමාණයේ ඉහළ යාම හා වර්ෂය අවසානයේදී වූ කාලීන සාධකයන්ය. අනෙක් අතට, 1999 දී වාණිජ බැංකු සහ අනෙකුත් ආයතනවලට සපයන ලද මධ්‍යම හා දිගුකාලීන ණය ප්‍රමාණයෙහි සියයට 32.9 ක පහළ යාමක් පෙනෙන්නට තිබුණු අතර, අර්ධ වශයෙන් එයට හේතු වූයේ ණය ආපසු ගෙවීම හා අක්‍රීය ණය වෙනුවෙන් කරන ලද ප්‍රතිපාදනයන්ය. 1999 වර්ෂය තුළ වාණිජ බැංකුවලට සපයන ලද කෙටිකාලීන ණය අත්තිකාරම්වලද සියයට 51.2 ක පහළ යාමක් වාර්තා විය.

බැරකම් අංශය සලකන කල "සංසරණයෙහි වූ ව්‍යවහාර මුදල්" විශාලතම බැරකම් කාණ්ඩය වූ අතර කාලීන ඉල්ලුම හා වසර 2000 පරිගණක ගැටළු වලට අදල හේතු නිසා එය 1998 දී පැවැති රුපියල් දශ ලක්ෂ 60,087 සිට 1999 රුපියල් දශ ලක්ෂ 70,210 දක්වා සියයට 16.8 කින් වැඩි විය. සාමාලෝචන වර්ෂය තුළ තැන්පතු ප්‍රමාණය බැංකුවේ මුළු වගකීම් ප්‍රමාණයෙන් සියයට 30.7 ක් විය. මෙම කාණ්ඩය තුළ රජයේ තැන්පතු සියයට 20.7 කින් පහළ ගිය අතර ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා යටතේ වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි වූ අඩු වීම හේතුවෙන් සියයට 7.7 කින් පහළ ගියේය. ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය සහ විදේශීය බැංකු ආයතනවල තැන්පතු සියයට 4 කින් අඩු විය. බැංකුවේ වත්කම් හා වගකීම්වලට අදළ ප්‍රධාන සංරචකවල සංසන්දනයක් II-2 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

1999 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂයේ ලාභාලාභ ගිනුම සමග 1999 දෙසැම්බර් 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය සංඛ්‍යා සටහන් II-1 හි දක්වේ.

1998 රුපියල් දශ ලක්ෂ 17,897 ට සාපේක්ෂව බැංකුවේ දළ ආදායම 1999 දී රුපියල් දශ ලක්ෂ 18,675 ක් විය. බැංකුවේ ආදායමෙන් සියයට 71 ක් පමණ ජනනය වූයේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය තුළින් ලත් ඉපැයීමෙන් වූ අතර දේශීය මූලාශ්‍ර මගින් උපයන ලද පොලී ආදායම බැංකුවේ මුළු ආදායමෙන් සියයට 29.4 ක් පමණ විය. බැංකු ක්‍රියාකාරිත්වයෙහි කාර්යක්ෂමතාවය පෙන්නුම් කෙරෙන "වත්කම් පිරිවැටුම් අනුපාතිකය" එනම්, මුළු ආදායම සාමාන්‍ය මුළු වත්කම්වලට දක්වන ප්‍රතිශතය 1999 වර්ෂය තුළ සියයට 9.6 ක නොවෙනස් මට්ටමක පැවැතුණි.

බැංකුවේ දළ වියදමද 1998 රුපියල් දශ ලක්ෂ 14,897 සිට 1999 රුපියල් දශ ලක්ෂ 15,475 දක්වා වැඩි විය. මින් සියයට 14.2 ක් පරිපාලන වියදම් සඳහා වූ අතර සියයට 68.4 ක් පොලී ගෙවීම් කටයුතු සඳහා විය. වියදම් හා සංචිත සඳහා වෙන් කිරීම් සහ ක්ෂය වීම් හා බොල් ණය සඳහා වූ ප්‍රතිපාදන වලින් පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශ ලක්ෂ 3,200 රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට හෝ මුදල් නීති පනතේ 39(ඇ) වගන්තිය ප්‍රකාර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා යොද ගැනේ.

## ගණකාධිකරණ ප්‍රතිපත්ති

### පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළි ගැණුනු ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමග ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

### විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා බැරකම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුණු, මධ්‍ය විනිමය අනුපාතිකය පදනම් කරගෙන පරිවර්තනය කර ඇත.

### ආයෝජන

සියළුම ආයෝජන පිරිවැය අනුව ගණනය කර ඇත.

### අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම් මූල්‍ය සමාගම් වලින් අය විය යුතුව ඇති අක්‍රීය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වේ.

| අක්‍රීය ණයවල කාල පරිච්ඡේද (මාස) | ප්‍රතිපාදන(%) |
|---|---|
| 6 - 12 | 20 |
| 12 - 18 | 50 |
| 18 ට වැඩි | 100 |

## II-1 සංඛ්‍යා සටහන

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 1999 දෙසැම්බර් මස 31 වැනි දිනට සාමාන්‍ය ශේෂ පත්‍රය

රුපියල්

### බැ ර ක ම්

| 1998 දෙසැම්බර් මස 31 දින | | | 1999 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය | 1,50,00,000 | |
| 98,50,00,000 | 100,00,00,000 | අතිරික්තය | 98,50,00,000 | 100,00,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 5,777,09,36,107 | | නෝට්ටු | 6,764,20,19,005 | |
| 231,58,83,092 | 6,008,68,19,199 | කාසි | 256,78,37,948 | 7,020,98,56,953 |
| | | **තැන්පතු** | | |
| 310,84,59,238 | | රජය | 246,28,75,895 | |
| 3,11,80,173 | | රාජ්‍ය නියෝජ්‍යතා හා ආයතන | 1,46,93,408 | |
| 3,274,79,01,779 | | වෙළෙඳ බැංකු | 3,021,96,90,513 | |
| 2,967,83,06,986 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන | 2,846,45,27,121 | |
| 18,36,362 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 6,31,94,400/-හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 12,45,562 | |
| 60,18,26,176 | 6,616,95,10,714 | අනෙකුත් | 50,26,43,702 | 6,166,56,76,201 |
| | 492,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල | | 492,50,00,000 |
| | 56,01,12,500 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම් | | 56,18,22,500 |
| | 5,503,16,48,947 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 6,222,37,03,560 |
| | 18,867,30,91,360 | | | 20,058,60,59,214 |

### ව ත් ක ම්

| 1998 දෙසැම්බර් මස 31 දින | | | 1999 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 5,938,12,77,514 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ | 2,084,03,44,684 | |
| 6,771,67,13,296* | | විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් | 8,731,59,52,047 | |
| 7,60,10,468 | 12,717,40,01,278 | විශේෂ ආපසු ගැනීම් හිමිකම් | 6,62,59,739 | 10,822,25,56,470 |
| | | **දේශීය වත්කම්** | | |
| 3,054,50,99,947 | | ණය සහ අත්තිකාරම් රජයට | 3,566,58,69,959 | |
| 109,82,94,677 | | අනෙකුත් අයට-මධ්‍යම හා දීර්ඝකාලීන | 73,66,73,603** | |
| 2,32,00,000 | | කෙටිකාලීන | 1,13,18,501 | |
| 823,83,76,231 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් | 2,562,27,31,925 | |
| 56,01,12,500 | 4,046,50,83,355 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා | 56,18,22,500 | 6,259,84,16,488 |
| | 2,103,40,06,727 | අනෙකුත් වත්කම් හා ගිණුම් | | 2,976,50,86,256 |
| | 18,867,30,91,360 | | | 20,058,60,59,214 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රු.57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු.29,33,697 ක් සහ රු.34,340 ක් විය.

**පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අය කරගත නොහැකි ණය සඳහා රු.218,06,83,507 ක ප්‍රතිපාදන අඩුකර ඇත.

## 1999 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

රුපියල්

| 1998 | | 1999 | 1998 | | 1999 |
|---|---|---|---|---|---|
| 1,489,71,53,928 | සාමාන්‍ය විසදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාලීය උපකරණ සඳහ ක්ෂය කිරීම ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම් | 1,547,49,17,309 | 1,789,71,53,928 | පොලී ආදිය | 1,867,49,17,309 |
| | <u>වර්ෂයේ ශුද්ධ ලාභය</u> | | | | |
| 300,00,00,000 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 320,00,00,000 | | | |
| 1,789,71,53,928 | | 1,867,49,17,309 | 1,789,71,53,928 | | 1,867,49,17,309 |

ඒ.එස්.ජයවර්ධන
අධිපති.

එම්.බී දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී.

විගණකාධිපති සටහන :

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1999 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 42(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පනතේ 42(2) වගන්තිය ප්‍රකාර මුදල් අමාත්‍යවරිය වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

2000 අප්‍රේල් මස 24 දින.
කොළඹ 7.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේදී ය.

එස්.එම්.සබ්රි.
විගණකාධිපති.

II - 2 සංඛ්‍යා සටහන

**1998 සහ 1999 මුදල් වර්ෂවල අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා බැරකම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම**

බැරකම්

| අයිතමය | 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ | % | 1999 අවසානයේදී රුපියල් දශ ලක්ෂ | % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන සහ අතිරික්තය | 1,000 | 0.5 | 1,000. | 0.5 |
| සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් නෝට්ටු | 60,087 | 31.9 | 70,210 | 35.0 |
| මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල | 66,169 | 35.1 | 61,666 | 30.7 |
| ප්‍රාග්ධන දයක දීමනා ගිණුම | 4,925 | 2.6 | 4,925 | 2.5 |
| ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | 560 | 0.3 | 562 | 0.3 |
| අනෙකුත් බැරකම් | 55,932 | 29.6 | 62,223 | 31.0 |
| නිකුත් කරන ලද ඇපකර | 3,502 | 1.8 | 8,790 | 4.4 |
| පාලන ගිණුම් සංචිත | 22,559 | 12.0 | 24,363 | 12.1 |
| විශේෂ හැර ගැනීම් හිමිකම් ලැබීම් | 6,051 | 3.2 | 6,693 | 3.3 |
| ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යාගණනය ගිණුම | 7,262 | 3.8 | 2,727 | 1.5 |
| ලාභාලාභ ගිණුම | 5,102 | 2.7 | 5,480 | 2.7 |
| ආසියානු නිෂ්කාශන සංගම් ගිණුම | 6,247 | 3.3 | 8,689 | 4.3 |
| අනෙකුත් | 5,209 | 2.8 | 5,481 | 2.7 |
| එකතුව | 188,673 | 100.0 | 200,586 | 100.0 |

වත්කම්

| අයිතමය | 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ | % | 1999 අවසානයේදී රුපියල් දශ ලක්ෂ | % |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | 127.174 | 67.4 | 108.223 | 54.0 |
| දේශීය වත්කම් | 40,465 | 21.4 | 62,598 | 31.2 |
| අනෙකුත් වත්කම් | 21,034 | 11.2 | 29,765 | 14.8 |
| නිකුත් කරන ලද ඇපකර වෙනුවෙන් තැන්පත්කරුවන්ගේ වගකීම | 3,502 | 1.9 | 8,790 | 4.4 |
| වෙළෙඳ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ගිණුම ගැලපීම් ගිණුම (ලැබිය යුතු මුදල්) | 3,993 | 2.1 | 3,843 | 1.9 |
| එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ | 2,137 | 1.1 | 2,701 | 1.3 |
| අනෙකුත් | 11,402 | 6.1 | 14,431 | 7.2 |
| එකතුව | 188.673 | 100.0 | 200.586 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායේ පිරිවැය වටිනාකමෙන් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දක්වෙන අනුපාතිකයනට අනුකූලව හීන වන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම්ගත කර ඇත.

| අයිතමය | වාර්ෂික % |
|---|---|
| ගොඩනැගිලි | 2 |
| සවි කිරීම් සහ උපකරණ | 10 |
| කාර්යාලයීය ලී බඩු සහ උපකරණ | 10 |
| මෝටර් රථ | 10 |
| ස්වයංක්‍රීය කුඩා උපකරණ | 20 |
| AS/400 ප්‍රධාන පටල පරිගණක | 20 |
| පරිගණක හා පරිගණක උපකරණ | 25 |
| පුස්තකාල පොත් | 33 1/3 |

වසර තුළදී මිළදී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර, වර්ෂය තුළදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදනයන් සළසා නැත.

## තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුළදී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර, වර්ෂය අවසානයේ ඇති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදු කර නොමැත.

## අයහාර ගණනය

මුදල් පදනම මත ගණනය කර ඇති අක්‍රීය ණය වෙනුවෙන් වූ පොලී හැරුණුවිට අනෙකුත් පොලී හා ආදායම් උපචිත පදනම මත පොත්වල සටහන් කර ඇත.

## ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය සියළුම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැළසීමෙන් අනතුරුව වේ.

(අ) අක්‍රීය ණය සඳහා ප්‍රතිපාදන.

(ආ) ස්ථාවර වත්කම් ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන.

(ඇ) අනෙකුත් ප්‍රතිපාදන සහ මුදල් නීති පනතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම.

## බැංකු කටයුතු

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව සුපුරුදු පරිදි පහත සඳහන් කටයුතුවල තවදුරටත් නියැලුණි. බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය, විනිමය අනුපාත කළමනාකරණය, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සහ විවෘත වෙළඳපළ කටයුතු මගින් දේශීය මූල්‍ය ප්‍රතිපත්ති පියවරයන් දියත් කිරීම, රජයේ, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතනවල ගිණුම් කටයුතු පවත්වාගෙන යාම, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවි නියෝජිතවරුන් හා ජාත්‍යන්තර සංවිධානවලට අයත් ගිණුම් පවත්වාගෙන යාම සහ මහ බැංකු ශේෂ පත්‍ර සහ අවසාන ගිණුම් කටයුතු පිළියෙල කිරීම.

## විදේශ විනිමය කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්ලාභී වාණිජ බැංකු සමග ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයට සම්බන්ධ එතැන් ගැණුම් හා විකුණුම් මගින් විදේශ විනිමය කටයුතු දිගටම කරගෙන යන ලදී.

බලපත්ලාභී වාණිජ බැංකු වලින් 1998 වසර තුළදී මිලදී ගත් විදේශ විනිමය වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 3,845 ට සාපේක්ෂව 1999 මිලදී ගත් විදේශ විනිමය වටිනාකම රුපියල් දශ ලක්ෂ 28 ක් විය. ඉකුත් වසරේ එම බැංකුවලට අලෙවි කරන ලද විදේශ විනිමය වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 13,695 ට සාපේක්ෂව සමාලෝචන වර්ෂය තුළ විකුණූ විදේශ විනිමය ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,018 ක් විය.

මහ බැංකුව සිය විදේශ විනිමය සංචිත ප්‍රධාන මුදල් පහකට අදාළව ස්ථාවර ආදයම් වත්කම්වලද මුදල් වර්ග 9 කට අදාළව කෙටිකාලීන මූල්‍ය වෙළඳපොළවලද ආයෝජනය කරන ලදී.

II - 3 සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු සමග කළ විදේශ විනිමය ගණුදෙනු - 1999**

(දහස් ගණනින්)

| මාසය | එතැන් මිලදී ගැනීම් | | එතැන් විකුණුම් | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. |
| ජනවාරි | - | - | 26,350 | 1,793,191 |
| පෙබරවාරි | - | - | 12,850 | 882,412 |
| මාර්තු | - | - | 4,600 | 316,894 |
| අප්‍රේල් | 400 | 27,956 | - | - |
| මැයි | - | - | - | - |
| ජූනි | - | - | 5,750 | 407,535 |
| ජූලි | - | - | - | - |
| අගෝස්තු | - | - | 4,980 | 354,500 |
| සැප්තැම්බර් | - | - | 3,700 | 263,366 |
| ඔක්තෝබර් | - | - | - | - |
| නොවැම්බර් | - | - | - | - |
| දෙසැම්බර් | - | - | - | - |
| එකතුව | 400 | 27,956 | 58,230 | 4,017,898 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## විවෘත වෙළඳ කටයුතු

ඉකුත් වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 11,934 ට සාපේක්ෂව මහ බැංකුවේ ද්විතීය වෙළඳපොළේ (වට්ටම් කළ) භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1999 දී රුපියල් දශ ලක්ෂ 6,982 ක් විය. සියයට 42 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 4,952 ක් වූ මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන්ම ප්‍රවර්ථන වර්ෂයේ අග භාගයේදී පැවැති දැඩි ද්‍රවශීලතා තත්ත්වයයි.

මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත්වල මිලදී ගැනීම්ද (ප්‍රතිවට්ටම් කළ) 1998 වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 14,969 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 1,443 දක්වා සැළකිය යුතු අන්දමින් අඩු විය. ප්‍රතිශතයක් ලෙස ගත් කල මෙය සියයට 90 ක අඩු වීමක් වූ අතර, මෙයට හේතු වූයේ බලපත්ලාභී වාණිජ බැංකු හා වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවනට සිය ක්ෂණික මුදල් අවශ්‍යතා භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රති විකුණුම් පහසුකම් යටතේ සපුරාගත හැකි වීමය. 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 1,446 හා සංසන්දනාත්මකව බලන කල 1999 වර්ෂයේදී මහ බැංකුව විසින් බැංකුවලට සපයන ලද ප්‍රති විකුණුම් පහසුකම්වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 137,829 ක් විය.

මහ බැංකුවේ ද්විතියක වෙළඳපොළ ඵලද අනුපාතික, සලකා බලනු ලබන වර්ෂය තුළදී ප්‍රාථමික වෙළඳපොළ ඵලද අනුපාතිකවල උපනතිය සමග ගමන් කරනු දිස් විය. තෙමස් සහ සමස් භාණ්ඩාගාර බිල්පත්වලට අදාළව මහ බැංකුවේ ද්විතීය කවුලුවේ දිස් වූ ඵලද අනුපාතික වර්ෂයේ ආරම්භයේදී පිළිවෙලින් සියයට 11.86 සහ සියයට 12.19 සිට වර්ෂයේ අග භාගය වනවිට පිළිවෙලින් සියයට 11.57 සහ සියයට 12.09 දක්වා අඩු විය. එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත්වලට අදළ ඵලද අනුපාතික වර්ෂය තුළදී සියයට 12.39 සිට සියයට 12.54 දක්වා මඳ වශයෙන් වැඩි වූ අතර ඵලදයිතා අනුපාතිකයද එම කාලච්ඡේදය තුළදී සියයට 12.54 සිට සියයට 12.69 දක්වා ඉහළ ගියේය.

## ප්‍රති මිලදී ගැනීම් වෙළඳපොල

වෙළඳපොළෙහි අධි ද්‍රවශීලතාවයෙහි සැළකිය යුතු අඩු වීම පිළිබිඹු කරමින් ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම් යටතේ 1999 වර්ෂය තුළ අලෙවි කරන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 728,757 සිට රුපියල් දශ ලක්ෂ 307,795 දක්වා සියයට 58 කින් අඩු විය.

වසර මුලදී සියයට 11.0 ක් වූ එක් දින ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය වසර අග වනවිට ක්‍රමයෙන් සියයට 9.25 දක්වා අඩු කරන ලදී. දිගින් දිගටම පහළ වැටුණු උද්ධමනය හා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපළ ඵලදයිතාවේ පහළ යාම හේතුවෙන් ප්‍රතිමිලදී ගැනීම් අනුපාතික පහළ මට්ටමකට ගෙන ඒමට මහ බැංකුවට හැකි විය. 1999 වසර තුළ මහ බැංකුව බලපත්ලාභී වාණිජ

බැංකු හා බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සමග ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම යටතේ කරන ලද ගණුදෙනු පරිමාවේ අඩු වීමට මෙයද බලපෑ තවත් හේතුවක් විය.

## ප්‍රති විකුණුම් වෙළඳපොල

1999 වර්ෂය තුළ මහ බැංකුවේ ප්‍රති විකුණුම්වල වටිනාකම භාණ්ඩාගාර බිල්පත්වලට එරෙහිව රුපියල් දශ ලක්‍ෂ 137,829 ක් වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කරවලට එරෙහිව රුපියල් දශ ලක්‍ෂ 75,520 ක් විය. වසර 2000 ට අදාළව වූ පරිගණක ගැටළු මත ඇති විය හැකි යයි අපේක්‍ෂිත වූ දැඩි ද්‍රවශීලතා හිඟ තත්ත්වය ලිහිල් කිරීමේ අරමුණින් යුතුව මහ බැංකුව ප්‍රතිවිකුණුම් පහසුකම් කාලය 1999 දෙසැම්බර් 21 දින සිට දින 30ක් දක්වා දීර්ඝ කරන ලදී.

## මහ බැංකු පොලී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය ප්‍රකාර බලපත්‍ර ලත් වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු පොලී අනුපාතිකය 1999 අගෝස්තු මස 13 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 17 සිට සියයට 16 දක්වා අඩු කරන ලදී.

## කෙටිකාලීන ණය

1994 අප්‍රේල් මස අවසන් වූ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ පෙර ණය ගොවීනට චක්‍රීය ණය පහසුකම් සැපයූ බලපත්‍ර ලත් වාණිජ බැංකුවලට එම චක්‍රීය ණයෙහි ප්‍රමාණයට අදාළව පමණක් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී. 1998 අගදී වූ රුපියල් දශ ලක්‍ෂ 23 හා සසඳන කල 1999 අවසන් වනවිට මෙම ණය පහසුකම යටතේ අය වීමට තිබූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 12 ක් විය.

## මධ්‍ය සහ දිගුකාලීන ණය

මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල 1999 වර්ෂය තුළ රුපියල් දශ ලක්‍ෂ 4,925 මට්ටමක නොවෙනස්ව පැවතුණි. වසර තුළ ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 145 ක් වූ අතර 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ මහජන බැංකුවට කරන ලද ණය මුදා හැරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 41 ක් විය. මේ අනුව 1999 අග වනවිට බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්වලට පෙරාතුව මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ නිකුත් කළ අයවිය යුතු මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 2,605 ක් විය.

## ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා

බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු සහ විදේශීය මුදල් තැන්පතු වගකීම්වලට එරෙහිව පැවැති සියයට 12ක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා 1999 අගෝස්තු මස 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 11 දක්වා අඩු කරන ලදී.

## ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයට අදාළ නොවන අපනයනකරුවන් සඳහා වූ විදේශ මුදල් ණය පහසුකම්

ආයෝජන ප්‍රවර්ධන කලාපයෙන් පරිබාහිර වූ අපනයනකරුවන් උදෙසා සාපේක්‍ෂ වශයෙන් අඩු පිරිවැය ණය පහසුකමක් සැපයීමේ අභිලාෂයෙන් 1997 ආරම්භ කරන ලද උක්ත ණය ක්‍රමය 1999 වසර තුළදීද අඛණ්ඩව පැවතුණි. මෙම ණය ක්‍රමය යටතේ 1999 වසර තුළ දේශීය බැංකු ඒකක හා විදේශීය මුදල් බැංකු ඒකක මගින් ප්‍රදානය කරන ලද මුළු ණයෙහි ප්‍රමාණය 1998 ප්‍රදානය කරන ලද ප්‍රමාණය වූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 177 ට සාපේක්‍ෂව එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 124 ක් විය. මෙය ඉකුත් වසරට වඩා සියයට 30 ක අඩු වීමකි. දේශීය බැංකු ඒකක මගින් දෙන ලද ණය ප්‍රමාණය 1998 පැවති එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 166 සිට 1999 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 119 දක්වා අඩු වූ අතර විදේශීය මුදල් බැංකු ඒකක මගින් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණයද 1998 පැවති එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 11.5 සිට 1999 තුළදී එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 4.75 දක්වා අඩු විය. ප්‍රදානය කරන ලද ණය සියල්ලක්ම පාහේ අවුරුද්දට වඩා අඩු පරිණත කාලයකින් යුතු විය. 1999 අග වනවිට මෙම ණය ක්‍රමය යටතේ ප්‍රදානය කර අය වීමට තිබූ ණය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 35 ක් විය. මෙම ණය සියයට 6.00 - 10.50 අතර පොලී අනුපාතිකවලට යටත්ව ප්‍රදානය කර තිබුණි. (II -4 සංඛ්‍යා සටහන).

II - 4 සංඛ්‍යා සටහන

**ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් නොවන අපනයනකරුවන්හට ප්‍රදානය කළ විදේශ මුදල් ණය-1997-1999**

(එ.ජ.ඩො.දශ ලක්‍ෂ)

| | 1997 | 1998 | 1999 |
|---|---|---|---|
| ණය දීම් (අවුරුද්දට අඩු) | | | |
| දේශීය බැංකු ඒකක | 241.6 | 163.2 | 119.2 |
| විදේශීය මුදල් බැංකු ඒකක | 8.7 | 11.4 | 4.8 |
| ණය දීම් (අවුරුද්දට වැඩි) | | | |
| දේශීය බැංකු ඒකක | 2.8 | 2.7 | 0.1 |
| විදේශීය මුදල් බැංකු ඒකක | 0.1 | ... | - |
| එකතුව | | | |
| දේශීය බැංකු ඒකක | 244.4 | 165.9 | 119.4 |
| විදේශීය මුදල් බැංකු ඒකක | 8.8 | 11.5 | 4.8 |
| මුළු එකතුව | 253.2 | 177.3 | 124.1 |
| සාමාන්‍ය පොලී අනුපාතිකය % | 6.5 | 6.2 | 6.0 |
| අය වීමට ඇති මුළු ණය | 70.7 | 44.1 | 24.6 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1999 වසර තුළ ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් නොවන ව්‍යවසායකයින් ප්‍රයෝජනයට ගත් ණය පහසුකම

1997 වසර තුළදී ප්‍රයෝජනයට ගත් ප්‍රමාණයෙන් අඩක් පමණ දක්වාම අඩු විය. මෙම තියුණු පසුබෑමට හේතු සාධක ලෙස පෙනෙන්නට තිබෙනුයේ දේශීය පොලී අනුපාතිකවල මන්දගාමීත්වයයි.

## මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණා සහගත ගෙවීම්

1964 ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධව රජය වෙනුවෙන් ගෙවන ලද මුළු සහන ගෙවීම් 1998 දී රුපියල් 148,231 හා සසඳන කල 1999 දී රුපියල් 73,750 ක් විය. 1998 රුපියල් 15,675 ක් වූ කරුණා සහගත ගෙවීම් ප්‍රමාණයට සාපේක්ෂව බලනකල 1999 දී එය රුපියල් 3,300 ක් විය.

## අපනයනකරුවන් සඳහා වූ ආනයන තීරු බදු ප්‍රතිදාන

1998 දී ගෙවන ලද රුපියල් දශ ලක්ෂ 768 හා සසඳ බලන කල රජය වෙනුවෙන් අපනයන කරුවන්ට ගෙවන ලද තීරු බදු ප්‍රතිදාන සඳහා 1999 දී මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රතිපූරණය කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 349 කි.

## ආසියානු නිෂ්කාශන සංගමය

කලින් වසරේ වූ රුපියල් දශ ලක්ෂ 44,240 හා සසඳන කල 1999 වසරේ ආසියානු නිෂ්කාශන සංගමය ඔස්සේ කරන ලද මුළු ගණුදෙනුවල රුපියල් වටිනාකම දශ ලක්ෂ 42,724 ක් විය. 1998 රුපියල් දශ ලක්ෂ 34,257 හා සසඳන කල 1999 වර්ෂය තුළ විදේශ මුදලින් පියවන ලද වටිනාකම රුපියල් දශ ලක්ෂ 36,685 ක් විය.

## අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල් භාරකාරත්වය දැරීම හා රජය වෙනුවෙන් අරමුදල් පාලනය කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. මහ බැංකුවෙහි පවත්වාගෙන යන මෙම අරමුදලෙහි ශේෂය 1999 දෙසැම්බර් මස 31 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 63 ක් විය.

## රාජ්‍ය ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුව විසින් රාජ්‍ය බැංකු, රාජ්‍ය නියෝජ්‍යත්ව ආයතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාල ගිණුම් දිගටම පවත්වාගෙන යන ලදී. 1999 දෙසැම්බර් අග වනවිට ක්‍රියාත්මකව තිබූ ගිණුම් සංඛ්‍යාව 1998 සංඛ්‍යාව වූ 159 ට සාපේක්ෂව 163 ක්ව පැවතුණි. 1999 වර්ෂය තුළ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ නියෝජ්‍යත්ව ආයතනවලට අදාළ ගිණුම් නවයක් වසා දමන ලද අතර නව රාජ්‍ය ගිණුම් දහතුනක් ආරම්භ කරන ලදී.

## විදේශීය මූල්‍ය

සමාලෝචිත වර්ෂය තුළදී මහ බැංකුව විසින් රජය වෙනුවෙන් විවිධ විදේශ ණය සහ ප්‍රදාන යටතේ මුදා හරින ලද ණය මුදල් ලබා ගැනීම් සහ විදේශීය ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් තවදුරටත් කරගෙන යන ලදී.

# ව්‍යවහාර මුදල් නිකුතුව

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලධාරියා වශයෙන් ශ්‍රී ලංකාව තුළ ගණුදෙනු කිරීම සඳහා වලංගු මුදල් නිකුත් කිරීමේ කාර්ය භාරය 1999 වර්ෂය තුළදී තවදුරටත් ඉටු කරන ලදී. 1998 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්ෂ 60,087 ක් ලෙස සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය සමග සසඳන විට 1999 වර්ෂය අවසානයට මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 70,210 ක් විය. සංසරණය වන සම්පූර්ණ ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙන් මුදල් නෝට්ටු ප්‍රතිශතය 96.3% කි.

1999 වර්ෂය තුළ විශේෂ අවස්ථා දෙකක් සැමරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමරු කාසි 3 ක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාව 1996 දී ලෝක ක්‍රිකට් කුසලානය ජය ගැනීම සහ 1999 මැයි/ජුනි මස එක්සත් රාජධානියේ පවත්වන ලද 1999 ලෝක ක්‍රිකට් කුසලාන තරගාවලිය සැමරීම සඳහා රු.1,000 විශේෂ රිදී කාසියක් සහ සාමාන්‍ය සංසරණය සඳහා රු.5 තඹ/නිකල් කාසියක් ද 1999 ඔක්තෝබර් මස යෙදුනු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වර්ණ ජයන්තිය සැමරීමට රුපියලක වටිනාකමින් යුතු නිකල් ආලේපිත වානේ ලෝහයෙන් නිම වූ විශේෂ කාසියක් ද නිකුත් කරන ලදී.

1999 සැප්තැම්බර් මස 12 වන දින ගාලු මුවදොර හෝටලයේ පැවති රාජකීය පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සහභාගි විය. විවිධ මුදල් එකතුවක් මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි. තවද, ජූලි හා ඔක්තෝබර් මාසයන්හි පැවති පාසල් ප්‍රදර්ශන දෙකක් සඳහා ද සහභාගි විය. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි භාවිතා වන මුදල් නෝට්ටු සහ කාසි ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සමරු කාසි ද මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි. මාතලේ ප්‍රදේශයේ පාසල් සිසුන්, පොලීසිය සහ මහජනතාව, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

නානක විද්‍යාව කෙරෙහි උනන්දුවක් දක්වන මහ බැංකු නිලධාරීන් තුල එම ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පුළුල් කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහ බැංකුවේ නානක

විද්‍යා සංගමය පිහිටුවන ලදී. මෙම සංගමයේ කටයුතු අතර නානක විද්‍යාව පිළිබඳ දේශන සංවිධානය කිරීමද සිදුකරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කෞතුකාගාරය නවීකරණය කිරීම සඳහා සැළසුම් සකස් කර ඇත. " History of coins and Currency in Sri Lanka " යන ශීර්ෂ නාමය යටතේ ශ්‍රී ලංකාවේ මුදල් හා කාසි ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමට ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ.

1999 නොවැම්බර් මසදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ පාලන අංශය ශ්‍රී ලංකා මහ බැංකුවේ නව මූලස්ථාන ගොඩනැගිල්ලේ ස්ථානගත කෙරිණි. මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ස්ථානගත කළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශ 1999 වර්ෂයේදී ද එම ස්ථානයේම පවත්වාගෙන යන ලදී. මුදල් හුවමාරු කවුළුව සිය කටයුතු කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ පිහිටි යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. අනුරාධපුර හා මාතර ප්‍රාදේශීය කාර්යාල මගින් අදාල ප්‍රදේශවල මහජනයා සඳහා බැංකු සහ ව්‍යවහාර මුදල් සේවාවන් තවදුරටත් පවත්වා ගෙන යනු ලැබිය.

## බැංකු සංවර්ධන

මහ බැංකුව විසින් 1999 දී වාණිජ බැංකු පිහිටුවීම සඳහා වූ ඉල්ලීම් කිපයක්ම සම්බන්ධ කටයුතු අවසන් කරන ලදී. ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද වාණිජ බැංකු දෙකකට (සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හා සීමාසහිත නැෂනල් මර්කන්ටයිල් බැංකුව) හා විදේශීය බැංකුවක ශාඛාවකට (බැන්ක් ඔෆ් නෝවා ස්කෝෂියා), ශ්‍රී ලංකාව තුළ මෙරට හා අක් වෙරළ බැංකු කටයුතු කරගෙන යාමට, බැංකු පනතේ 5 වන වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කරන ලදී. 1999 වසරේ ජූලි මස තුළදී ඕවර්සීස් ට්‍රස්ට් බැංකුවේ ශ්‍රී ලංකා ශාඛාව අත්පත් කර ගනිමින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ව්‍යාපාර කටයුතු ඇරඹූ අතර, එම වසරේ අගෝස්තු මස තුළදී බැන්ක් ඔෆ් නෝවා ස්කෝෂියා විසින් සොසයිටේ ජෙනරාලේ හි ශ්‍රී ලංකා ශාඛාවේ තෝරා ගත් වත්කම් හා වගකීම් අත්පත් කර ගැනීම තුළින් සිය ව්‍යාපාර කටයුතු අරඹන ලදී. 1999 වර්ෂය අග භාගයේදී සොසයිටි ජෙනරාලේ ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් කටයුතු අවසන් කළේය. සීමාසහිත නැෂනල් මර්කන්ටයිල් බැංකුවේ මෙහෙයුම් කටයුතු වසර 2000 මැද භාගයේදී ඇරඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව තුළ බැංකු ශාඛාවක් පිහිටුවන ලද ප්‍රථම, කැනේඩියානු බැංකුව බැන්ක් ඔෆ් නෝවා ස්කෝෂියා වේ. මේ අතර ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාර කටයුතු නතර කිරීම හේතුවෙන්, 1999 වසර තුළදී විදේශීය බැංකුවක් වන කොරියා එක්ස්චේන්ජ් බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන ලදී. සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හා බැන්ක් ඔෆ් නෝවා ස්කෝෂියා සිය ව්‍යාපාර කටයුතු ඇරඹීම සහ ඕවර්සීස් ට්‍රස්ට් බැංකුව, සොසයිටේ ජෙනරාලේ හා කොරියා එක්ස්චේන්ජ් බැංකුව ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාරික කටයුතු නිමා කිරීම සමග 1999 වසර අගදී මෙරට ක්‍රියාත්මක වූ වාණිජ බැංකු සංඛ්‍යාව 25 ක් විය.

1999 වසරේ මුල් කාර්තුව තුළ සබරගමුව, වයඹ හා ඌව සංවර්ධන බැංකුවල ව්‍යාපාර කටයුතු ඇරඹීමත් සමග, 1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ, ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ප්‍රා.සං.බැංකු) පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගන්නා ලද ක්‍රියා මාර්ගද අවසන් විය. මෙම බැංකුවලට විශේෂිත බැංකු වශයෙන් බලපත්‍ර නිකුත් කර ඇත. 1999 දෙසැම්බර් 31 දිනදී, කළුතර, රත්නපුර හා කෑගල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල (ප්‍රා.ග්‍රා.සං.බැංකු) ව්‍යාපාර කටයුතු සබරගමුව සංවර්ධන බැංකුව වෙත පවරන ලද අතර, ගම්පහ, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ව්‍යාපාර කටයුතු වයඹ සංවර්ධන බැංකුව වෙත පවරන ලදී. එමෙන්ම 1999 වසරේ මාර්තු 17 දිනදී, බදුල්ල, මොණරාගල හා අම්පාර ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ව්‍යාපාර කටයුතු ඌව සංවර්ධන බැංකුව වෙත පවරන ලදී. මෙම ප්‍රා.සං. බැංකු තුනෙහි ව්‍යාපාර කටයුතු ඇරඹීමත් සමග ප්‍රා.සං. බැංකු සංඛ්‍යාව 3 සිට 6 දක්වා වැඩි විය. මේ හේතුවෙන්, 1999 වසර අවසානය වනවිට මෙරට තුළ ක්‍රියාත්මක වූ බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව 12 දක්වා වර්ධනය විය. මෙම වෙනස්වීම් සමග, 1999 දෙසැම්බර් 31 දිනට පැවති බැංකු සංඛ්‍යාව 37 ක් විය. 1994 වසරේ සිට මෙරට පැවති බැංකු සංඛ්‍යාව එහි සංයුතිය සමගින් II-5 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

1999 වසර තුළදීද ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු හා විශේෂිත බැංකුවල ශාඛාවන් හා අනෙකුත් කාර්යාලයන් විවෘත කිරීම, වසා දැමීම හා පිහිටි ස්ථානය වෙනස් කිරීම යනාදිය සම්බන්ධව බැංකු පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය නොකඩවා කරගෙන යන ලදී. වාණිජ බැංකුවල ශාඛා 29 ක්, සිසු ඉතුරුම් ඒකක 57 ක් හා විදේශයක පිහිටුවන ලද නියෝජිත කාර්යාලයක්ද, විශේෂිත බැංකුවල ශාඛා 6 ක්ද විවෘත කිරීමට සහ වාණිජ බැංකුවල ව්‍යාප්ති කාර්යාල 5 ක් වසා දැමීමට මෙම වසර තුළදී අනුමැතිය ලබා දෙන ලදී. එසේම වාණිජ බැංකු ශාඛා 45 ක හා විශේෂිත බැංකු ශාඛා 23 ක පිහිටි ස්ථානයන් වෙනස් කිරීම සඳහාද අනුමැතිය දෙන ලදී.

පාලිත සමාගම්වල ආයෝජනය කිරීම සහ සංගමික සංස්ථා පත්‍ර හා සාංගමික ව්‍යවස්ථාවල වෙනස් කිරීම් සිදු කිරීම සම්බන්ධයෙන් වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් කීපයක් පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

1999 වසරේදී ප්‍රා.සං. බැංකු පිහිටුවා අවසන් කිරීමත් සමග දෙපාර්තමේන්තුව වෙත පැවරුනු ප්‍රා.සං. බැංකු කටයුතු

**II - 5 සංඛ්‍යා සටහන**
**බැංකු ආයතන සංයුතිය 1994-1999**

| වර්ගීකරණය | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1999 |
|---|---|---|---|---|---|---|
| ආයතන සංඛ්‍යාව | 44 | 47 | 48 | 49 | 44 | 37 |
| වාණිජ බැංකු | 23 | 26 | 27 | 26 | 26 | 25 |
| දේශීය වාණිජ බැංකු | 6 | 8 | 8 | 8 | 8 | 9 |
| විදේශීය බැංකු | 17 | 18 | 19 | 18 | 18 | 16 |
| ප්‍රා.ග්‍රා.සං.බැ.(අ) | 17 | 17 | 17 | 17 | 9 | - |
| විශේෂිත බැංකු (ආ) | 4 | 4 | 4 | 6 | 9 | 12 |
| ඉතිරිකිරීමේ බැංකු | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| සංවර්ධන බැංකු | 3 | 3 | 3 | 5 | 5 | 5 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ඇ) | - | - | - | - | 3 | 6 |

(අ) 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන .බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

(ආ) බැංකු (සංශෝධිත) පනත යටතේ විශේෂිත බැංකු ලෙස බලපත්‍රයක් අවශ්‍ය බැංකු

(ඇ) 1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකු

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයවීමේ නව කාර්ය භාරය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. තවද, ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ව්‍යාපාර කටයුතු ප්‍රා.සං. බැංකු වෙත පැවරුනු අවස්ථාවේ ප්‍රා.ග්‍රා.සං. බැංකුවල පැවති ශුද්ධ වටිනාකම නිසැකවම ගණන් බැලීම සඳහා ප්‍රා.සං. බැංකු පනතේ 47 වන වගන්තියට අනුකූලව විගණකවරුන් පත් කිරීමද සිදු කරන ලදී. මෙයට අමතරව, ප්‍රා.සං. බැංකුවල ආයතනික සැලැස්ම හා වාර්ෂික අයවැය සකස් කිරීම සඳහා උපකාරී වීම සහ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ප්‍රා.සං. බැංකුවල අරමුදල් කළමනාකරුවන් සඳහා භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමද සිදු කරන ලදී.

මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල තුනෙහි කටයුතු සම්බන්ධීකරණය කිරීමේ හා ඒවායේ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ කාර්යයද බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යන ලදී.

## ප්‍රාදේශීය කාර්යාල

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන්ට ඇතුළත් වූයේ, මහජනතාව සඳහා මුදල් හුවමාරු පහසුකම් ලබා දීම හා ප්‍රදේශය තුළ පිහිටි වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් ලබා දීම (මාතර හා අනුරාධපුර පමණක්), සමාජ ආර්ථික දත්ත රැස් කිරීම, ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා පාසැල් සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ පැවැත්වීම, සමීක්ෂණ හා පර්යේෂණ කටයුතුවල යෙදීම, ග්‍රාමීය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී සහාය වීම, රජයේ දෙපාර්තමේන්තු, ආයතන, වාණිජ බැංකු හා අනෙකුත් සංවිධාන සමග ඒ ඒ ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ මහ බැංකු ප්‍රකාශණ අලෙවිය වැනි කටයුතු වේ.

### මාතර

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය, සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය සහ " අරුණළු " ගම් නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීමට අදාළ කටයුතු මෙහෙයවීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් දායක විය. වර්ෂයේ මුල් භාගය තුළදී කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කර තිබූ ණය මුදල් අය කර ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාලයේ ක්‍රියාකාරී සහාය ලබා දෙන ලදී. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ විශාල ප්‍රමාණයේ ණය මුදල් නිර්දේශ කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරන ලද අතර, ඒ අනුව රුපියල් දශ ලක්ෂ 21 ක වටිනාකමක් සහිත ණය මුදල් තෝරා ගත් ණය අයදුම්කරුවන් 87 දෙනෙකු වෙනුවෙන් නිර්දේශ කොට ඇත.

ඉදිරි වෙළෙඳ ගිවිසුම් එනම්, කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදකයින් තම නිෂ්පාදන නිශ්චය කර ගත් මිලකට ඉදිරි කාලයේදී ගැණුම්කරුවන් වෙත සැපයීම සඳහා වන ගිවිසුම් පිළියෙල කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් ආරම්භක පියවර ගෙන ඇත. ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රදේශයේ පළතුරු නිෂ්පාදන පිළිබඳ තොරතුරු එක් රැස් කොට ඇති අතර, අළුත් පළතුරු සඳහා අලෙවි

මධ්‍යස්ථානයක් පිහිටුවීමේ යෝජිත සැළැස්ම පිළිබඳව ප්‍රාදේශීය කාර්යාලය විසින් වැඩමුළු පවත්වන ලදී.

රජයේ ණය සුරැකුම්පත් වෙළඳපොළ ව්‍යාප්ත කිරීමේ අරමුණ මුල් කර ගනිමින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මූල්‍ය ආයතනවල නිලධාරීන් හා අපේක්ෂිත ආයෝජකයන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ප්‍රදේශයේ පාසැල් සිසුන් 2,200 ක් පමණ දෙනා සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ පවත්වන ලද අතර, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල වාණිජ බැංකු, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා අනෙකුත් සහභාගී වන ආයතනවල නිලධාරීන් සඳහා වැඩමුළු පවත්වන ලදී.

මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහනට ප්‍රාදේශීය කාර්යාලය දයක වූ අතර, ප්‍රාදේශීය පාරිභෝගික මිල දර්ශකය හා දිස්ත්‍රික්ක අනුව පිළියෙල කරන සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ මූලික දත්ත එක් රැස් කිරීමෙහිද නියුක්ත විය. ප්‍රාදේශීය කාර්යාලයේ ව්‍යවහාර මුදල් අංශය විසින් මහජනතාව සඳහා මුදල් හුවමාරු පහසුකම් මෙන්ම ප්‍රදේශය තුළ පිහිටි වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් තවදුරටත් ලබා දෙන ලදී. මෙම වර්ෂය තුළදී මාතර ප්‍රාදේශීය නිෂ්කාශන මධ්‍යස්ථානය විසින් රුපියල් දශ ලක්ෂ 4,095 ක් වටිනා චෙක්පත් 206,273 ක් නිෂ්කාශනය කර ඇත.

## අනුරාධපුර

උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය හා උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු මෙහෙයවීමට 1999 වසර තුළදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් කටයුතු කරගෙන යනු ලැබීය. උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුදගලයන් 56 දෙනෙකු සඳහා රුපියල් දශ ලක්ෂ 1.9 ක ණය ප්‍රදානය කළ අතර, උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුද්ගලයන් 25 දෙනෙකු සඳහා රුපියල් දශ ලක්ෂ 0.7 ක මුදලක් ප්‍රදානය කරන ලදී.

රජයේ දෙපාර්තමේන්තු හා ආයතන කීපයක සහාය ඇතිව ප්‍රාදේශීය කාර්යාලය විසින් වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් 51 ක් පවත්වන ලදී. ස්වයං රැකියා, ව්‍යවසායකත්ව සංවර්ධනය, නව වගා ක්‍රම සංවර්ධනය, පරිසරය පිළිබඳව දැනුවත් කිරීම, ඉතුරුම් ඒකරාශී කිරීම සහ අලෙවිකරණය මෙම වැඩසටහන්වලට අදල ක්ෂේත්‍රයන් විය. ණය සුරැකුම්පත් පිළිබඳව හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්ද ප්‍රාදේශීය කාර්යාලය මගින් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා මුළු සහභාගී වූවන් ගණන 2,443 ක් විය. එයට අමතරව, අනුරාධපුර, පොළොන්නරුව හා කුරුණෑගල දිස්ත්‍රික්කවල අ.පො.ස. උසස් පෙළ සිසුන් 890 ක් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ තුනක් පවත්වන ලදී. ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ ආරම්භක පියවරක් වශයෙන් ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක වන ආකාරය හා ඒවායේ ප්‍රතිලාභ පිළිබඳව ගොවි සමාගම්වල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිපයක් ප්‍රාදේශීය කාර්යාලය මගින් පවත්වන ලදී. ප්‍රදේශයේ ඉදිරි වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල පිහිටුවන ලද එවැනි ගොවි සමාගම් 13 ක් සමග සාකච්ඡා පවත්වන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ශේෂය පිළිබඳව අදළ සාමාජිකයින්ට ප්‍රකාශන නිකුත් කිරීමේ වැඩපිළිවෙලක් වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලය විසින් ආරම්භ කරන ලදී. මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහනටද අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය සහභාගී විය. මහජනතාව සඳහා මුදල් හුවමාරු පහසුකම් හා වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් ප්‍රාදේශීය කාර්යාලය මගින් තවදුරටත් සළසනු ලැබුණි. අනුරාධපුර ප්‍රාදේශීය කාර්‍යාලයෙහි ස්ථාපිත ප්‍රාදේශීය නිෂ්කාශන මධ්‍යස්ථානය විසින් රුපියල් දශ ලක්ෂ 2,498ක වටිනාකමක් සහිත චෙක්පත් 236,864 ක් වර්ෂය තුළදී නිෂ්කාශනය කර ඇත.

## මාතලේ

1999 වර්ෂය තුළදී මාතලේ ප්‍රාදේශීය කාර්යාලය එයට පැවරුණ සම්ප්‍රදයික මහ බැංකු කටයුතුවලට අමතරව සංවර්ධන වැඩසටහන් කීපයක් පවත්වාගෙන යනු ලැබීය. කුඩා පරිමාණ ව්‍යාපෘතීන් හඳුනා ගැනීමේ වැඩ කටයුතුවල ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් නිරත විය. ශක්‍යතාවන් සහිත එවැනි ව්‍යාපෘති 16 ක් හඳුනා ගත් අතර, ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 1 ක මූල්‍ය පහසුකම් නිර්දේශ කරනු ලැබීය. වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ සහාය ඇතිව ප්‍රාදේශීය කාර්යාලය විසින් දුල්ලැව ගම නගා සිටුවීම සඳහා තෝරාගෙන ඇති අතර, පස සේදී යාම වැළැක්වීම සඳහා වන වැඩපිළිවෙලකටද සහාය දෙනු ලැබීය.

සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන්, වැඩමුළු හා ප්‍රදර්ශන කීපයක් පවත්වන ලද අතර, ඒ සඳහා පුද්ගලයින් 1,533 ක් සහභාගී විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල කළමනාකරුවන් සඳහා ණය මුද හැරීම සහ ණය ආපසු අය කර ගැනීමේ වැඩපිළිවෙල සම්බන්ධ පුහුණු වැඩසටහන, " කඳුරට පාරිභෝගික මිල දර්ශකය" සඳහා දත්ත සමීක්ෂකයින් පුහුණු කිරීමේ වැඩසටහන සහ කිරිපට්ටි සංවර්ධනය හා කෘෂිකාර්මික කටයුතුවලදී හයිඩ්‍රොපොනික් තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන මෙම වැඩසටහන් අතර වැදගත් වේ. තවද, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව භාණ්ඩාගාර බැඳුම්කර ජනප්‍රිය කිරීම සඳහා ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් වෙනුවෙන් විශේෂ සම්මන්ත්‍රණයක් මහනුවරදී පවත්වන ලදී. මහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීමේ ජංගම වැඩපිළිවෙල ප්‍රාදේශීය කාර්යාලය විසින් තවදුරටත් පවත්වාගෙන ගිය අතර, පාසැල් 45 ට මෙන්ම විශ්ව විද්‍යාලවලටද මෙම ජංගම සේවා

පහසුකම් සැළසිණි.

ගම්මිරිස්, කෙසෙල් හා පොල් වගාවට අවශ්‍ය බීජ පැල වර්ග තෝරා ගත් ගොවි කණ්ඩායම් අතර බෙදා දෙන ලදී. ප්‍රදේශයේ ඉදිරි වෙළඳ ගිවිසුම් හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ කටයුතුවලද ප්‍රාදේශීය කාර්යාලය නියුක්ත විය. ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ බිත්තර වී සැපයීම සඳහා සීමාසහිත කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කොළඹ) සමාගම සමග ගිවිසුම් අත්සන් කිරීමට මහනුවර දිස්ත්‍රික්කයේ මොරයාය ප්‍රදේශයේ ගොවීන් 95 දෙනෙකු තෝරා ගන්නා ලදී. තවද, දඹුල්ල ගොවි සමාගම, ගොවි සංවිධාන හා දඹුල්ල නගරයේ එළවළු සැපයුම්කරුවන් මගින් උතුරු සහ නැගෙනහිර පළාත් වලට එළවළු සැපයීම සම්බන්ධව සාකච්ඡා පවත්වන ලදී. වර්ෂය තුළදී මහජන බැංකුව හා කඳුරට සංවර්ධන බැංකුව මගින් නාලන්ද කිරි නිෂ්පාදන ගම්මානයේ ගොවීන්ට මූල්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරන ලදී.

මහනුවර, නුවරඑළිය, කෑගල්ල හා මාතලේ යන දිස්ත්‍රික්කයන්හි සමාජ ආර්ථික දත්ත රැස් කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කටයුතු හා දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහන සඳහා මිල ගණන් රැස් කිරීමේ කටයුතුවල ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් නිරත විය. දඹුල්ල, මාතලේ, මහනුවර, ගම්පොළ, නුවරඑළිය හා හැටන් යන දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථාන හයකින් ලබා ගත් දත්ත අනුව ප්‍රාදේශීය කාර්යාල විසින් 1999 වර්ෂය සඳහා " කඳුරට පාරිභෝගික මිල දර්ශකය" සකස් කරන ලදී.

තවද, ප්‍රාදේශීය කාර්යාලය චෙක්පත් නිෂ්කාශනය කිරීමේ සේවාවේ තවදුරටත් නිරත විය. මාතලේ ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන මධ්‍යස්ථානය රුපියල් දශ ලක්ෂ 2,106 ක් වටිනා චෙක්පත් 121,497 ක් නිෂ්කාශනය කළ අතර, මහනුවර ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන මධ්‍යස්ථානය රුපියල් දශ ලක්ෂ 23,684 ක් වටිනා චෙක්පත් 796,013 ක් වර්ෂය තුළදී නිෂ්කාශනය කරනු ලැබීය.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකු

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල (ප්‍රා.සං.බැංකු) මූලික පරමාර්ථවලට අනුව ජනගහණයේ දිළිඳුම කොටස් නංවාලීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් 1999 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකු සිය බල ප්‍රදේශයන්හි එළදයී ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් සපයන ලදී. තම ආයතනික සැලසුම්වල සඳහන් කර ඇති ඉලක්කයන් ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව එක් එක් ප්‍රාදේශීය සංවර්ධන බැංකු විසින් ණය යෝජනා ක්‍රම සහ තැන්පතු සංචලන යෝජනා ක්‍රම කීපයක්ම හඳුන්වා දෙන ලදී.

අදළ ප්‍රදේශවල දිළිඳුම ජන කොටස්වල ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණ ඇතිව රුහුණ, රජරට, වයඹ සහ සබරගමුව යන සංවර්ධන බැංකු විසින් නිවාස ණය යෝජනා ක්‍රම කීපයක් හඳුන්වා දී ඇති අතර, වී මිලදී ගැනීම සහ ගබඩා කිරීම සඳහා මධ්‍යපන ණය යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දෙන ලදී. ප්‍රා.සං.බැංකු කීපයක් විසින්ම රැකියා විරහිත තරුණයන්ට සහ කාන්තාවන්ට මූල්‍ය පහසුකම් සැලසීම සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත. යොවුන් ප්‍රතිභා (රුහුණ) රංපත්, කප්රුක, ඉසුරුමග (සබරගමුව) සහ ශ්‍රමාභිමානී (වයඹ) යන ණය යෝජනා ක්‍රම එම ස්වයං රැකියා ණය ක්‍රම අතර වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වයෙන් ආරම්භ කර ඇති 'අරුණළු' යෝජනා ක්‍රමය යටතේ ගම් නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද මෙම බැංකු විසින් විශේෂ උනන්දුවක් දක්වා ඇත. සෑම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක්ම මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා ඒ ඒ පළාත් වලින් ගම් කීපයක් 1999 වර්ෂය තුළදී හඳුනාගෙන තිබුණි.

තරුණයන්, පාසැල් සිසුන්, කාන්තාවන් සහ ආයතන සේවක සේවිකාවන් ඉලක්ක කරගෙන තැන්පතු යෝජනා ක්‍රම කීපයක්ද ප්‍රා.සං.බැංකු විසින් හඳුන්වා දෙන ලදී. රුහුණු වනිතා, රුහුණු කැකුළු (රුහුණ) මහවැලි පදිංචිකරුවන් සඳහා වන ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය, පාරමිතා (රජරට) ළමා දිරිය, තුරුණු දිරිය සහ සංවර්ධන දිරිය (සබරගමුව) සහ පියවර (ඌව) එම යෝජනා ක්‍රම වලින් සමහරකි.

1998 සහ 1999 වර්ෂවල ප්‍රා.සං.බැංකුවල ක්‍රියාකාරීත්වය පිළිබඳ දත්තයන් පහත සඳහන් සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. 1999 වර්ෂය තුළ ප්‍රා.සං.බැංකුවල සතුටුදයක මූල්‍ය ක්‍රියාකාරීත්වය, රුපියල් දශ ලක්ෂ 297 ක් වූ එම බැංකුවල මුළු ලාභය තුළින් පෙන්නුම් කරයි. මෙම සාර්ථකත්වයට බලපෑ ප්‍රධාන කරුණ ලෙස සැළකිය හැක්කේ 1999 වර්ෂය තුළ ප්‍රා.සං.බැංකු විසින් දියත් කරන ලද කඩිනම් හා සාර්ථක ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාවලිය තුළින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලින් එම බැංකුවලට පැවරුණ කල් පසු වූ ණය මුදල් අය කර ගැනීමට හැකි වීමයි.

1999 දී ප්‍රා.සං.බැංකු විසින් සංචලනය කර තිබූ මුළු තැන්පතු මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,412 ක් විය. 1998 වර්ෂය අවසානයේ තිබූ ණය හා අත්තිකාරම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 3,772 හා සැසඳීමේදී 1999 වර්ෂය අවසාන වනවිට බැංකුවල මුළු ණය හා අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,474 ක් විය. පසුගිය වර්ෂය තුළදී මුදා හරින ලද ණය හා අත්තිකාරම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 2,247 හා සසඳනවිට, සියයට 61ක සීඝ්‍ර වැඩි වීමක් සනිටුහන් කරමින් 1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 3,613 ක් ණය හා අත්තිකාරම් වශයෙන් ප්‍රදානය කර තිබුණි. මෙම ණය මුදල ණයකරුවන් 500,000 කට අධික සංඛ්‍යාවක් වෙත මුදා හැර තිබූ අතර, එක් ණය මුදලක සාමාන්‍යය වටිනාකම රුපියල් 6,950 ක් පමණ විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල පරමාර්ථයන්ට අනුව යමින්, අදාල ප්‍රදේශවල සිටින ණය මුදල් අවශ්‍යම ගණුදෙනුකරුවන් සඳහා කුඩා ණය මුදල් විශාල ප්‍රමාණයක් මුදා හැර ඇති බව මෙයින් පෙන්නුම් කරයි.

II - 6 සංඛ්‍යා සටහන
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල ක්‍රියාකාරිත්වය**

(රුපියල් දශලක්ෂ)

| | 1998 (අ) | 1999 |
|---|---|---|
| වර්ෂය අවසානයට | | |
| මුළු තැන්පතු | 3,077 | 3,412 |
| ණය හා අත්තිකාරම් | 3,772 | 4,474 |
| වර්ෂය තුළදී | | |
| මුදහළ ණය හා අත්තිකාරම් | 2,247 | 3,613 |
| ලාභය (පාඩුව) | 43 | 297 |

මූලය : බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) ප්‍රාදේශීය සංවර්ධන බැංකු වෙත ව්‍යාපාරික කටයුතු පවරා ගන්නා ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ක්‍රියාකාරිත්වය ද 1998 දත්තවල ඇතුළත්ව ඇත.

## බැංකු අධීක්ෂණ

බැංකු ආයතනයන් සම්බන්ධ මෙහෙයවුම් හා අධීක්ෂණ කාර්යයන් සිදු කරනුයේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගිනි. සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුද ඇතුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) කාලීන වශයෙන් එතැන් පරීක්ෂාවකට හා නොකඩවා දුරස්ථ පරීක්ෂාවකට ලක් කිරීම මගින් මෙම දෙපාර්තමේන්තුව විසින් තම කාර්යයන් හා වගකීම් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා බැංකු ක්‍රමයේ ස්ථායීතාවය හා යහපත් භාවය සහතික කිරීම තුළින් තැන්පතු කරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කර දීම මෙම අධීක්ෂණයේ මූලික පරමාර්ථය වේ.

විමසුමට ලක් වන වසර තුළදී කටයුතු ආරම්භ කළ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ නෝවා ස්කෝෂියා බැංකුව යන නව බැංකු දෙකද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට ගැණුනු අතර, කොරියා එක්ස්චේන්ජ් බැංකුව, ඕවර්සීස් ට්‍රස්ට් බැංකුව හා සොසයිටේ ජෙනරාල් යන බැංකු තුන ශ්‍රී ලංකාවේ සිය කටයුතු අවසන් කිරීම අධීක්ෂණය කිරීමද එමගින් සිදු කෙරුණි. 1999 ජූනි මස 30 දිනදී කටයුතු අවසන් කළ ඕවර්සීස් ට්‍රස්ට් බැංකුවේ ගනුදෙණු පවරා ගනිමින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව 1999 ජූලි මස 01 වෙනි දිනදී කටයුතු ආරම්භ කළ අතර සොසයිටේ ජෙනරාල් බැංකුවේ ගනුදෙණු වලින් වැඩි කොටසක් අත්පත් කර ගනිමින් නෝවා ස්කෝෂියා බැංකුව 1999 අගෝස්තු මස 09 වෙනි දිනදී කටයුතු ආරම්භ කළේය. කොරියා එක්ස්චේන්ජ් බැංකුව හා සොසයිටේ ජෙනරාල් බැංකුව පිළිවෙලින් 1999 පෙබරවාරි 24 හා 1999 දෙසැම්බර් 31 යන දිනයන්හිදී සිය කටයුතු නිල වශයෙන් අවසන් කරන ලදී.

1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන යටතේ වයඹ සංවර්ධන බැංකුව, සබරගමුව සංවර්ධන බැංකුව හා ඌව සංවර්ධන බැංකුව යන සංවර්ධන බැංකු තුන පිහිටුවීමත් සමග, බැංකු පනතේ IX 'අ' කොටසේ විධිවිධානයන්ට අනුව මහ බැංකුවේ මෙහෙයුම් අධිකාරිය යටතට ගැනෙන බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව 12 දක්වා වැඩි විය. වයඹ සංවර්ධන බැංකුවද, සබරගමුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවද බලපත්‍රලාභී විශේෂිත බැංකු වශයෙන් 1999 ජනවාරි මස 01 වෙනි දිනදී කටයුතු ඇරඹූ අතර ඌව සංවර්ධන බැංකුව, 1999 මාර්තු 18 දින කටයුතු ඇරඹීය.

## එතැන් පරීක්ෂාව

වසර දෙකක පරීක්ෂණ කාලසීමාවක් තුළදී සෑම බැංකුවක්ම එහි ස්ථානයන් තුළදීම පරීක්ෂණයට ලක් කිරීම දැනට අනිවාර්යයෙන්ම සිදු විය යුත්තකි. එතැන් පරීක්ෂාවල ස්වභාවය හා ඒවායේ පරාසය වෙනස් වන නමුදු, එමගින් මූලික වශයෙන් අවධාරණය කරනුයේ බැංකුවේ වත්කම්වල ගුණාත්මක භාවය අගැයීම හා එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ සමස්ථ තක්සේරුවකට එළඹීමය. මෙයට අමතරව, ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, ඉපැයීම්, ද්‍රවශීලතාවය, කළමනාකරණ ශක්තිය, අභ්‍යන්තරික පාලන ක්‍රම හා රීති සහ ක්‍රියා පිළිවෙත් වැනි මූලික අංශයන්ද මෙහිලා පරීක්ෂණයට ලක් කෙරේ. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට හා අදල නීති රෙගුලාසිවලට කොතෙක්දුරට අනුකූලව බැංකුව කටයුතු කරන්නේද යන්න සැළකිලිමත් ලෙස පරීක්ෂා කිරීමද එතැන් පරීක්ෂණ විෂයෙහිලා ගැනෙන තවත් වැදගත් අංශයකි. එතැන් පරීක්ෂණයේ ස්වභාවය හා එහි පරාසය අනුව බැංකු පරීක්ෂකයන් අදල බැංකුවේ ප්‍රධාන කාර්යාලය හා තෝරා ගත් ශාඛාවන් වෙත ගොස් ඉහත සඳහන් විවිධ අංශ අවධාරණය කරමින් පරීක්ෂණවල නිරත වේ. පරීක්ෂකයින් විසින් විසිත්ත නොකළ ශාඛාවන් සම්බන්ධයෙන් අවශ්‍ය වන තොරතුරු අදල බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන් සෘජුවම ලබා ගැනේ.

අගැයීමේ පදනමක් වශයෙන් දෙපාර්තමේන්තුව දැනට යොද ගනු ලබන්නේ පිළිගත් " කැමල් " (CAMEL) විග්‍රහයයි. එනම්, ප්‍රාග්ධනය, වත්කම්වල ගුණාත්මක බව, කළමනාකාරිත්වය, ඉපැයීම් හා ද්‍රවශීලතාවය පිළිබඳ අගැයීමයි. ජාත්‍යන්තරව පිළිගත් බැංකු අධීක්ෂණ ක්‍රියා පිළිවෙතට අනුකූලව අවදනම් පදනම් කර ගත් අධීක්ෂණ ක්‍රියාවලියක් සකස් කර ගැනීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 1999 දී කටයුතු කරන ලදී. ස්වීඩන් රජයේ (SIDA ව්‍යාපෘතිය) ආධාර ඇතිව දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන කාර්මික සහයෝගිතා ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ මෙය සිදු කෙරුණි. අවධානම පදනම් කර ගත් අධීක්ෂණය මගින් ණය අවදනම, මෙහෙයවුම් අවදානම, ද්‍රවශීලතා අවදනම, හා වෙළඳපළ අවදනම වැනි බැංකු කටයුතුවලට අදල විවිධ අවදනම් කෙරෙහි අවධානය යොමු කෙරේ.

විමසුමට ලක් වන වසර තුළදී, දෙපාර්තමේන්තුව

විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු 11 ක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 ක් සම්බන්ධව එතැන් පරීක්ෂණ 13 ක් ආරම්භ කරන ලද අතර, ඉන් 4 ක් වසර තුළදීම නිම කරන ලදී. මීට අමතරව, පසුගිය වසරවලදී ආරම්භ කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු 8 ක හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවක එතැන් පරීක්ෂණයන්ද මෙම වසරේදී නිම කෙරුණි.

## දුරස්ථ පරීක්ෂණ ක්‍රමය

දුරස්ථ පරීක්ෂණ ක්‍රමය යනු බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකු විසින් මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන කාලීන වාර්තා පදනම් කරගනිමින් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කෙරෙන අධීක්ෂණ ක්‍රියාවලියකි. මෙම වසර තුළදී, දුරස්ථ පරීක්ෂණ ක්‍රමය තුළින් සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඇතුළු සියළු විශේෂිත බැංකුවල මූල්‍ය තත්ත්වය දෙපාර්තමේන්තුවේ විමසුමට ලක් කෙරුණි. බලපත්‍රලාභී බැංකු විසින් ඉදිරිපත් කෙරෙන ප්‍රධාන වාර්තා නම්, වත්කම් හා වගකීම් සහ ද්‍රවශීල වත්කම් පිළිබඳ මාසික ප්‍රකාශන; ප්‍රාග්ධන අවශ්‍යතාවයන්, ආදායම් හා වියදම්, අක්‍රිය ණය ඇතුළුව අත්තිකාරම්වල පෙළ ගැස්ම, කොටස් ප්‍රාග්ධන ආයෝජන හා බැංකුවේ කොටස් අයිතිය පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශන සහ විගණනය කරන ලද බැංකුවේ වාර්ෂික මූල්‍ය ගිණුම්ය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද නිවැරදි තොරතුරු ඇතුළත් එම වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම වැඩි දියුණු කිරීමේ අදහස ඇතිව, කාලීන වාර්තා ඉදිරිපත් කිරීම හා ඊට අදළව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවත් සමග කටයුතු කිරීම පිළිබඳ වගකිවයුතු විශේෂ නිලධාරියෙක් පත් කරන ලෙස දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී සෑම බැංකුවකින්ම ඉල්ලා සිටින ලදී. ඒ සමගම, දෙපාර්තමේන්තුව විසින් එකිනෙක බලපත්‍රලාභී බැංකු දුරස්ථ ලෙස පරීක්ෂණය කිරීම, එක් එක් පරීක්ෂකවරයෙකු යටතට පත් කරන ලදී. 1999 සැප්තැම්බර් මාසයේදී ඉහතින් සඳහන් කල විශේෂ බැංකු නිලධාරීන්ට ඔවුන්ගේ වගකීම් හා ඔවුන්ගෙන් ඉටු විය යුතු කාර්ය භාරය පැහැදිලි කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඉහත ආකාරයට ලබා ගන්නා වාර්තාවල ඇතුළත් වන තොරතුරු "කැමල්" සංයුතිය උපයෝගී කර ගනිමින් සමානුරූපී බැංකු කණ්ඩායම් හා බැංකු ක්ෂේත්‍රයට අදළව, එකිනෙක බැංකුවෙහි ප්‍රාග්ධන ශක්තිය, වත්කම්වල ගුණාත්මක භාවය, කළමනාකරණ ගුණාංග, ලාභදයිකත්වය හා මූල්‍ය ශක්තිය සහ ද්‍රවශීලතාවය නිශ්චය කර ගැනීම සඳහා ත්‍රෛමාසික පදනමක් මත විග්‍රහ කරනු ලැබේ. බැංකුවකට අහිතකර ලෙස බලපෑ හැකි සැළකිය යුතු වෙනස්වීම් හා දුර්වලතාවයන්හි පෙර නිමිති හඳුනා ගැනීමට එම වාර්තාවන් විග්‍රහ කිරීම ප්‍රයෝජනවත් වන අතර, එකී විග්‍රහයන් පදනම් කර ගනිමින් ඊට අවශ්‍ය ක්ෂණික පිළියම් යෙදීමටද පිළිවන. මෙම විග්‍රහයන්ට අනතුරුව, අවශ්‍ය යයි සැලකේ නම්, ලිඛිතව හෝ සම්මුඛ සාකච්ඡා මගින් අදහස් හුවමාරු කර ගනිමින් අදල බැංකුවෙහි කළමනාකාරිත්වය විසින් ගත යුතු විසඳුම් ක්‍රියා මාර්ග යෝජනා කෙරේ.

බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි (FCBU) වත්කම් හා වගකීම්, ආදයම් හා වියදම් සහ වත්කම් හා වගකීම්වල කල් පිරීමේ රටාව පිළිබඳ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන කාලීන වාර්තා පදනම් කර ගනිමින් එම ඒකකවල කටයුතු දුරස්ථව අධීක්ෂණය කිරීමෙහිද දෙපාර්තමේන්තුව නිරත විය.

දනට ක්‍රියාත්මක වෙමින් පවත්නා "සීඩා" (SIDA) ව්‍යාපෘතිය යටතේ, එකිනෙක "කැමල්" සංයුතින්හි හඳුනාගත් අවදනම් සහිත තත්ත්වයන් වත්මන් "කැමල්" වර්ගීකරණ රීතියට සම්බන්ධ කර ගනිමින් දුරස්ථ අධීක්ෂණ පිළිවෙත වැඩි දියුණු කිරීමට කටයුතු කෙරෙමින් පවතී. බලපත්‍රලාභී වාණිජ බැංකු 26 හිම විද්‍යුත් වාර්තා කිරීමේ පද්ධති සවි කිරීම සහ ආයතන තුළින්ම වාර්තා ජනනය කිරීමේ ක්‍රමයක් සකස් කිරීමත් සමග, එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ (USAID) තාක්ෂණික සහයෝගිතා වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරන ලද පරිගණක තැටි ඉදිරිපත් කිරීම මගින් දුරස්ථ පරීක්ෂා ක්‍රමය වැඩි දියුණු කිරීම සමාප්ත කර ඇත. මෙම වාර්තා කිරීමේ ක්‍රමය ප්‍රාදේශිය සංවර්ධන බැංකු ඇතුළු බලපත්‍රලාභී විශේෂිත බැංකුවලටද ව්‍යාප්ත කිරීමට යෝජනා කර ඇත.

## මෙහෙයුම් අවශ්‍යතාවයන්

විමසුමට ලක් වන වසර තුළදී, බැංකු පනතේ විධිවිධානයන් යටතේ මෙහෙයුම් අවශ්‍යතාවයන් සපුරාලීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කරන ලදී. මෙම අවශ්‍යතාවයන්ට ඇතුළත් වන කරුණු නම්: (1) අවදනම් අනුව බර තබන ලද වත්කම්වලට අනුව තිබිය යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයන් පවත්වා ගැනීම, (2) අවම ද්‍රවශීල වත්කම් අනුපාතයන් පවත්වා ගැනීම, (3) එක් පුද්ගලයෙකුට දිය හැකි උපරිම ණය සීමාව නොඉක්මවීම, (4) බැංකුවේ කොටස් ප්‍රාග්ධන අයිතිය පිළිබඳ සීමාවන්, (5) බැංකුව විසින් පොදු හ පෞද්ගලික සමාගම්වල කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කිරීම පිළිබඳ සීමාවන්, (6) අක්‍රිය අත්තිකාරම් වර්ගීකරණය, එවැනි අත්තිකාරම්වල පොලිය තාවකාලිකව අත්හිටුවීම සහ බොල් හා අඩමාණ ණය සඳහා ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම, (7) අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥතීන්ට හා ඔවුන්ට සම්බන්ධතාවයක් ඇති පාර්ශවයන්ට ණය පහසුකම් සැලසීමේ සීමාවන් (8) ව්‍යවස්ථාපිත කාලපරිච්ඡේදයක් ඇතුළත නියමිත ආකෘතියක් අනුව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම සහ (9) ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ හා අත්පත් කර ගැනීමේ සීමාවන් වේ.

## හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්

යහපත් ගිණුම් කරණ පිළිවෙත් සහ පාරදෘෂ්‍ය භාවයෙන් යුත් මූල්‍ය තොරතුරු, යහපත් මූල්‍ය ක්‍රමයකට ප්‍රබල ආධාරකයක් වන බව බැංකු අධීක්ෂණය පිළිබඳ "බාල්" කමිටුව විසින් හඳුන්වා දෙන ලද ඵලදයී බැංකු අධීක්ෂණයක මූලික සිද්ධාන්ත මගින් පිළි ගැනේ. මෙම මූලික සිද්ධාන්තයන්ට අනුගත වෙමින් වෙළඳපොළ ශික්ෂණය දියුණු කෙරෙන හෙළිදරව් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

ඒ අනුව පහත සඳහන් ද 1999 වසරේදී හඳුන්වා දෙන ලදී.

(අ) සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය විගණනය නොකළ අර්ධ වාර්ෂික ගිණුම් හා විගණිත වාර්ෂික ගිණුම් පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීම සඳහා ආකෘතියක්; බැංකු විසින් 1998 දෙසැම්බර් 31 දිනෙන් හෝ ඊට පසුව අවසන් වන මුදල් වර්ෂයන්ට අදල විගණිත වාර්ෂික ගිණුම් පුවත් පත් වල ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ.

(ආ) 1998 දී බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා හඳුන්වා දෙන ලද සංශෝධිත ගිණුම්කරණ ආකෘතිය අනුගමනය කරමින් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ද ඇතුළත් කරමින්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික විගණිත ගිණුම් ප්‍රකාශයට පත් කිරීම සඳහා නියමිත ගිණුම්කරණ ආකෘතියක් ;

එකී ආකෘතියට අනුව බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පහත සඳහන් කරුණු හෙළි කළයුතු වේ.

(i) ශේෂ පත්‍ර දිනයේ සිට ගිවිස ගත් කල් පිරීමේ දින තෙක් ඉතිරිව පවත්නා කාලය පදනම් කරමින් අදල කල් පිරීමේ කාණ්ඩ අනුව වත්කම් හා වගකීම්වල විග්‍රහයක්;

(ii) විවිධ අංශයන් කෙරෙහි වත්කම් හා වගකීම් සැළකිය යුතු ලෙස යොමු වී ඇති ආකාරය;

(iii) වියදමක් හෝ කපා හැරීමක් ලෙස හඳුනා ගත් අය කරගත නොහැකි ණය, අත්තිකාරම් හා මූල්‍ය කල්බදු පහසුකම් පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, කාලච්ඡේදය තුළදී ණය, අත්තිකාරම් හා මූල්‍ය කල්බදු පහසුකම් තුළින් සිදු වන පාඩු සඳහා වෙන් කිරීම්වල වෙනස්වීම් පිළිබඳ විස්තර සහ එවැනි අලාභ සඳහා වෙන් කිරීම්වල සමස්ත එකතුව;

(iv ) අවදනම් පාලනය කිරීම සඳහා බැංකුවේ ඇති ක්‍රියා පිළිවෙත් හා පාලන විධි සහ එවැනි අවදනම් තත්ත්වයන්හිදී සහායට ඇති ප්‍රාග්ධනය පිළිබඳ තොරතුරු;

(v) සුරැකුම් සහිත වගකීම්වල සමස්ත එකතුව හා සුරැකුම් වශයෙන් තබා ඇති වත්කම්වල ස්වභාවය හා ප්‍රමාණය;

(vi) භාරකාරත්ව කටයුතු;

(vii) සියළුම අධ්‍යක්ෂවරුන්ට, ඥාති පාර්ශවයන්ට හා වෙනත් කුමන හෝ ආකාරයක සම්බන්ධතාවයක් ඇති පාර්ශවයන්ට දෙන ලද බැංකු පහසුකම්;

1999 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් හෝ ඊට පසු ගිණුම් කාලයන් සඳහා වූ විගණිත වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමේදී සියළුම බලපත්‍රලාභී විශේෂිත බැංකු ඉහත සඳහන් ආකෘතිය අනුගමනය කළයුතු වේ.

## 2000 වසරේ පරිගණක ප්‍රශ්නය

වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව 2000 වසරට පා තැබීමේදී බැංකු හා මූල්‍ය අංශයේ ව්‍යාපාරික කටයුතු සුමට ලෙස ඊට අනුගත වන බව සනාථ කෙරෙනු වස්, දෙපාර්තමේන්තුවේ නියමයන් යටතට ගැනෙන එකිනෙක ආයතනයන්හි 2000 වසරේ සූදනම සඳහා කටයුතු සිදු කළ ආකාරය වසර මුළුල්ලේම අධීක්ෂණය කරන ලදී. මෙම දෙපාර්තමේන්තු දෙක මගින් අදළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීමෙන්, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා නිතර නිතර එම ආයතන විසිත්ත කිරීමෙන් විධිමත් ලෙස වැඩ මුළු පැවැත්වීමෙන් හා ජාත්‍යන්තර අවශ්‍යතාවයන් මත සකසන ලද හදිසි ආපද සැලසුම් අධීක්ෂණය කිරීමෙන් සියළුම බැංකු ආයතන 2000 වසරට අනුගත වීමේ කටයුතු ඉටු කර ඇති බව සහතික කරනු පිණිස මෙම දෙපාර්තමේන්තු දෙක මගින් අවශ්‍ය මග පෙන්වීම් සිදු කර ඇත. සෑම ආයතනයක්ම නවසහශ්‍රයට සුමට ලෙස අනුගත වීම සපථ කරනු පිණිස ශ්‍රී ලංකා පරිගණක හා තොරතුරු තාක්ෂණ සම්මේලනයෙහි (CINTEC) පිහිටුවා ඇති ද්විසහශ්‍රක ජාතික ඉසව් කළමනාකාරිත්ව මධ්‍යස්ථානයට හා මූල්‍ය ආයතනයන්ට සහාය වීම සඳහා මහ බැංකුව තුළ පිහිටුවන ලද ඉසව් කළමනාකාරිත්ව මධ්‍යස්ථානයේ කටයුතුවලට 1999 දෙසැම්බර් 30 දින සිට 2000 ජනවාරි 03 දින දක්වා වූ සංකීර්ණතම කාලය තුළදී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවත් සමග බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වැදගත් ක්‍රියාදමයක් ඉටු කරන ලද අතර නව සහශ්‍රයට සංක්‍රමණය වීම සාර්ථකව සිදු විය.

## බැංකු පනත යටතේ 1999 දී නිකුත් කළ විධානයන්

විමසුමට ලක් කෙරෙන වසර තුළදී මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට හා විශේෂිත බැංකුවලට පහත දක්වෙන නියෝගයන් නිකුත් කරන ලදී.

### (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කළ නියෝග

(i) බැංකු පනතේ 46(1)(ඇ) වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක කොටස් ප්‍රාග්ධන අයිතියෙහි සීමාවන්ට අදාලව 1999 මාර්තු 5 වන දිනදී නිකුත් කළ 1999 අංක 1 දරණ නියෝගය,

(ii) බැංකු පනතේ 46(1)(ඇ) වගන්තිය යටතේ තනි පුද්ගලයෙකුට දිය හැකි උපරිම ණය සීමාවීම අදාළව 1999 ඔක්තෝබර් 11 වන දිනදී නිකුත් කළ 1999 අංක 2 දරණ නියෝගය,

(iii) 2001 ජනවාරි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය සියයට 8 සිට සියයට 10 දක්වාද, මූලික ප්‍රාග්ධනය (Core Capital) හෙවත් ප්‍රථම කාණ්ඩයේ (Tier I) ප්‍රාග්ධනය සියයට 4 සිට සියයට 5 දක්වාද වැඩි කරමින් බැංකු පනතේ 19(2) හා 19(7) වගන්ති යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයන් පවත්වාගෙන යාමට අදළව 1997 අගෝස්තු මස 22 දිනදී නිකුත් කළ නිවේදනයට 1999 දෙසැම්බර් මස 27 දිනදී කරන ලද සංශෝධනය.

### (ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කළ නියෝග

(i) බැංකු පනතේ විධිවිධාන අනුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවල විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම සඳහා නියමිත ගිණුම්කරණ ආකෘතියක් 1999 දෙසැම්බර් 15 වෙනි දිනදී නිකුත් කිරීම,

(ii) බැංකු පනතේ 76(ඒ) වගන්තිය යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කොටස් ප්‍රාග්ධන අයිතිය සම්බන්ධයෙන් 1999 නොවැම්බර් 23 දිනදී නිකුත් කළ 1999 අංක 3 දරණ නියෝගය,

(iii) 2001 ජනවාරි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය සියයට 8 සිට සියයට 10 දක්වාද, මූලික ප්‍රාග්ධනය හෙවත් ප්‍රථම කාණ්ඩයේ ප්‍රාග්ධනය සියයට 4 සිට සියයට 5 දක්වාද වැඩි කරමින්, බැංකු පනතේ 76(ඒ)(1) වගන්තිය යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව හැර අනිකුත් සියළු විශේෂිත බැංකුවලට මුදල් මණ්ඩලය විසින් 1997 නොවැම්බර් මස 21 දිනදී නිකුත් කළ නියෝගය 1999 දෙසැම්බර් මස 27 දිනදී සංශෝධනය කිරීම,

### (ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකුවලට නිකුත් කළ උපදෙස්

සියළුම බැංකු ගනුදෙනුවලට අදාලව, විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ අංශයෙහි නව නිපැයුම්වලදී රහස්‍ය භාවය දැඩි ලෙස ආරක්ෂා කිරීම සඳහා සුදුසු පියවර ගැනීම සඳහා බැංකු පනතේ 77 වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1999 දෙසැම්බර් මස 1 වෙනි දිනදී බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකුවලට උපදෙස් දෙන ලදී.

### තැන්පතු රක්ෂණ ක්‍රමය

මුදල් නීති පනත යටතේ පිහිටුවන ලදුව 1987 දී ආරම්භ කරන ලද තැන්පතු රක්ෂණ ක්‍රමය දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් පරිපාලනය කරන ලදී. මෙම තැන්පතු රක්ෂණ ක්‍රමයෙහි සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් ලබාගැනේ. දැනට මෙම ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇත්තේ විවිධ සේවා සමූපකාර සමිති හතරක් පමණි. තැන්පතු රක්ෂණය වෙනුවෙන් ගෙවිය යුතු රක්ෂණ වාරිකය කාර්තුවකටරුපියල් 100 කට ශත 3.75 ක් වූ අතර, එමගින් 1999 වසරේදී තැන්පතු රක්ෂණ අරමුදලට එකතු වූ මුළු වාරික මුදල රුපියල් ලක්ෂ 9.3 කි. 1999 දෙසැම්බර් 31 වන දිනට මුළු තැන්පතු රක්ෂණ අරමුදල රුපියල් දශ ලක්ෂ 90.4 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 50 ක් 1997 දී මහ බැංකුව විසින් වෙන් කරන ලදී. මෙම අරමුදල, මුහුණත වටිනාකම රුපියල් දශ ලක්ෂ 102 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත.

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව ලියාපදිංචි මූල්‍ය ආයතනවල ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, ප්‍රඥාන්විත කළමණාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය ඇති බව සහතික කිරීමේ අරමුණින් තවදුරටත් අධීක්ෂණ ක්‍රියාවලියෙහි නිරත විය. ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් මූල්‍ය සමාගම්වල ස්ථානගත පරීක්ෂණ හා එම සමාගම් විසින් සපයනු ලබන දත්ත විශ්ලේෂණය ඇසුරෙන් නිරන්තර අවධානයෙන් සිටීම නොකඩවා කරගෙන යන ලදී.

### මූල්‍ය සමාගම් ක්‍රියාකාරිත්වයේ සමාලෝචනය

1998.03.31 දිනට හා 1999.03.31 දිනට ලියාපදිංචි මූල්‍ය සමාගම් 25 හි ඒකාබද්ධ ශේෂ පත්‍රය II-7 සංඛ්‍යා සටහනෙහි දක්වේ. වර්ෂය තුළදී ලියාපදිංචි මූල්‍ය සමාගම්වල මුළු වත්කම් රුපියල් දශ ලක්ෂ 4,531 කින් හෙවත් සියයට19.7කින් වැඩි විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 3,467 කින් හෙවත් සියයට 24කින් වර්ධනය හා ද්‍රවශීල වත්කම්වල රුපියල් දශ ලක්ෂ 335 කින් හෙවත් සියයට 12.2 ක වර්ධනයයි.

ප්‍රධාන වත්කම්වල සංයුතියේ කැපී පෙනෙන වෙනසක් සිදු නොවූ අතර, පසුගිය වසරේ මෙන්ම මේ වසරේද මුළු අත්තිකාරම් වැඩි ප්‍රමාණයක් කල්බදු වලින් නියෝජනය විය. වත්කම් වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූයේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 2,197 කින් හෙවත් සියයට 14.8 කින් හා ණය දීම් රුපියල් දශ ලක්ෂ 1,593 කින් හෙවත් සියයට 205.2කින් හා ප්‍රාග්ධන අරමුදල් රුපියල් දශ ලක්ෂ 343 කින් හෙවත් සියයට 10.2 කින් වැඩි වීමයි.

II - 7 සංඛ්‍යා සටහන

**ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍රය**

| | 1998.03.31 දිනට | | 1999.03.31 දිනට | | වෙනස |
|---|---|---|---|---|---|
| | රු. '000 | ප්‍රතිශතය | රු. '000 | ප්‍රතිශතය | % - |
| **වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන අරමුදල්** | | | | | |
| නිකුත් කළ ප්‍රාග්ධනය | 620,882 | | 658,587 | | |
| කොටස් අධි මිල | 190,546 | | 190,546 | | |
| ප්‍රාග්ධන සංචිතය | 843,104 | | 892,553 | | |
| පොදු සංචිතය | 1,094,003 | | 1,317,166 | | |
| සංචිත අරමුදල | 474,114 | | 543,740 | | |
| වෙනත් සංචිත | 58,145 | | 47,469 | | |
| ලාභාලාභ ගිණුමේ ශේෂය | 96,099 | | 67,736 | | |
| **දළ ප්‍රාග්ධන අරමුදල** | **3,376,893** | | **3,717,797** | | |
| අඩු කළා : විලම්බිත ගෙවුම් | 8,664 | | 6,775 | | |
| **ශුද්ධ ප්‍රාග්ධන අරමුදල** | **3,368,229** | **14.63** | **3,711,022** | 13.47 | 10.18 |
| **බොල් හා අඩමාන ණය වෙන් කිරීම** | **937,940** | **4.07** | **1,072,820** | 3.89 | 14.38 |
| **මහජන තැන්පතු** | **14,773,980** | **64.15** | **16,970,850** | 61.58 | 14.87 |
| **ණය** | | | | | |
| බැංකු අයිරා | 389,766 | | 882,742 | | |
| වෙනත් | 386,249 | | 1,485,925 | | |
| **මුළු ණය** | **776,015** | 3.37 | **2,368,667** | 8.59 | 205.23 |
| **වෙනත් වගකීම්** | **3,173,670** | **13.78** | **3,437,024** | 12.47 | 8.30 |
| **මුළු එකතුව** | **23,029,834** | **100.00** | **27,560,383** | 100.00 | 19.67 |
| **වත්කම්** | | | | | |
| **ද්‍රවශීල වත්කම්** | | | | | |
| අතැති මුදල් හා බැංකු ශේෂය | 331,431 | | 408,663 | | |
| ස්ථාවර තැන්පතු | 613,589 | | 575,544 | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,800,127 | | 2,095,626 | | |
| **මුළු ද්‍රවශීල වත්කම්** | **2,745,147** | **11.92** | **3,079,833** | **11.17** | **12.19** |
| **ආයෝජන** | | | | | |
| ආශ්‍රිත සමාගම් හා පාලිත | 382,560 | | 724,817 | | |
| අනුබද්ධ සමාගම්වල කොටස් | 256,653 | | 281,291 | | |
| වෙනත් සමාගම්වල කොටස් | 705,663 | | 627,878 | | |
| වෙළෙඳ ආයෝජන | 224,915 | | 251,362 | | |
| **මුළු ආයෝජන** | **1,569,791** | **6.82** | **1,885,348** | **6.84** | **20.10** |
| **අත්තිකාරම්** | | | | | |
| ණය | 872,845 | | 1,240,181 | | |
| කුලී සින්නක්කර ණය | 3,421,408 | | 2,232,039 | | |
| කල් බදු ණය | 7,783,084 | | 11,117,742 | | |
| නිශ්චල දේපල ණය | 1,110,212 | | 1,648,635 | | |
| වෙනත් අත්තිකාරම් | 1,314,454 | | 1,730,795 | | |
| **මුළු අත්තිකාරම්** | **14,502,003** | **62.97** | **17,969,392** | **65.20** | **23.91** |
| **ස්ථාවර වත්කම්** | | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,565,737 | | 1,725,353 | | |
| ගෘහ භාණ්ඩ සවි කිරීම හා කාර්යාලයීය උපකරණ | 200,217 | | 242,163 | | |
| මෝටර් රථ | 177,048 | | 188,677 | | |
| යන්ත්‍රසූත්‍ර | 5,567 | | 1,998 | | |
| බදු සින්නක්කර | 47,025 | | 57,811 | | |
| වෙනත් | 21,802 | | 60,014 | | |
| **මුළු ස්ථාවර වත්කම්** | **2,017,396** | **8.76** | **2,276,016** | **8.26** | **12.82** |
| **වෙනත් වත්කම්** | **2,195,497** | **9.53** | **2,349,794** | **8.53** | **7.03** |
| **මුළු එකතුව** | **23,029,834** | **100.00** | **27,560,383** | **100.00** | **19.67** |
| **වාර්තා කළ සමාගම් ගණන** | **25** | | 25 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ලියාපදිංචි මූල්‍ය සමාගම් පාලනය හා අධීක්ෂණය

1999 වර්ෂයේදී, මුදල් සමාගම් පනත යටතේ පනවා ඇති නියෝග හා රෙගුලාසිවලට අනුකූලව ලියාපදිංචි මූල්‍ය සමාගම් 25 කටයුතු කරන බව සහතික වනු වස්, එම සමාගම් විසින් අඛණ්ඩව සපයනු ලබන කාලීන වාර්තා ඇසුරෙන් නිරන්තර අවධානයෙන් සිටීම මගින් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ කටයුතු නොකඩවා කරගෙන යන ලදී. මෙහිදී අවම ප්‍රාග්ධනය හා ද්‍රවශීල මට්ටම, තනි පුද්ගලයෙකුට දිය හැකි ණය ප්‍රමාණයන්, බොල් හා අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රමාණවත් බව ආදී කරුණු නිරීක්ෂණය කරන ලදී. ඉහත කාර්යය සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් සතිපතා ද්‍රවශීල වත්කම් ප්‍රකාශන, දෙන ලද වටිනාකමෙන් වැඩි අත්තිකාරම් පිළිබඳ මාසික වාර්තා, මාසික වත්කම් බැරකම් ප්‍රකාශන, ආපසු නොගෙවන ණය මුදල් පිළිබඳ ත්‍රෛමාසික වාර්තා සහ විගණනය කරන ලද වාර්ෂික ශේෂ පත්‍ර හා මූල්‍ය ප්‍රකාශන ආදිය නොකඩවා ලබාගන්නා ලදී. මෙම කාලය තුළ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ලාභදායිත්වය හා වර්ධනය, සමීපව නිරීක්ෂණය කිරීම මගින් අයහපත් වර්ධනයක් ඇත්දැයි හඳුනා ගැනීමට හා ඒවා වළක්වාලීමට කටයුතු යොදන ලදී.

තවද, මෙම කාලය තුළදී දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සමාගම් හතරක ස්ථානීය පරීක්ෂණ සිදු කරන ලදී. මූල්‍ය සමාගම්වල ගිණුම් පොත් හා වෙනත් වාර්තා පරීක්ෂා කිරීම මගින් සහ සමාගම්වල නිලධාරීන් සමග සාකච්ඡා කිරීම තුළින් ලබා ගත් තොරතුරු මත එම සමාගම්වල ප්‍රාග්ධනයෙහි ප්‍රමාණවත් බව, කළමණාකාරිත්වයේ හැකියාව, වත්කම්වල ගුණාත්මක බව, ඉපැයීම් ප්‍රමාණවල ගුණාත්මක බව සහ ද්‍රවශීලතා තත්ත්වයන් අගැයීමකට භාජනය කරන ලදී. එමෙන්ම අභ්‍යන්තර පාලන ක්‍රමවල සාර්ථකත්වය සහ සත්‍ය හා කාලීන කළමනාකරණ තොරතුරු සැපයීමේ හැකියාවද අගයන ලදී.

සවිස්තරාත්මකව කරනු ලබන ස්ථානීය පරීක්ෂණවලට අතිරේක වශයෙන් මෙකී සමාගම්වල තීරණාත්මක අංශ පරීක්ෂාවට ලක් කරමින් හදිසි පරීක්ෂණද සිදු කරන ලදී. මූල්‍ය සමාගම් මගින් කාලීනව සපයනු ලබන දත්ත තුළින් හෙළි වූ තොරතුරු මත පරීක්ෂණයට භාජනය කළයුතු අංශ තෝරා ගැණින. වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමට පෙරද මූල්‍ය සමාගම් හදිසි පරීක්ෂණවලට භාජනය කරන ලදී.

## දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්

මූල්‍ය සමාගම් පනත යටතේ මුදල් මණ්ඩලය වෙත පවරා ගනු ලැබූ මූල්‍ය සමාගම් 9 ක පරිපාලනය හා කළමණාකරණ කටයුතු සිදු කරන ලද අතර, 1999 වසර අවසාන වනවිට සමාගම් හතරක් ඈවර කිරීමේ කටයුතු කරගෙන යන ලදී. ඉතිරි සමාගම් පහේ පරිපාලනය සහ කළමණාකරණ කටයුතු නොකඩවාම මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලදී. " දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවන් සඳහා සහන සැලසීමේ ක්‍රමය" යටතේ එවැනි සමාගම්වල තැන්පතුකරුවන් සඳහා මේ වසරේදී සහන ගෙවීම් නොකඩවා කරගෙන යන ලදී.

එම මූල්‍ය සමාගම් වලින් දෙන ලද ණය මුදල් ආපසු අය කර ගැනීමෙන් සහ වත්කම් විකිණීමෙන් ලබා ගත් අරමුදල් උපයෝගී කර ගනිමින් සහන ගෙවීම් කරගෙන යන ලදී. එවන් එක් දුෂ්කරතාවයට පත් වූ මූල්‍ය සමාගමක තැන්පතුකරුවන් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ මුළු මුල් මුදලම ඔවුනට ආපසු ගෙවීමට කටයුතු කර ඇත. එම මූල්‍ය සමාගම විසින්ම "දුෂ්කරතාවයට පත් වූ මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවන් සඳහා සහන සැළසීමේ ක්‍රමය" යටතේ මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්‍ෂ 12.68 ක් වූ ප්‍රතිමූල්‍ය ණය මුදල මුළුමණින්ම ආපසු ගෙවා ඇත. තවත් දුෂ්කරතාවයට පත් වූ මූල්‍ය සමාගමක් විසින් එම සමාගමේ ස්ථිර තැන්පතුකරුවන්ට ඔවුන්ගේ මුල් තැන්පතු මුදලින් දැනට ආපසු ගෙවා ඇති සහන මුදලට වඩා සියයට 15 ක තවත් සහන මුදලක් ගෙවීම ආරම්භ කළ අතර, ඒ අනුව 1999 වර්ෂය අවසන් වනවිට එම සමාගමේ ස්ථිර තැන්පතුකරුවන්ගේ මුල් තැන්පතු මුදලින් සියයට 45 ක මුදලක් සහන ගෙවීම් ලෙස එම තැන්පතුකරුවන්ට ආපසු ලබා දීමට කටයුතු කර ඇත. තවද, එම මූල්‍ය සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම සමාගම වෙත ලබා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 15 ක මුදලක් ආපසු ගෙවීමට කටයුතු කර ඇති අතර, එමගින් මහ බැංකුවට ගෙවිය යුතුව තිබූ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 48.5 සිට රුපියල් දශ ලක්ෂ 41.2 දක්වා අඩු කරගත හැකි විය.

1999 වර්ෂය තුළදී මුදල් මණ්ඩලය විසින් දුෂ්කරතාවයට පත් වූ මූල්‍ය සමාගම් තුනක ඈවර කිරීමේ අයදුම්පත් අදාළ දිස්ත්‍රික් උසාවිය වෙත ඉදිරිපත් කිරීමට තීරනය කර ඇත. දැනටමත් දුෂ්කරතාවයට පත් එක් මූල්‍ය සමාගමක් වෙනුවෙන් ඈවර කිරීමේ අයදුම්පත් උසාවිය වෙත ඉදිරිපත් කර ඇත.

තවද, දුෂ්කරතාවයට පත්, එහෙත් ශ්‍රී ලංකා මහ බැංකුව පවරා නොගෙන, එහෙත් මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලද එක් මූල්‍ය සමාගමක් ඈවර කිරීමට ඈවර කරුවෙකු පත් කරන ලදී. තවත් එවැනි මූල්‍ය සමාගමක් ඈවර කිරීමේ අයදුම්පතක් 1999 වසර අවසන් වනවිට උසාවිය වෙත තීන්දුවක් ලබා ගැනීම උදෙසා ඉදිරිපත් කර තිබුණි.

## ප්‍රතිපත්ති හඳුන්වා දීම

මෙම වසර තුළදී දෙපාර්තමේන්තු විසින් ශ්‍රී ලංකා මූල්‍ය ආයතන සංගමය මගින් සංවිධානය කරන ලද මූල්‍ය ආයතනවල අධ්‍යක්‍ෂවරුන් හා ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය සහභාගී වූ සාමූහික සමාගම් පාලනය පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවේදී අධ්‍යක්‍ෂවරුන්ගේ කාර්යයන් හා වගකීම්, ප්‍රඥාන්විත අවශ්‍යතා හා මූල්‍ය වාර්තාවල නිවැරදි බව අනාවරණය කිරීමේ ප්‍රමිති ආදිය පිළිබඳව

සාකච්ඡා කරන ලදී. වැඩමුළුවේදී සාකච්ඡා කළ මූල්‍ය සමාගම් විධිමත් කිරීමේ ක්‍රියා මාර්ගවලට අවදනම් මත බර තැබූ අවම ප්‍රාග්ධන අනුපාතය හඳුන්වා දීම, වඩාත් දැඩි ලෙස ආදායම් හඳුනා ගැනීම හා නිර්වචනය කිරීමේ ප්‍රමිතීන් ඇති කිරීම, අනුබද්ධ සමාගම්වල කොටස් ආයෝජනය, බොල් හා අඩමාන ණය වෙන් කිරීම යන මාතෘකාද අයත් විය.

# සංවර්ධන මුදල්

1999 වර්ෂය තුළදී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු තවදුරටත් පුළුල් විය. වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිමූල්‍ය මුදා හැරීම පෙර වර්ෂයට වඩා වැඩි ප්‍රවනතාවයක් පෙන්නුම් කරමින් සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ප්‍රදානය කරන ලද ණය මුදල් ආවරණය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ආවරණ සහතික නිකුත් කිරීම තවදුරටත් සිදු කෙරුණි.

ආසියානු සංවර්ධන බැංකුව සමග පැවැත්වූ සාකච්ඡා සාර්ථකව නිම වීමේ ප්‍රතිඵලයක් ලෙසින් නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල පදිංචි අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගනිමින්, නාගරික සංවර්ධනය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ ණය ක්‍රමය යනුවෙන් නව නිවාස ණය ව්‍යාපෘතියක් 1999 මාර්තු මස සිට ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සහතික සපයනු ලැබූ, එහෙත් නිමාවට පත් වී ඇති ණය යෝජනා ක්‍රම සහ දනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් පිළිබඳව ව්‍යාපෘති පරීක්ෂා කිරීම් හා පසු විපරම් කිරීම් මෙම වර්ෂය තුළදීද තවදුරටත් සිදු කරන ලදී.

## වර්තමාන ණය ව්‍යාපෘති

### වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (වැ.ප්‍ර.ව්‍යා.)

1998 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය යටතේ අනුමත වූ මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,564 ක් වූ අතර, 1999 වර්ෂය අවසාන වනවිට එය රුපියල් දශ ලක්ෂ 1,512 ක් විය. 1999 වර්ෂයේ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ ලෝක වෙළඳපොළේ තේ සහ රබර් මිල ගණන් අඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ප්‍රතිමූල්‍ය සඳහා වූ ඉල්ලුම අඩු වීමයි. කෙසේ වුවද, ප්‍රතිමූල්‍ය මුදා හැරීම් 1998 වර්ෂයට වඩා සියයට 55 කින් වැඩි වී 1999 වර්ෂය අවසාන වනවිට එය රුපියල් දශ ලක්ෂ 1,810 ක් විය. මෙයට හේතු වූයේ 1998 වර්ෂයේ වූ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් 1999 වර්ෂය තුළ සිදු කිරීම නිසාය.

පසුගිය වර්ෂවල දී මෙන්ම වැඩිම වටිනාකමින් යුක්ත ණය මුදලක් එනම්, රුපියල් දශ ලක්ෂ 841 ක් අනුමත කර ඇත්තේ වැවිලි බෝග සංවර්ධන අංශයටය. කෙසේ වුවද, ඒ සඳහා මුදා හැර ඇති ණය ප්‍රමාණය පසුගිය වසරේ අනුමත කල ණය ප්‍රමාණයෙන් කොටසක්ද ඇතුළුව රුපියල් දශ ලක්ෂ 985 ක් විය. සැකසීම, වැඩි දියුණු කිරීම සහ පරිසර දූෂණ පාලනය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 425 ක වටිනාකමකින් යුක්ත ණය අයදුම්පත් 15 ක් අනුමත වූ අතර, රුපියල් දශ ලක්ෂ 575 ක් මුදා හැර ඇත. මෙය 1998ට වඩා සියයට 45 ක වැඩි වීමකි. එසේම සේවා වාහන හා උපකරණ මිලදී ගැනීම් සඳහා 1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 249 ක් මුදා හරින ලද අතර මෙය 1998 ට වඩා සියයට 72 ක වැඩි වීමකි. ණය අනුමත කිරීම් සහ මුදා හැරීම් පිළිබඳ විස්තර II-8 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II - 8 වැනි සංඛ්‍යා සටහන

**වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**
**අරමුණ අනුව ණය අනුමත කිරීම් සහ මුදා හැරීම්**

(රුපියල් දශ ලක්ෂ)

| අරමුණ | 1998 | | 1999 | | 1996 - 1999 | |
|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුදා හැරීම් | අනුමත කිරීම් | මුදා හැරීම් | අනුමත කිරීම් | මුදා හැරීම් |
| වැවිලි බෝග සංවර්ධනය | 1.072 | 550 | 841 | 985 | 2.293 | 1.781 |
| සැකසුම් වැඩි දියුණු කිරීම් සහ පරිසර දූෂණය පාලනය | 1.005 | 259 | 425 | 575 | 1.895 | 1.031 |
| සේවා වාහන සහ උපකරණ | 486 | 181 | 247 | 249 | 987 | 564 |
| එකතුව | 2.564 | 991 | 1.513 | 1.810 | 5.175 | 3.377 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටින සහභාගිත්ව ණය දෙන ආයතන අතරින් මෙම වර්ෂය තුළදී වැඩිම ණය මුදල් ප්‍රමාණයක් එනම් රුපියල් දශ ලක්ෂ 837 ක් හෙවත් මුළු මුදා හැරීම් වලින් සියයට 46 ක් වැවිලි සමාගම් අතර මුදා හැර ඇත්තේ ජාතික සංවර්ධන බැංකුවයි. සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව (සියයට 30), ලංකා බැංකුව (සියයට 13), කොමර්ෂල් බැංකුව (සියයට 10), සහ සම්පත් බැංකුව (සියයට 1), ඉතිරි මුදා හැරීම් සඳහා දායක වී ඇත. සෙලාන් බැංකුව වෙත අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 260 ක් වුවත්, 1999 දී ප්‍රතිමූල්‍ය ණය මුදා හැරීමක් සිදු වී නොමැත.

වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම 1998 වර්ෂයේ පැවැති රුපියල් දශ ලක්ෂ 605 සිට 1999 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 1,048 දක්වා වැඩි විය. 1996 වර්ෂයේ සිට 1999 වර්ෂය දක්වා මෙම ණය සහතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,991 කි. මෙම ව්‍යාපෘතිය යටතේ මුදා හරින ලද ණය මුදල් සඳහා නිකුත් කරන ලද ණය සහතික වෙනුවෙන් ශ්‍රී

ලංකා මහ බැංකුව වෙත ලැබී ඇති ණය ආවරණ වාර මුදල මෙම වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 37 ක් වන අතර, 1996 සිට 1999 දක්වා කාලය තුළ ලැබී ඇති මුළු ණය ආවරණ වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 56කි. මෙම විස්තර II-9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය (සුමදි)

1997 වර්ෂයේ සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය යටතේ 1999 වර්ෂය තුළදී සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ව්‍යාපෘතීන් සඳහා ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්ෂ 1,187 ක් ආවරණය කරමින් රුපියල් දශ ලක්ෂ 653 ක මුළු වටිනාකමකින් යුක්ත ණය සහතික 817 ක් නිකුත් කරන ලදී. වර්ෂය තුළදී ණය සහතික 33 ක් අවලංගු වූ අතර, ණය සහතික 8 ක් වෙනුවෙන් වූ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කර ඇත. නිකුත් කරන ලද ණය සහතික වෙනුවෙන් 1998 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 509 ක්ව පැවැති ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම 1999 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 653 ක් දක්වා වැඩි වී ඇත.

පසුගිය වර්ෂය අවසානයේදී මෙන්ම මෙම වර්ෂය අවසාන වනවිටද, සුමදි යටතේ වැඩි ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත්තේ මගී හා භාණ්ඩ ප්‍රවාහනය, අවන්හල්, වාහන සේවා මධ්‍යස්ථාන හා විදුලි උපකරණ නිපදවීමේ (ඉලෙක්ට්‍රොනික්) කර්මාන්ත සහ අනෙකුත් සේවාවන් ඇතුළු සේවා හා කර්මාන්ත සඳහාය. 1999 වර්ෂය තුළදී මෙම අංශයට ප්‍රදානය කරන ලද මුළු ණය මුදල් ප්‍රමාණය 1998 වර්ෂය සමග සසඳන කල සියයට 55 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙතෙක් ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව කර්මාන්ත පදනම් කොටගෙන කරන ලද වර්ගීකරණයක් II-10 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

## නාගරික සංවර්ධනය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නව නිවාස ණය ව්‍යාපෘතිය

1992 වර්ෂයේ සිට 1998 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වන නිවාස ණය යෝජනා ක්‍රමයෙහි IV අදියර අවසන් වීමත් සමගම නාගරික සංවර්ධනය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නව නිවාස ණය ව්‍යාපෘතියක් 1999 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ විය. ආසියානු සංවර්ධන බැංකුවෙන් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 20 ක (රුපියල් දශ ලක්ෂ 1,400) ණය ආධාර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ ණය පහසුකම් ලබාගත හැකි වනුයේ නාගරික, අර්ධ නාගරික හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි නාගරික මධ්‍යස්ථානවල නිවැසි මාසික ආදායම රුපියල් 8,500 නොඉක්මවන පවුල්වලටය. මෙම නව නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන ණය දෙන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කරන අතර, හැටන් නැෂනල් බැංකුව සහ කොමර්ෂල් බැංකුව සහභාගිත්ව ණය දෙන ආයතන වශයෙන් ක්‍රියා කරනු ලැබේ. නිවාසවලට අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම, නිවාස වැඩි දියුණු කිරීම් හා අළුත්වැඩියා කිරීම් ආදී කටයුතු සඳහා සහ ඉඩම් මිලදී ගැනීම සඳහා මෙම නිවාස ණය ප්‍රදානය කරනු ලැබේ. වර්ෂය තුළදී මුළු ප්‍රතිමූල්‍ය ණය අනුමත කිරීම් රුපියල් දශ ලක්ෂ 2.9 ක් වූ අතර, රුපියල් දශ ලක්ෂ 0.7 ක් මුදා හැර ඇත. අනුමත වූ රුපියල් දශ ලක්ෂ 2.9 ක ණය මුදලෙන් සියයට 55 ක් අනුමත වී ඇත්තේ පවතින නිවාස වැඩි දියුණු කිරීම සඳහාය. ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් සහ මුදා හැරීම් පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-11 හි දක්වා ඇත.

### II - 9 වැනි සංඛ්‍යා සටහන
### වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය
### ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්, මුදා හැරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම

(රුපියල් දශ ලක්ෂ)

| සහභාගිත්ව මූල්‍ය ආයතන | 1998 | | | | 1999 | | | | 1996 - 1999 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල |
| ජාතික සංවර්ධන බැංකුව | 1,147 | 407 | 251 | 7 | 428 | 837 | 504 | 19 | 2,122 | 1,600 | 965 | 29 |
| ස.මු.ස.බැංකුව | 994 | 419 | 257 | 3 | 460 | 538 | 283 | 11 | 1,723 | 1,051 | 595 | 15 |
| ලංකා බැංකුව | 286 | 85 | 47 | 2 | 109 | 237 | 157 | 3 | 516 | 398 | 245 | 6 |
| සීමාසහිත කොමර්ෂල් බැංකුව | 39 | 80 | 50 | 1 | 255 | 173 | 92 | 4 | 456 | 304 | 173 | 6 |
| සීමාසහිත සම්පත් බැංකුව | 98 | - | - | - | 0 | 25 | 13 | 0 | 98 | 25 | 13 | 0 |
| සීමාසහිත සෙලාන් බැංකුව | - | - | - | - | 260 | - | - | - | 260 | - | - | - |
| **එකතුව** | **2,564** | **991** | **605** | **13** | **1,512** | **1,810** | **1,048** | **37** | **5,175** | **3,377** | **1,991** | **56** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

II - 10 වැනි සංඛ්‍යා සටහන
**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය ණය සහතික ක්‍රමය**
**කර්මාන්ත අනුව ණය වර්ගීකරණය - (අ) 1999.12.31 දිනට**

(රුපියල් දශ ලක්ෂ)

| කර්මාන්ත | ප්‍රදානය කළ ණය | | | ප්‍රදානය කළ ණය ප්‍රමාණය | | | ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | 1998 | 1999 | 1997-1999 | 1998 | 1999 | 1997-1999 | 1997-1999 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 112 | 97 | 209 | 186 | 165 | 351 | 174 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 63 | 21 | 84 | 87 | 52 | 139 | 68 |
| 3. දව සහ දව නිෂ්පාදන | 23 | 29 | 52 | 18 | 45 | 63 | 34 |
| 4. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 13 | 21 | 34 | 25 | 67 | 92 | 36 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 16 | 33 | 49 | 23 | 65 | 88 | 46 |
| 6. මූලික ලෝහ නිෂ්පාදන | 8 | 28 | 36 | 12 | 36 | 48 | 19 |
| 7. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 47 | 29 | 76 | 52 | 39 | 91 | 54 |
| 8. සකස් කල ලෝහ නිෂ්පාදන, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 28 | - | 28 | 22 | - | 22 | 17 |
| 9. කෘෂි නිෂ්පාදන | 70 | 102 | 172 | 80 | 164 | 244 | 154 |
| 10. අනෙකුත් (ආ) | 323 | 457 | 780 | 357 | 555 | 912 | 561 |
| එකතුව | 703 | 817 | 1,519 | 863 | 1,187 | 2,050 | 1,162 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ණය ආවරණ සහතික නිකුත් කිරීම් පදනම් කොට ගත්.
(ආ) මගී සහ වාණිජ ප්‍රවාහනය, සේවා මධ්‍යස්ථාන, අවන්හල්, ඉලෙක්ට්‍රොනික් සහ අනෙකුත් සේවාවන් ඇතුළුව.

II - 11 වැනි සංඛ්‍යා සටහන
**නාගරික සංවර්ධනය සහ අඩු ආදයම් ලාභී නිවාස ණය යෝජනා ක්‍රමය ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් සහ මුද හැරීම් - 1999.12.31 දින දක්වා**

| සහභාගිත්ව ණය දෙන ආයතන | අනුමත කිරීම් (රුපියල්) | මුද හැරීම් (රුපියල්) |
|---|---|---|
| සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | 1,540,000 | 615,000 |
| සීමාසහිත කොමර්ෂල් බැංකුව | 1,415,000 | 86,250 |
| එකතුව | 2,955,000 | 701,250 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ණය ඇප ආවරණ අරමුදල් ආයෝජනය කිරීම

1999 අවසානය වන විට ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරන ලද මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,696 ක් විය. 1999 වර්ෂය අවසාන වනවිට මෙම ආයෝජනයන්ගෙන් ලද මුළු පොලී ආදයම රුපියල් දශ ලක්ෂ 141 ක් විය. ආයෝජන සඳහා අරමුදල් සපයා ගනු ලැබුයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය, බස් රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය සහ වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන ණය සහතික ක්‍රම යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් නිකුත් කරන ලද ණය සහතික සඳහා රැස් කර ගන්නා ලද වාර මුදල් සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය සහ බස් රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් එම ව්‍යාපෘති ආරම්භයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්තිකාරම් වශයෙන් දෙන ලද අරමුදල්වලිනි.

## නිමාවට පත් වූ ණය සහතික ක්‍රම

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය (සුමක I - IV) (1979 - 1997), බස් රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය (1990 - 1992), එක්සත් ජනපද රජයෙන් සහතික කල අඩු ආදයම් පවුල් සඳහා වන නිවාස වැඩසටහනෙහි IV අදියර (අ.ආ.නි.වැ.) (1992 - 1998) යන ණය යෝජනා ක්‍රම දනට නිමාවට පත් වී ඇති අතර, ඒවායෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර II-12 වැනි සහ II-13 වැනි සංඛ්‍යා සටහන් වලින් දක්වා ඇත. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය සහ බස් රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම නිමාවට පත් වී නොමැති බැවින්, එම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සහ ව්‍යාපෘති පරීක්ෂණ තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

II - 12 වැනි සංඛ්‍යා සටහන
**අඩු ආදයම් පවුල් සඳහා වන නිවාස වැඩසටහනෙහි IV අදියර අරමුණ අනුව ණය අනුමත කිරීම් සහ මුද හැරීම්**

(රුපියල් දශ ලක්ෂ)

| කාණ්ඩය | අනුමත කිරීම් සහ මුද හැරීම් *1992-1998 | | |
|---|---|---|---|
| | නාගරික | ග්‍රාමීය | එකතුව |
| අරමුණ | | | |
| නව නිවසක් ගොඩ නැගීම | 58 | 444 | 502 |
| නිවාස වැඩි දියුණු කිරීම සහ අළුත්වැඩියා කිරීම | 51 | 243 | 294 |
| ඉඩමක් හිමි කර ගැනීම | 71 | 582 | 653 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 1 | 5 | 6 |
| එකතුව | 180 | 1,274 | 1,454 |

* අනුමත කළ ණය ප්‍රමාණයන් සම්පූර්ණයෙන් මුද හැර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**II - 13 වැනි සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය**
**සහතික ක්‍රමයන්හි සාරාංශය - (1999.12.31 වැනි දිනට)**

(රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | සුමක I (අ) | | සුමක II (ආ) | | සුමක III (ඇ) | | සුමක IV (ඈ) | | සුමදි (ඉ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 ප්‍රදානය කරන ලද ණය | 1.670 | 286 | 2.531 | 1.393 | 3.130 | 1.956 | 9.072 | 7.666 | 1.520 | 2.050 |
| 1.2 සහතික කරන ලද ණය | 1.670 | 158 | 2.531 | 714 | 3.130 | 1.313 | 9.072 | 4.772 | 1.520 | 1.162 |
| 2.1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය | 1.235 | 184 | 2.003 | 1.125 | 1.950 | 1.209 | 5.016 | 1.386 | 9 | 17 |
| 2.2 ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික | 113 | 31 | 456 | 232 | 890 | 590 | 337 | 245 | 36 | 32 |
| 3.1 ලැබූ හිමිකම් පෑම් | 338 | 76 | 228 | 119 | 170 | 97 | 220 | 167 | 7 | 8 |
| 3.2 ලැබූ හිමිකම්පෑම් වෙනුවෙන් ශ්‍රී ලකා මහ බැංකුවේ වගකීම | - | 34 | - | 66 | - | 66 | - | 113 | - | 5 |
| 3.3 හිමිකම්පෑම් සමථයකට පත් කිරීම සම්පූර්ණයෙන් | | | | | | | | | | |
| ගෙවීම් කළ හිමිකම්පෑම් | 232 | 19 | 126 | 32 | 92 | 24 | 75 | 28 | 2 | 19 |
| අර්ධ ගෙවීම් කළ හිමිකම්පෑම් | 27 | 2 | 5 | 1 | - | - | - | - | - | - |
| ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් | 32 | 7 | 46 | 13 | 44 | 16 | 55 | 22 | 1 | ... |
| ආපසු හරවා යවන ලද හිමිකම්පෑම් | - | - | 1 | ... | - | - | - | - | 2 | 1 |
| හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද ණය | 36 | 2 | 7 | 2 | 10 | 4 | 24 | 13 | - | - |
| සලකා බැලීම කල් තබන ලද හිමිකම්පෑම් | 8 | 2 | 21 | 8 | 6 | 5 | 8 | 4 | - | - |
| තීරණ ගෙන නොමැති හිමිකම්පෑම් | - | - | 10 | 3 | 11 | 7 | 51 | 29 | 2 | - |
| ඉවත් කර ගන්නා ලද හිමිකම්පෑම් | 3 | 1 | 12 | 4 | 7 | 4 | 7 | 7 | - | - |
| 4.1 නොපියවන ලද ණය මුදල් (ඊ) | 35 | 4 | 22 | 5 | 245 | 75 | 3.615 | 2.193 | 1.475 | 1.094 |
| 4.2 ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම | - | 3 | - | 4 | - | 61 | - | 1.798 | 1.475 | 662 |
| 5. රැස් කර ගන්නා ලද වාර මුදල් | - | 12 | - | 30 | - | 45 | - | 163 | - | 13 |
| 6. පශ්චාත් හිමිකම් අය කර ගැනීම් | - | 10 | - | 19 | - | 18 | - | 6 | - | - |

(අ) සුමක I - 1979-1981 දක්වා ක්‍රියාත්මක විය.
(ආ) සුමක II - 1982-1989 දක්වා ක්‍රියාත්මක විය.
(ඇ) සුමක III - 1988-1991 දක්වා ක්‍රියාත්මක විය.
(ඈ) සුමක IV - 1992-1997 දක්වා ක්‍රියාත්මක විය.
(ඉ) සුමදි 1997 දී ආරම්භ විය. 1999.10.31 දින සිට ප්‍රතිමූල්‍ය අනුමත කිරීම නවතා දමන ලදී.
(ඊ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ග්‍රාමීය ණය

මහ බැංකුව සිය ණය ව්‍යාපෘතිවල මෙන්ම විදේශ ආයතන මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවලද ණය සංරචකයන්හි මෙහෙයුම් ආයතනය වශයෙන් අඛණ්ඩව ක්‍රියා කළේය. මෙහෙයුම් ආයතනය වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය වන්නේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අයත් වන සහභාගිත්ව ණය දෙන ආයතන ව්‍යාපෘතිවලට ඇතුළත් කර ගැනීම, එම ණය දෙන ආයතනවලට මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, ව්‍යාපෘති යටතේ අනුමත වූ ණය සඳහා ප්‍රතිමූල්‍ය මුදා හැරීම, ණය යෝජනා ක්‍රම මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම, ණය වාර්තා පවත්වාගෙන යාම හා අදාළ ව්‍යාපෘති කාර්යාල සහ අනෙකුත් දේශීය ආයතනවල සහාය ඇතිව ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම යනාදියයි.

මහ බැංකුව විසින් 1999 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.

**(අ) ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘති** (ADB): -

I. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

II. තේ සංවර්ධන ව්‍යාපෘතිය

III. පළමුවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

IV. දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

V. කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

VI. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

VII. වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

VIII. උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

**(ආ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල** (IFAD), **කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය** (CIDA), **ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය** (SIDA), **ජපන් රජය හා ලෝක ආහාර වැඩසටහන** (WFP), **ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එකසත් ජනපද අරමුදල** (USAID) **සහ ජපානයේ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා බැංකුව** (JBIC) **මගින් අරමුදල් සපයන ව්‍යාපෘති :-**

IX. සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන (ඉසුරු) ව්‍යාපෘතිය:(IFAD) සහ (CIDA)

X. උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය :(IFAD, CIDA හා WFP)

XI. ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය

(ජපන් රජය)

XII. දිළිඳුකම පිටු දැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය (JBIC)

XIII. මාතලේ දිස්ත්‍රික් ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (IFAD)

### (ඇ) ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති:-

XIV. කැගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය

XV. බහුවාර්ෂික බෝග චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය

XVI. සුරතුර වැඩසටහන

## කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියේ ණය සංරචකය 1998 දෙසැම්බර් මස අවසන් විය. එසේ වුවද, ණය ආපසු අය කර ගැනීම අධීක්ෂණය කිරීම, ණය ඇප ආවරණ අයදුම්පත් සම්බන්ධව කටයුතු කිරීම සහ 1999 වර්ෂයේදී සහභාගිත්ව ණය දෙන ආයතන විසින් කරන ලද ණය මුදා හැරීම් වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදල් ප්‍රතිපූරණය කර ගැනීම ආදී කටයුතු මහ බැංකුව විසින් නොකඩවා සිදු කරන ලදී. ව්‍යාපෘතිය අවසන් වනවිට සියයට 94.4 ක ණය උපයෝජන අනුපාතයක් වාර්තා කරමින් ණය මුදල් 6,579 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 645.9 ක මුදලක් (දළ වශයෙන් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11.9 ක්) ප්‍රතිමූල්‍ය වශයෙන් මුදා හැර තිබුණි.

ව්‍යාපෘතිය මගින් සපයන ලද පහසුකම් යටතේ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සාමාන්‍ය ඵලදාව සහ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම තුළින් තේ අංශයේ සමස්ථ ප්‍රගතිය වර්ධනය වූ බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් පත් කරන ලද උපදේශකයන් දෙදෙනෙකු විසින් සිදු කරන ලද ඵලදායිතා අධීක්ෂණ හා ඇගයීම් සමීක්ෂණයක් මගින් වාර්තා විණි.

1999 දී සියයට 90 ක සතුටුදායක ණය ආපසු අය කර ගැනීමේ අනුපාතයක් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනිමින් තිබුණි.

## තේ සංවර්ධන ව්‍යාපෘතිය

තේ අංශයට ණය ලබා දීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආරම්භ කරන ලද තේ සංවර්ධන ව්‍යාපෘතිය කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියේම තවත් පියවරකි. 1999 ජූනි මස සිට වසර 6 ක කාලයක් සඳහා තේ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වි.ගැ.හි. දශ ලක්ෂ 26.326 ක ආධාර මුදලක් ලබා ගැනීමට 1999 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා රජය ආසියානු සංවර්ධන බැංකුව සමග ණය ගිවිසුමකට එළඹෙන ලදී.

තිරසාර පදනමකින් කුඩා තේ ඉඩම් හිමියන්ගේ ආදායම ඉහළ නැංවීම හා තේ වගා කරන ප්‍රදේශවල ස්වභාවික පරිසරය වර්ධනය කිරීම ව්‍යාපෘතියේ පුළුල් අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය පහත දැක්වෙන පරිදි ප්‍රධාන අංග 4 කින් සමන්විත වේ.

1. ආයතනික අංශය ප්‍රතිසංවිධානය සහ ශක්තිමත් කිරීම
2. තේ සංවර්ධනය
3. සමාජ යටිතල පහසුකම් හා වන වගාව
4. ව්‍යාපෘති කළමනාකරණය

ව්‍යාපෘතියේ ණය සංරචකය වූ වි.ගැ.හි. දශ ලක්ෂ 15.4 ක මුදල, සහභාගී වන ණය දෙන ආයතන විසින් උප ණයකරුවන්ට ප්‍රදානය කරනු ලබන උප ණය මුදල් ප්‍රතිමූල්‍යකරණය කිරීම සඳහා යොදා ගනු ලැබේ. පහත සඳහන් කටයුතු සඳහා ව්‍යාපෘතිය ණය අරමුදල් සපයනු ලැබේ.

1. තේ නැවත වගාව
2. තවාන් පිහිටුවීම
3. තේ කර්මාන්තශාලා පුනරුත්ථාපනය හා නවීකරණය
4. වාහන මිලදී ගැනීම සහ අමු දළු එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම

තේ සංවර්ධන ව්‍යාපෘතියේ සුවිශේෂ ලක්ෂණයක් වනුයේ ව්‍යාපෘතීන් සඳහා දිගු කල් පිරීමේ කාලයක් ලබා දීමේ සහ ණයකරුවන්ගේ මුදල් ප්‍රවාහ ගැටළුවලට සහනයක් සැලසීමේ අරමුණින් දීර්ඝ කරන ලද ණය කල් පිරීමේ කාලයක් ලබා දීමයි.

ඒ අනුව, ණය කල් පිරීමේ කාලසීමාව පහත අයුරින් වේ.

* තේ නැවත වගාව සඳහා - උපරිම සහන කාලය අවුරුදු 7 ක් සමග අවුරුදු 17 කි.
* කර්මාන්තශාලා පුනරුත්ථාපනය සහ තවාන් සංවර්ධනය සඳහා - උපරිම සහන කාලය අවුරුදු 5 ක් සමග අවුරුදු 10 කි.
* ප්‍රතිමූල්‍යකරණයේදීද සහභාගී වන මූල්‍ය ආයතනවලට සමාන ණය කල් පිරීමේ කාලයක් ලබා දෙනු ලැබේ.

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී සහභාගී වන ණය දෙන ආයතන විසින් ණය මුදල් 55 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 95 ක ණය මුදලක් අනුමත කර තිබූ අතර ණය මුදල් 35 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 36 ක මුදලක් මුදා හැර තිබුණි.

## පළමුවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය

උක්ත ව්‍යාපෘති දෙක සම්බන්ධ ණය ආපසු අයවීම් අධීක්ෂණය කිරීම, ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීම, රැස්වීම් කැඳවීම, උප ණයකරුවන් සමග ලිපි ගණුදෙනු පැවැත්වීම, ණය ඇප ආවරණ වාරික මුදල් එකතු කිරීම සහ ණය ඇප ආවරණ අයදුම්පත් භාර ගැනීම යනාදිය 1999 වසර තුළදීද මහ බැංකුව විසින් අඛණ්ඩව කරගෙන යන ලදී. ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි කොනදේසිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇති, කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ ඉදිරිපත් කර තිබූ ඇප ආවරණ අයදුම්පත් සඳහා ඇප ආවරණ හිමිකම් ගෙවීම මෙම වසර තුළදී ආරම්භ විය. එවැනි අයදුම්පත් 22 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 3.7 ක මුදලක් මහ බැංකුව විසින් සහභාගී වන ණය දෙන ආයතන වෙත ගෙවන ලදී.

## දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

පළමුවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාප්තියක් වූ දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 1999 වසර අවසානයේදී පළමුවැනි වසර නිමා කරන ලදී. උතුරු නැගෙනහිර ප්‍රදේශ හැර දිවයිනේ අනෙකුත් ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය 2004 වසරේදී අවසාන වීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක පහකින් සමන්විත වේ. එනම්; (අ) ණය අරමුදල් (ආ) ගොවිපල උපදේශක සේවා, අලෙවිකරණ කටයුතු හා තාක්ෂණික සේවා (ඇ) පර්යේෂණ කටයුතු (ඈ) බීජ හා රෝපණ ද්‍රව්‍ය (ඉ) ආයතනික කටයුතු නගා සිටුවීම වේ. ව්‍යාපෘතියේ ණය සංරචකය මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන අතර අනෙකුත් සංරචක මෙහෙයවනු ලබන්නේ කෘෂිකර්ම හා ඉඩම අමාත්‍යාංශය මගිනි.

බහුවාර්ෂික බෝග වගා කිරීම හා ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු සඳහා සහභාගී වන මූල්‍ය ආයතන හරහා මැදි හා දිගුකාලීන ණය ලබා දීම පිණිස ආසියානු සංවර්ධන බැංකුව මගින් වි.ගැ.හි. දශ ලක්ෂ 11.562 ක අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. ඒ අනුව, ඩීඑෆ්සීසී බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ලංකා වාණිජ බැංකුව හා සම්පත් බැංකුව යන සහභාගී වන මූල්‍ය ආයතන මගින් 1999 වසර අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 110 ක මුදල් ප්‍රමාණයක් මුද හැර ඇති අතර ඒ වෙනුවෙන් ප්‍රතිමූල්‍ය ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 78 ක මුදල් ප්‍රමාණයක් මහ බැංකුව වෙතින් ලබාගෙන ඇත.

ව්‍යාපෘතිය යටතේ අනුමත කළහැකි උපරිම ණය මුදල වන්නේ එ.ජ. ඩොලර් 150,000 කට සම වන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයකි. එ.ජ. ඩොලර් 50,000 කට සම වන රුපියල් ප්‍රමාණයක් දක්වා සහභාගී වන මූල්‍ය ආයතනයන්ට ණය මුදල් අනුමත කළහැකි අතර එම ප්‍රමාණය ඉක්මවන ණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබාගත යුතුය. එක් එක් උප ව්‍යාපෘතියේ ස්වභාවය අනුව උපරිම වශයෙන් වසර 6 ක සහන කාලයක්ද ඇතුළුව වසර 12 ක ආපසු ගෙවීමේ කාලයක් සඳහා මෙම ණය අනුමත කළහැකි වේ. ණය මුදලක ආපසු ගෙවීමේ කාලය තීරණය කිරීමේදී, සහභාගී වන මූල්‍ය ආයතන විසින්, මුදල් ප්‍රවාහ ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි මූල්‍යකරණය කරනු ලබන ව්‍යාපෘතියෙහි ආර්ථිකමය ආයු කාලය, උප ණයකරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව, බෝග සඳහා නිර්දේශිත සහන කාලය යනාදී කරුණු සැළකිල්ලට ගත යුතුය.

විමර්ශනයට භාජනය වන වසර තුළදී, ව්‍යාපෘතියේ සහභාගී වන මූල්‍ය ආයතනයක් වශයෙන් ලංකා බැංකුව ඇතුළත් කර ගැනීම ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදී. ඒ අනුව, 1999 අවසාන වනවිට ව්‍යාපෘතියේ ණය දීමේ කටයුතු සඳහා සහභාගී වන මූල්‍ය ආයතන සංඛ්‍යාව 6 දක්වා වැඩි විය. තවද, දනට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ සපයනු ලබන ගොවිපල ව්‍යාප්ති සේවා, අලෙවි හා තාක්ෂණික සේවා කටයුතු පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමේ අදහසින් යුතුව ආසියානු සංවර්ධන බැංකුව තාක්ෂණික සහාය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. මෙම යෝජනාව මුල් වරට ලංකාවේ ගොවීන්ට ගෙවීමේ පදනම මත පෞද්ගලික අංශයෙන් ව්‍යාප්ති සේවා ලබා ගැනීමට අවස්ථාව ලබා දීමක් වශයෙන් දක්විය හැකිය.

## බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය

1997 වසර අවසාන වනවිට නිම වූ පළමුවැනි බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද ණය මුදල්වල මුද හැරීමට ඉතිරිව තිබූ ණය වාරික වෙනුවෙන් සහභාගී වන මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය සැපයීම පිණිස මෙම චක්‍රීය අරමුදල් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ සඳහා අරමුදල් සැපයෙනුයේ පළමුවැනි ව්‍යාපෘතිය යටතේ එකතු වන ණය ආපසු අයවීම් වලිනි. මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් රජය සමග ණය ගිවිසුමක් 1999 මාර්තු 15 දින අත්සන් කරන ලදී. ඉන් අනතුරුව, එම අරමුදල් වලින් ප්‍රතිමූල්‍ය ණය සැපයීමට හැකි වන පරිදි සහභාගී වන මූල්‍ය ආයතන සමග උප ණය ගිවිසුම්ද අත්සන් කරන ලදී. මේ යටතේ 1999 වසර අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 39 ක මුදල් ප්‍රමාණයක් ප්‍රතිමූල්‍ය ණය වශයෙන් සහභාගී වන මූල්‍ය ආයතන සඳහා මුද හැර ඇත. මෙම ණය යෝජනා ක්‍රමය සඳහාද පළමු ව්‍යාපෘතියේ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.

## දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සම්පාදිත දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1992 දී ආරම්භ කරන ලදුව 1999 දෙසැම්බර් මාසයේදී අවසන් වීමට නියමිතව තිබුණි. එසේ වුවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කරන ලද අරමුදලේ ඉතිරිව ඇති ශේෂය උපයෝජනය කිරීම සඳහා ව්‍යාපෘති කාලසීමාව 2000 ජූනි මස 30 දක්වා දීර්ඝ කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ, දකුණු පළාතෙහි රැකියා අවස්ථා සහ ආදායම් මාර්ග පුළුල් කිරීමෙන් සහ ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් එම ප්‍රදේශයේ වැසියන්ගේ ආදායම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි.

ව්‍යාපෘතියේ ණය සංරචකය සඳහා මුළු වෙන් කිරීම් රුපියල් දශ ලක්ෂ 466 ක් (වි.ගැ.හි.දශ ලක්ෂ 6.4 ක්) වේ. ඉන් රුපියල් දශ ලක්ෂ 369 ක් නැතහොත් සියයට 79 ක් සැළසුම් ක්‍රියාත්මක කිරීමේ සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් මේ දක්වා ප්‍රතිමූල්‍ය ණය සැපයීම සඳහා මහ බැංකුව වෙත සපයා ඇත. එම අරමුදල් මහ බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ණය ප්‍රතිමූල්‍ය කිරීම සඳහා සහභාගිත්ව ණය දෙන ආයතන වෙත මුදා හැර ඇත. මුළු වෙන් කිරීම්වල ශේෂය ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා වන සුළු පරිමාණ ණය වෙනුවෙන් ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා සණස සංවර්ධන බැංකුවට වෙන් කර ඇත.

ව්‍යාපෘතිය යටතේ උප ණය සහ ප්‍රතිමූල්‍ය ණය සඳහා පොලී අනුපාතයන් 1999 වසරේදීද පිළිවෙලින් සියයට 14 ක් සහ සියයට 6 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. 1999 වසර අවසානය දක්වා සහභාගිත්ව ණය දෙන ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 353 ක මුදලක් මහ බැංකුව විසින් මුදා හරින ලදී. මහ බැංකුව විසින් මේ දක්වා මුදා හල සහ දැනට මුදා හරිමින් පවත්නා ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය එක්ව ගත් කල එහි ප්‍රතිශතය අමාත්‍යාංශය විසින් මහ බැංකුව වෙත නිකුත් කරන ලද මුළු අරමුදලින් සියයට 100 කට ආසන්න වේ. සහභාගිත්ව ණය දෙන ආයතනය වශයෙන් මුදා හරින ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 399 ක් වූ අතර, ඉන් සියයට 20 ක් එම ආයතනවල අරමුදල් වලින් මූල්‍යකරණය කරන ලදී. ව්‍යාපෘතියේ මුළු කාලච්ඡේදය තුළ රුහුණ සංවර්ධන බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව 7,400 ක පමණ ණය ප්‍රමාණයක් මුදා හරිමින් ක්‍රියාකාරී ලෙස මෙම ණය වැඩපිළිවෙලට සහභාගී වී ඇත. මුළු ණය ප්‍රමාණයෙන් සියයට 85 ක්ම නිකුත් කරන ලද්දේ රුහුණ සංවර්ධන බැංකුව විසිනි. ණය සංඛ්‍යාව අනුව සලකන කල මුළු ණය වලින් සියයට 98 ක්ම එම බැංකුව විසින් මුදා හරින ලද ණය වන අතර, නිකුත් කරන ලද ණය සියල්ලක්ම වාගේ සුළු පරිමාණ ණය බව එයින් පිළිබිඹු වේ.

## වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන සැලසෙන වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය, සිය 6 වන වර්ෂය 1999 දී සම්පූර්ණ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වය වශයෙන් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1.8 ක් (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 108 ක් පමණ) වෙන් කර ඇත. ව්‍යාපෘතියේ ණය සංරචකය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික වගා ළිං ඉදි කිරීම, උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති ආරම්භ කිරීම සහ වයඹ පළාතේ ග්‍රාමීය කාන්තාවන්ගේ ආදායම් උත්පාදන ස්වයං රැකියා ඇරඹීම වශයෙන් අංග තුනකින් සමන්විත වේ. අද වයඹ සංවර්ධන බැංකුව වශයෙන් තිබෙන, ආරම්භයේදී කුරුණෑගල හා පුත්තලම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ව්‍යාපෘතිය ආරම්භයේ සිටම සහභාගී වන ණය දෙන ආයතන වශයෙන් සිටි අතර, පසුව 1996 වසරේදී මහජන බැංකුව හා ලංකා බැංකුවද ඒ සඳහා ඇතුළත් කර ගන්නා ලදී.

1999 ජූනි මාසයේදී ණය යෝජනා ක්‍රමය අවසන් වීමට නියමිතව තිබූ නමුත් එහි සතුටුදායක ප්‍රගතිය සලකා බැලූ ආසියානු සංවර්ධන බැංකුව, ණය යෝජනා ක්‍රමය තවත් වර්ෂයකින් එනම් 2000 ජූනි මාසය දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දුන්නේය.

1999 වර්ෂය අවසාන වනවිට කෘෂිකාර්මික වගා ළිං 918 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 31 ක්ද, කාන්තා ස්වයං රැකියා 3,201 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 74 ක්ද වශයෙන් සහභාගී වන ණය දෙන බැංකු මාර්ගයෙන් ණය මුදා හැර ඇති අතර, 1996 අග භාගයේදී ක්‍රියාත්මක වීම ඇරඹුණු උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති 148 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 4 ක්ද ලබා දී ඇත.

1999 වර්ෂය අවසාන වනවිට සහභාගී වන ණය දෙන ආයතන සඳහා සමුච්චිත වශයෙන් රුපියල් දශ ලක්ෂ 100 ක් මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය වශයෙන් මුදා හැර ඇත.

## ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සම්පාදිත උතුරුමැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සම්පාදිත සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සම්පාදිත උතුරුමැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සම්පාදිත උතුරුමැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය පිළිවෙලින් 1996 දී හා 1997 දී ආරම්භ කරනු ලැබිණ. අනුරාධපුරය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ගොවි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම තුළින් දිළිඳුකම තුරන් කිරීම මෙම ව්‍යාපෘතීන් දෙකෙහිම අරමුණ වේ.

මහ බැංකුව ව්‍යාපෘති දෙකෙහිම ණය සංරචකයන් මෙහෙයවීමේ ප්‍රධානතම සම්බන්ධීකරණ ආයතනය ලෙස කටයුතු කරන අතර, අනුරාධපුර බැංකු ප්‍රාදේශීය කාර්යාලය

මගින් එම ණය ව්‍යාපෘතීන් මෙහෙයවනු ලැබේ. කළමනාකාරිත්වය විසින් සැළසුම් කල පරිදි මෙම ව්‍යාපෘතීන් යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන විසින් සිය ආයතනයන්හි අරමුදලින් ණය නිකුත් කරනු ඇතැයි බලාපොරොත්තු වුවද, එසේ අපේක්ෂිත පරිදි ණය නිකුත් කිරීමක් සිදු නොවීය. එමනිසා ව්‍යාපෘතිය ආරම්භයේ සිටම මේ දක්වා නිකුත් කළ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.6 ක් පමණක් විය. ණය නිකුත් කිරීම් සම්බන්ධ මෙම දුර්වල ක්‍රියාකාරිත්වය විමර්ශනයට ලක් කළ ආසියානු සංවර්ධන බැංකු උපදේශක කමිටුව විසින් මෙම සහභාගිත්ව ණය දෙන ආයතන සඳහා ප්‍රතිමූල්‍ය සැපයීම අවශ්‍ය බව සිය වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. ඒ අනුව 1999 දී ජාතික සංවර්ධන භාරකාර අරමුදලින් ප්‍රතිමූල්‍ය සඳහා අරමුදල් සැපයීමට ඇති හැකියාව සොයා බලන ලදුව ඒ සම්බන්ධව පැවති සාකච්ඡා බොහෝදුරට සාර්ථක විය. ඒ අනුව ජාතික සංවර්ධන භාරකාර අරමුදලින් ප්‍රතිමූල්‍ය සැපයීමේ කටයුතු යථා කාලයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

## නාගරික පරිසර පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මෙහෙයවීමේ ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස ක්‍රියා කරන මහ බැංකුව විසින් 1999 මුල් අවධියේදී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලදී. අංක 383 එච්.ජී.006 දරණ නිවාස ඇප ආවරණ ණය ක්‍රමය යටතේ ඇමෙරිකාවේ පුද්ගලික අංශය මගින් සපයන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 4 ක ණය මුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ඇති අතර, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකානු නියෝජිත ආයතනය (USAID) එම ණය සඳහා ඇපකාරත්වය සපයා ඇත. රට පුරා විශේෂයෙන් නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල පරිසර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මැදිහත් වීමට පෞද්ගලික අංශය දිරි ගැන්වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි.

සුදුසු උප ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීමට මෙම ව්‍යාපෘතියේ සහභාගිත්ව ණය දෙන ආයතන වශයෙන් සණස සංවර්ධන බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව යන ආයතනයන් බඳවාගෙන ඇත. පානීය ජලය සැපයීම, සනීපාරක්ෂක තත්ත්වයන් ඉහළ නැංවීම, කැලිකසල කළමනාකරණය ආදී කටයුතු සඳහා සණස ප්‍රාථමික සමිති මගින් ජනතාවට ණය සැපයීම සණස බැංකුවෙන් අපේක්ෂා කෙරේ. අනෙක් අතට, පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විශාල පරිමාණයේ කසල කළමනාකරණ ව්‍යාපෘතීන් සඳහා ණය මුදල් සැපයීම ජාතික සංවර්ධන බැංකුව මගින් අපේක්ෂා කෙරේ.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු නිම කරන ලදී. සණස ප්‍රාථමික සමිතිවල සිටින, ණය ලැබීම සඳහා සුදුසු සාමාජිකයින් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතා තීරණය කොට එම ණය අවශ්‍යතාවන්ට අදළ උප ව්‍යාපෘති වාර්තාවන් කිහිපයක් සණස සංවර්ධන බැංකුව විසින් පිළියෙල කරන ලදී. මහ බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රාදේශීය සහා කිහිපයක නිලධාරීන් සහ ප්‍රදේශ කිහිපයක ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

## සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන (ඉසුරු) ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අනුග්‍රහයෙන් පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6.7 ක ණය මුදලක් සහ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 6.6 ක ආධාර මුදලක්ද, ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස එ.ජ. ඩොලර් දශ ලක්ෂ 4.1 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින්ද දරමින් ගාල්ල, මාතර, මහනුවර හා පුත්තලම දිස්ත්‍රික්කවල "දිළිඳුකම පිටු දැකීමේ නියමු ව්‍යාපෘතියක්" ලෙස 1990 දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සිය පරමාර්ථ කරා ළඟා වීමේ ක්‍රමවේදය ලෙස උපයෝගී කර ගත්තේ අවම පිරිවැයක් යටතේ ණය සැපයිය හැකි "ස්වඋපකාරක කණ්ඩායම්" සංකල්පයයි. අරමුණු ඉටු කර ගැනීමේ උපක්‍රමයක් ලෙස "කණ්ඩායම් සංකල්පය" වඩා ඵලදායී ලෙස ගණුදෙනු කරුවන් සහ බැංකුව අතර සම්බන්ධතාවය තහවුරු කරන බවත්, ඒ තුළින් මූල්‍ය පහසුකම්වලට අමතරව ප්‍රතිලාභීන්ට අවශ්‍ය වන්නාවූ උපදෙස් සහ මග පෙන්වීමේ හැකියාව ලැබෙන බවත් ව්‍යාපෘතියේ විශ්වාසයයි. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආයතනය ලෙස කටයුතු කරයි. ව්‍යාපෘතිය සැළසුම් කරන ලද අවස්ථාවේ අපේක්ෂිත ඉලක්කවලට එළඹීමෙන් අනතුරුව 1997 දෙසැම්බර් මස අවසානයේදී ව්‍යාපෘතියට ලැබුණු විදේශීය අරමුදල් නවතා දැමුවද, ණය ගිවිසුමෙහි කොන්දේසිවලට එකඟව චක්‍රීය අරමුදල උපයෝගී කර ගනිමින් 1998 වසර තුළදී මෙන්ම 1999 වසර තුළදීද ව්‍යාපෘතිය සිය කටයුතු අඛණ්ඩව මෙහෙයවීය.

1999 වසර අවසන් වනවිට දිස්ත්‍රික්ක හතර තුළ ව්‍යාපෘතිය මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ආවරණය කරන ලද ගම්මාන සංඛ්‍යාව 2,397 ක් වන අතර, ගොඩනගන ලද "ස්වඋපකාරක කණ්ඩායම්" සංඛ්‍යාව 9,234 කි. ව්‍යාපෘතිය සැළසුම් කිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 32,000 ක් වුවද, මෙම කණ්ඩායම් තුළින් ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 55,898 ක් විය. මෙහිදී සඳහන් කළයුතු සුවිශේෂ ලක්ෂණය වන්නේ මුළු ප්‍රතිලාභීන්ගෙන් සියයට 68 ක් වූ 38,140 ක්ම සමන්විත වන්නේ කාන්තා සහභාගිත්වයෙනි. 1999 වසර අවසන් වනවිට ප්‍රතිලාභීන් 49,835 දෙනෙකුගේ ආදායම් උත්පාදන ස්වයං රැකියා මූල්‍යනය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 477 ක මුදලක් සුළු ණය වශයෙන් ව්‍යාපෘතිය මගින් ලබා දී ඇත. ණය මුදලක සාමාන්‍යය රුපියල් 9,579 ක් වූ අතර, වසර මුළුල්ලේම පවත්වාගෙන ගිය ආපසු අය කිරීමේ අනුපාතය සියයට 94 කි. මීට අමතරව ව්‍යාපෘතියෙහි ඉතිරි කිරීම් රාශීකරණ යෝජනා ක්‍රමය යටතේ 1999 අවසානයේදී ප්‍රතිලාභීනගේ කණ්ඩායම් ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල්

දශ ලක්ෂ 63 ක් විය.

1999 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම සඳහා චක්‍රීය අරමුදලට රැස් කළ ණය ආපසු අය කිරීම් භාවිතා කළ අතර ව්‍යාපෘතියේ පරිපාලන හා පුහුණු කිරීම් වියදම් සපුරා ගනු ලැබුවේ අතිරේක අරමුදල් ආයෝජනයෙන් ලත් පොලී ආදායමෙනි.

1997 වසර අවසන් වනවිට ව්‍යාපෘතියේ ණය ලබා දීමට හා අනෙකුත් උපකාරක සේවා සැපයීම පිණිස පිහිටුවන ලද කුඩා ස්ව උපකාරක කණ්ඩායම් අත්දකීම් සහිතව පරිණත භාවයට පත් වී තිබූ අතර ව්‍යාපෘති කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රතිලාභීන්ගේ තිරසර බව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට හැකි වන පරිදි කණ්ඩායම් ක්‍රමය ආරක්ෂා කර ගනිමින්ම එම කණ්ඩායම් ඒකරාශී කොට සමිති ආඥා පනත යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීම් සහිත ස්වාධීන ආයතන වශයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වූ "ඉසුරු සංවර්ධන සමිති" පිහිටුවන ලදී. 1999 වසර අවසන් වනවිට දිස්ත්‍රික්ක හතර තුළ මෙවැනි සමිති 177 ක් පිහිටුවනු ලැබූ අතර මෙම සමිති ඒකාබද්ධ කරමින් දිස්ත්‍රික්ක හතරට අදාළව "දිස්ත්‍රික් ඉසුරු සංවර්ධන සමිති මහා සංගම්" හතරක් පිහිටුවීමටද ව්‍යාපෘතිය සමත් විය. මෙම මහා සංගම් රාජ්‍ය නොවන සංවිධාන ලෙස සමාගම් ආඥා පනතේ 21 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පියවර ගෙන තිබෙන අතර වසර අවසන් වනවිට සාමාජිකයින්ට නිකුත් කර ඇති කොටස් ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 4.1 කි. රාශීකරණය කර ඇති මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10.6 ක් වන අතර සමිති අරමුදල් භාවිතා කර සාමාජිකයින්ට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 30.7 කි. ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ ඉතිරි කිරීමේ සහ ණය දෙන සමිති ලෙස අද සිය කටයුතු මෙහෙයවන මෙම ඉසුරු සංවර්ධන සමිති වඩා පරිණත වීමත් සමගම අනාගතයේදී විධිමත් වූ බැංකු කටයුතු කරන ආයතන බවට පත් වනු ඇත.

### දිළිඳුකම පිටු දැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය (ජපන් මිත්‍රත්ව ඉසුරු ණය ව්‍යාපෘතිය)

දිළිඳුකම පිටු දැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජයත්, "ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා බැංකුවත්" අතර 1999 අගෝස්තු 04 වැනි දින ගිවිසුමකට එළඹුණි. දැනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගාල්ල, මාතර, පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කවල සාර්ථකව ක්‍රියාත්මක කරන ඉසුරු ව්‍යාපෘතියෙහි ක්‍රමවේදය අනුගමනය කරමින් විධිමත් මූල්‍ය ආයතන වලින් මූල්‍ය පහසුකම් ලබාගත නොහැකි, එවැනි පිළිගැනීමක් නොමැති, දිළිඳු ජනතාව සඳහා අවම පිරිවැයකින් සහ වැඩි කාර්යක්ෂමතාවයකින් වඩා ඵලදායී ලෙස ණය පහසුකම් සැපයීමට හැකි ක්‍රමවේදයක් ගොඩ නැගීම මෙහි මූලික පරමාර්ථය වේ. මේ තුළින් දිළිඳු ජනතාවගේ ආර්ථික සහ සමාජයීය තත්ත්වය ඉහළ නැංවීමත්, ඔවුන්ගේ සමාජ සුභසාධනය දියුණු කිරීමත්, එමගින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට ඔවුන් සහභාගී කරවා ගැනීමත් අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භක පියවර ලෙස බදුල්ල, නුවරඑළිය, මාතලේ, කළුතර, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තෝරාගෙන ඇත. දිස්ත්‍රික්ක තෝරා ගැනීමේ පදනම වූයේ දුර්වල සමාජ-ආර්ථික තත්ත්වයන් යටතේ ජීවත් වන දිළිඳු ජනතාව බහුලව වාසය කරන ප්‍රදේශ වීමයි.

ඇස්තමේන්තුගත සමස්ථ ව්‍යාපෘති පිරිවැය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12.4 කි (රු.ද.ල. 821 කි). මේ සඳහා ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව එ.ජ. ඩොලර් දශ ලක්ෂ 9.68 (රුපියල් දශ ලක්ෂ 640) ක් සපයන අතර ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2.74 (රුපියල් දශ ලක්ෂ 181) ක දායකත්වයක් දරනු ඇත. ව්‍යාපෘතියේ ණය දීම, පුහුණු කටයුතු, තාක්ෂණික සේවා සැපයීම සහ ව්‍යාපෘති පරිපාලන කටයුතු සඳහා මෙම මුදල් වැය කිරීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ පිහිටුවනු ලබන මධ්‍යම ව්‍යාපෘති කාර්යාලයකින් සහ අදාළ දිස්ත්‍රික්කවල පිහිටුවනු ලබන දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාල වලින් ව්‍යාපෘති පරිපාලනය සමන්විත වේ. ආරම්භක අවස්ථාවේදී සහභාගිත්ව මූල්‍ය ආයතන ලෙස අදාළ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සංවර්ධන බැංකු කටයුතු කරන අතර, ව්‍යාපෘතියේ කොන්දේසි සහ ක්‍රියා පරිපාටිවලට අනුකූලව කටයුතු කළහැකි අනෙකුත් සංවර්ධන බැංකුවලටද සහභාගිත්ව මූල්‍ය ආයතන ලෙස කටයුතු කිරීමට පසුව ඉඩ දෙනු ලැබේ.

### ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මහ බැංකුව මගින් 1997 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ක්‍රමය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතනවලට කෘෂි බෝග නිෂ්පාදනය, කෘෂි නිෂ්පාදන ගබඩා කිරීම, ආහාර සැකසීම, සත්ව පාලන හා කිරි නිෂ්පාදන කටයුතු සහ කෘෂි නිෂ්පාදන අලෙවිකරණ කටයුතු සඳහා ණය මුදා හැරීමට අරමුදල් සපයනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ මූල්‍ය සහාය ලබාගත හැක්කේ සමූපකාර සමිති, ගොවි සංවිධාන හා එවැනි සංවිධානයන්හි සාමාජිකයින් වෙත පමණි. ව්‍යාපෘතිය යටතේ 1999 වර්ෂ අවසානයේ උප ව්‍යාපෘති 19 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 19 ක් මුදා හැර ඇත.

### කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය වනාහී 1995 දී නිම කරන ලද කෑගල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කිරීමකි. එමනිසා අභිනව ව්‍යාපෘතිය ඊට අවශ්‍ය අරමුදල් සපයා ගත්තේ කෑගල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ණය මුදල්වල ආපසු අය කර ගැනීම් වලිනි. සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අයත් ඒකාබද්ධ ග්‍රාමීය

සංවර්ධන ව්‍යාපෘතියේ දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලය ව්‍යාපෘතියේ වෙනත් කටයුතුවල නිරතවුණු අතර මහ බැංකුව ප්‍රතිමූල්‍ය සපයන නියෝජිතයා ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නව ක්‍රමෝපාය මාර්ගයන් දෙකක් භාවිතයට ගැනිණි. ප්‍රථමයෙන් ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් 15 ක් මුදල් ගෙවීමේ පදනම යටතේ පත් කැරිණි. මෙම නිලධාරීහු සහභාගිත්ව ණය දෙන ආයතනවල ව්‍යාපෘති අලෙවියට උදව් කිරීම, සුදුසු ණයකරුවන් හඳුනා ගැනීම, ව්‍යාපෘති යෝජනා සකස් කර දීම, බැංකුවලට ඔවුන් සම්බන්ධ කර දීම, ක්ෂේත්‍ර අධීක්ෂණය සහ විමර්ශනයන් පැවැත්වීම යනාදී කාර්යවල නියුක්ත වූහ. ව්‍යාපාර සංවර්ධන නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම නිසා සහභාගිත්ව ණය දෙන ආයතනවලට නොකඩවා ණය ඉල්ලුම්පත්‍ර ලැබීමේ ප්‍රවාහයක් ඇති විය.

දෙවනුව රුපියල් 50,000/- කට වැඩි ණය මුදල් අනුමත කිරීමට සහ ඇගයීම සඳහා මහ බැංකුවේ සහභාගිත්ව ණය දෙන ආයතනයන්ගේ සහ දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලයේද නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යාපෘති ඇගැයීමේ කමිටුවක් පත් කැරිණ. මෙම ක්‍රියා මාර්ග දෙක නිසා ව්‍යාපෘති කටයුතු මැනවින් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය.

1999 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 100 ක වටිනාකමින් යුක්ත උප ව්‍යාපෘති 2,500 ක් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයා තිබුණි. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉලක්ක කණ්ඩායම් වෙත ලබා දී ඇති සම්පූර්ණ ණය මුදල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 57 ක් විය. ඇතැම් සහභාගිත්ව ණය දෙන ආයතන සියයට 97 ක පමණ ඉහළ ණය ආපසු අය වීම් අනුපාතයක් වාර්තා කර තිබූ අතර සියයට 90 ක සමස්ත ණය ආපසු අය වීමේ අනුපාතයක් පවත්වා ගැනීමට ව්‍යාපෘතිය සමත් විය.

## සුරතුර ණය යෝජනා ක්‍රමය - සුළු ව්‍යවසායක ණය මගින් ස්වයං රැකියා ප්‍රවර්ධනය

සුරතුර ණය යෝජනා ක්‍රමය යටතේ වූ පළමු අදියර 1996/97 දී නිමාවට පත් විය. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර 1997/98 දී ආරම්භ වී 1999 පුරා ක්‍රියාත්මක කෙරුණි. මෙම දෙවන අදියර යටතේ සුළු මුදල් ව්‍යාපෘතීන් හෙවත් ආදායමක් උපදවන කාර්යයන්හි යෙදීම සඳහා විශේෂයෙන් රැකියා විරහිත උගත් යෞවනයන්ට ණය පහසුකම් ලබා දීමට සහභාගිත්ව ණය දෙන ආයතනයන් විසින් තමන්ගේ අරමුදල් ලබා දෙන ලදී. වාර්ෂික ණය දීමේ පොලී අනුපාතය සියයට 10 ක මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා රජය විසින් සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට සියයට 10 ක වාර්ෂික පොලී සහනාධාරයක් ගෙවන ලදී. විමර්ශනයට භාජනය වූ වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 614 ක වටිනාකමකින් යුතු දිවයින පුරා පිහිටි උප ව්‍යාපෘති 16,433 ක් සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ අරමුදල් ලබා දී තිබේ. සුළු ව්‍යාපෘතීන් සඳහා ණය පහසුකම්වලට පවත්නා වැඩි ඉල්ලුම සලකා මෙම ව්‍යාපෘතිය යටතේ සැපයිය යුතු ණය ඉලක්කය 1999 ඔක්තෝබර් මස රුපියල් දශ ලක්ෂ 1,000 සිට දශ ලක්ෂ 1,300 දක්වා වැඩි කෙරුණි.

ආපසු ගෙවීම්වලදී ණය වාරික 12 ක් හෝ ඊට වැඩියෙන් හිඟ හිටුවා ඇති ණයකරුවන් සම්බන්ධයෙන් හේතු සෙවීමේ සමීක්ෂණයක් පවත්වන ලදී. කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි පවත්වන ලද මෙම සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත දැනටමත් පරිගණකගත කරමින් පවතින අතර එම තොරතුරුවලට අදාළ මූලික සොයා ගැනීම්වලට අනුව ණය පැහැර හැරීමට හේතු වී ඇති ප්‍රධාන කරුණ වශයෙන් සැළකිය හැක්කේ ඉලක්කගත ණයකරුවන් හඳුනා ගැනීමේදී සිදු වී ඇති දුර්වලතාවයන්ය.

## මාතලේ දිස්ත්‍රික් ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය

දැනට ක්‍රියාත්මක වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සිය අත්දැකීම් පදනම් කරගෙන ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති යටතේ රජයේ නවතම හඳුන්වා දීම වූයේ මාතලේ දිස්ත්‍රික් ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතියයි. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවලට වඩා මෙම ව්‍යාපෘතියෙහි සුවිශේෂත්වය වන්නේ අදාළ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ක්‍රියාවලියට පුද්ගලික අංශයේ සහ ප්‍රජා සංවිධානවල දායකත්වය ලබා ගැනීම පිණිස අවධානය යොමු කර තිබීමයි. එමෙන්ම රජයේ නිලධාරීන් ව්‍යාපෘති කටයුතු වලින් ඉවත් වූ පසුවද ආර්ථික ප්‍රවර්ධන ක්‍රියාවලිය තුළින් ව්‍යාපෘතියේ දිගුකාලීන පැවැත්ම හා ව්‍යාපෘතියේ ස්ව-පැවැත්ම සහ තිරසාර බව අපේක්ෂා කෙරේ. රජය විසින් හඳුන්වා දුන් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රථම ව්‍යාපෘතිය 1999 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික්කය තුළ ආරම්භ විය. මෙම ව්‍යාපෘතියේ ණය සංරචකයෙහි මෙහෙයුම් ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි.

1999 මුල් භාගයේදී මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමට ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර කෘෂිකර්ම සංවර්ධන අරමුදල අත්සන් තැබූ අතර එමගින් වි.ගැ.හි. දශ ලක්ෂ 8.35 ක් ලබා දීමට කෘෂිකර්ම සංවර්ධන අරමුදලද, වි.ගැ.හි. දශ ලක්ෂ 2 ක් ලබා දීමට ශ්‍රී ලංකා රජයද එකඟ වී ඇත. මෙමගින් දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ලබා දීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතිය යටතේ ණය මුදා හැරීමේ කටයුතු කඳුරට සංවර්ධන බැංකුව මගින් සිදු කිරීමට අපේක්ෂා කරන අතර, ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු මාතලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයෙන් සිදු කිරීමට නියමිතය. එමෙන්ම තෝරා ගත් රාජ්‍ය නොවන සංවිධාන මෙහි සහභාගිත්ව ආයතන ලෙස කටයුතු කරනු ඇත.

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති පිළිබඳ සාරාංශයක් II-14 වැනි සංඛ්‍යා සටහන්හි දක්වේ.

## II - 14 වැනි සංඛ්‍යා සටහන
## ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන ණය යෝජනා ක්‍රම

| ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයනු ලබන ආයතන | ව්‍යාපෘතියේ පුළුල් අරමුණු | මූලිකව වෙන් කරන ලද ප්‍රතිපාදනය | ණය ගැනුම්කරුවන් සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය | 1999.12.31 දක්වා මුදාහැර ඇති ණය ප්‍රමාණය (රු.ද.ල.) | ණය ආපසු අයකර ගැනීමේ අනුපාතය (%) |
|---|---|---|---|---|---|---|
| 1. තේ සංවර්ධන ව්‍යාපෘතිය (1999-2005) | ආසියානු සංවර්ධන බැංකුව | තිරසාර පදනමක් මත කුඩා තේ වතු හිමියන්ගේ ආදායම ඉහළ නැංවීම සහ ව්‍යාපෘති ප්‍රදේශය තුළ පවත්නා ස්වාභාවික පරිසර තත්ත්වය වැඩිදියුණු කිරීම | එ.ජ.ඩොලර් දශලක්ෂ 17 | **නැවත වගාව සඳහා** බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය +2 (AWDR+2) **අනෙකුත් කාර්යයන් සඳහා** (AWDR+6) | 35.8 | ලැ.නො |
| 2. දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (1998-2004) | -එම- | බහුවාර්ෂික බෝග නිෂ්පාදනය සහ වාණිජකරණය ඉහළ නැංවීම, පැල තවාන් වැඩිදියුණු කිරීම පසු අස්වනු සැකසීම සහ එම බෝග අලෙවිකරණය වැඩිදියුණු කිරීම | එ.ජ.ඩොලර් දශලක්ෂ 15.685 | සාමාන්‍ය තැන්පතු අනුපාතිකය +2 | 110.3 | 65 |
| 3. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1992-1999) | -එම- | දකුණු පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම | එ.ජ.ඩොලර් දශලක්ෂ 8.1 | 14 | 399.3 | 85 |
| 4. වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (1993-2000) | -එම- | ව්‍යාපෘති බලප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ආර්ථික, සාමාජික සහ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම | එ.ජ.ඩොලර් දශලක්ෂ 2.7 | 14 | 108.7 | 90 |
| 5. උතුරුමැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1996-2002) සහ උතුරුමැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1997-2003) | ආ.සං.බැං.,කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය සහ ලෝක ආහාර වැඩසටහන | අඩු ආදායම්ලාභී පවුල්වල දිළිඳුබව නැති කිරීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය වැඩිකිරීම හා රැකියා අවස්ථා වැඩිකිරීම | රුපියල් දශලක්ෂ 153 රුපියල් දශලක්ෂ 43 | උපරිම 17 | 1.6 | ලැ.නො |
| 6. නාගරික පරිසර පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (1999-2001) | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමරිකානු නියෝජිතායතනය | පුද්ගලික අංශය මැදිහත් කර ගනිමින් පරිසර පවිත්‍රතාව ඉහළ නැංවීම | එ.ජ.ඩොලර් දශලක්ෂ 4 | 16 | 0.2 | ලැ.නො |
| 7. ඉඩම් නොමැති අය සහ සුළු ගොවීන් සඳහා වන ණය ව්‍යාපෘතිය (1990-2000) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය, ශ්‍රී ලංකා රජය | රැකියා අවස්ථාවන් වැඩිකිරීම සහ ඉතිරිකිරීම් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා වන ආර්ථිකමය වශයෙන් ලාභදායී තිරසාර සුළු ණය ක්‍රමයක් ඇති කිරීම | විශේෂ ගැනුම් හිමිකම් දශලක්ෂ 4.85 | කෘෂිකර්මය-16 අනෙකුත්-20 | 477.0 | 94 |
| 8. ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය (1997-2002) | ජපන් රජය | රට තුළ ආහාර නිෂ්පාදනය සහ ආහාර සැකසීමේ තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම | රුපියල් දශලක්ෂ 284 | 10 | 19.1 | ලැ.නො |
| 9. නව සපිරි ග්‍රාමීය ණය ව්‍යාපෘතිය (1986 සිට ඉදිරියට) | රජයේ පොලී සහනාධාරය සහිතව සහභාගිවන ණය දෙන ආයතනවල අරමුදල් | කෙටිකාලීන ආහාර බෝග වගා කරනු ලබන ග්‍රාමීය අංශයේ ගොවි ජනතාවගේ තත්ත්වය ඉහළ නැංවීම | - | 12 | 464 (98/99 මහ කන්නය සහ 99 යල කන්නය තුළ) | 84(සමස්ත) |
| 10. කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (1997-2007) | ශ්‍රී ලංකා රජය (චක්‍රීය අරමුදල) | ආදායම් උත්පාදන කටයුතු වැඩිදියුණු කිරීම තුළින් ව්‍යාපෘති බලප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | රුපියල් දශලක්ෂ 100 | 10 | 101.0 | 95 |
| 11. සුරතුර වැඩසටහන අදියර 2 (1998 සිට ඉදිරියට) | රජයේ පොලී සහනාධාරය සහිතව සහභාගිවන ණය දෙන ආයතනවල අරමුදල් | රැකියා විරහිත උගත් තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම තුළින් ඔවුන්ගේ ආදායම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | රුපියල් දශලක්ෂ 1,300 | 10 | 736.0 | ලැ.නො |
| 12. දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍ය කාලීන සුළු පරිමාණ ණය යෝජනා ක්‍රමය (ජපන් මිත්‍රත්ව ව්‍යාපෘතිය) (1999-2005) | ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජපන් බැංකුව | රැකියා අවස්ථාවන් වැඩිකිරීම සහ ඉතිරිකිරීම් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා වන ආර්ථිකමය වශයෙන් ලාභදායී තිරසාර සුළු ණය ක්‍රමයක් ඇති කිරීම | ජපන් යෙන් දශලක්ෂ 1,368 | වෙළෙඳපොළ පොලී අනුපාතික | - | ලැ.නො |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## මූල්‍ය වෙළඳපොළ

ණය වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තිමය පරිසරයක් ගොඩ නැගීමට ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය වෙළඳ පොල දෙපාර්තමේන්තුව හරහා ආධාර වේ. මූල්‍ය වෙළඳපොළේ කාර්යක්ෂම හා මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන්නාවූ යෝග්‍ය සානුබල හා ආයතනික ආධාර හඳුනා ගැනීමත්, ක්‍රියාකාරීත්ව හා නියාමක පද්ධතීන් වර්ධනය කිරීමත් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට ඇතුලත් වේ. දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයක් වන්නේ දනට ක්‍රියාත්මක වෙමින් පවතින මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදළ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීමත් මූල්‍ය ප්‍රතිසංස්කරණ සඳහා වගකිව යුතු මූල්‍ය අංශ ප්‍රතිසංස්කරණ කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කිරීමත්ය. ජාත්‍යන්තර මූල්‍ය අංශයට අදළව ක්‍රියාත්මක කරනු ලබන තාක්ෂණික ආධාර ව්‍යාපෘතිවලට අදළ කටයුතු කිරීමද දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයක් වේ.

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ, දෙපාර්තමේන්තුව කාර්යයන් රැසක් පිළිබඳව කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කාර්යයේ නියුක්ත විය. මෙයින් සමහර වැඩ කටයුතු පහත සඳහන් කර ඇත.

### ණය වර්ගීකරණ ආයතනය

මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයේ කොටසක් වශයෙන් ණය වර්ගීකරණ ආයතනයක් පිහිටුවාලීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.

ප්‍රථම ශ්‍රී ලංකා ණය වර්ගීකරණ ආයතනය වන සීමාසහිත ඩප් සහ පෙල්ප්ස් ක්‍රෙඩිට් රේටිං ලංකා සමාගම (ඩී.සී.ආර්. ලංකා) වර්ෂය තුළදී ආරම්භ කෙරිණ. ඩී.සී.ආර්.ලංකා සමාගම 1999 අගෝස්තු මාසයේදී පොදු සමාගමක් වශයෙන් සමාගම් පනත යටතේ ස්ථාපිත කළද ක්‍රියාකාරී ආයතනයක් ලෙස සිය කටයුතු ආරම්භ කරන ලද්දේ 1999 ඔක්තෝබර් මාසයේදීය. මෙම ඩප් සහ පෙල්ප්ස් ක්‍රෙඩිට් රේටිං සමාගම (අ.එ.ජ.), ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ බැංකු, අර්ථසාධක අරමුදල්, රක්ෂණ සමාගම් හා මූල්‍ය සමාගම් වැනි දේශීය මූල්‍ය ආයතන ගණනාවක් එක්ව පිහිටුවන ලද බද්ධ ව්‍යාපාරයකි. දනට රටවල් 50 කට වැඩි ප්‍රමාණයක ක්‍රියාත්මක වන ප්‍රධාන පෙලේ ලෝක ව්‍යාප්ත ඩප් සහ පෙල්ප්ස් ක්‍රෙඩිට් රේටිං සමාගම (ඩී.සී.ආර් - අ.එ.ජ) ශ්‍රී ලංකා ණය වර්ගීකරණ ආයතනයේ තාක්ෂණික කොටස් කරුවකුගේ කොටසද පරිපූරණය කරයි.

ඩී.සී.ආර්.ලංකාහි මූලික ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 35 කි. කොටස් කරුවන් සතු මුළු ප්‍රාග්ධන හිමිකම් ප්‍රමාණය ඩී.සී.ආර්.(අ.එ.ජ.), ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර පිළිවෙලින් සියයට 45 ක්, සියයට 20 ක් සහ සියයට 10 ක් ලෙස වෙන් විය. ඉතිරි සියයට 25 ක ප්‍රාග්ධන හිමිකම් ප්‍රමාණය දේශීය කොටස් කරුවන් එනම්, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, ඩී.එෆ්.සී.සී.බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාරත්ව අරමුදල, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ජාතික රක්ෂණ සංස්ථාව, සීමාසහිත යූනියන් ඇෂුවරන්ස් සහ සීමාසහිත සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම අතර සමසේ බෙදෙන ලදී. ඩී.සී.ආර්.ලංකාහි අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් තිදෙනෙකු ඩී.සී.ආර්. (අ.එ.ජ) ආයතනය විසින් නම් කර ඇත. ඩී.සී.ආර් (අ.එ.ජ) සහ ඩී.සී.ආර් ලංකා ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වර්ගීකරණ කමිටුවක් මගින් වර්ගීකරණය කරනු ලබන අතර මෙම ණය වර්ගීකරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනයට යටත් නොවේ.

"සමාගමක කොටස් කරුවන්ගේ අයිතිවාසිකම් හා වගකීම් දක්වෙන ප්‍රාග්ධන දයකත්වය හා කොටස් කරුවන්ගේ ගිවිසුම" 1999 ඔක්තෝබර් මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව ඩී.සී.ආර් ලංකා සහ ඩී.සී.ආර් (අ.එ.ජ) අතර "තාක්ෂණික ආධාර ගිවිසුම" සහ "වෙළෙඳ ලකුණු හා බලපත්‍රලාභී සංස්ථා නාම ගිවිසුම" මෙම වර්ෂය තුළදී අත්සන් කරන ලදී.

මෙම ණය වර්ගීකරණ සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළේ සමස්ත සංවර්ධනයේ වැදගත් කොටසක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. (විශේෂ සටහන 10 බලන්න)

### පත්‍ර රහිත රජයේ සුරැකුම් ක්‍රමය සහ තත්කාලීන දළ නිෂ්කාශන ක්‍රමය

භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පත්‍ර රහිත වෙළඳම් ක්‍රමයක් හා ස්වයංක්‍රීය නිෂ්කාශන ක්‍රමයක් 2000 වසර මුලදී හඳුන්වා දීමට මහ බැංකුව යෝජනා කර ඇත. මේ සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්, පද්ධති නිර්මාණ සහ පරිඝණක මෘදුකාංග වැඩි දියුණු කිරීමේ මූලික කටයුතු වර්ෂය තුළදී නිම කර, ඒවා පරීක්ෂණයට භාජනය කරමින් පවතී.

### ණය වෙළඳපොළ සංවර්ධනය සඳහා වූ බදු සානුබල

රාජ්‍ය සහ පෞද්ගලික ණය වෙළඳපොළ සංවර්ධනය උදෙසා පසුගිය වර්ෂ කීපය තුළදී බදු සානුබල රාශියක් ඉදිරිපත් කර තිබේ. ණය සුරැකුම් හා කොටස් ප්‍රාග්ධනය සඳහා දනට පවතින බදු සහනවල අසමානතාවයක් මග හැරීමද මෙම බදු ප්‍රතිසංස්කරණ යෝජනාවල තවත් අරමුණක් විය.

පහත සඳහන් වෙනස්කම් 1999 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

(අ) ණයකර, බැඳුම්කර සහ වාණිජ පත්‍ර වැනි කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත ණය උපකරණ

නිකුත් කිරීමේදී අය කරනු ලැබූ මුද්දර ගාස්තු අහෝසි කිරීම.

(ආ) භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් මත අය කරනු ලැබූ මුද්දර බද්ද ඉවත් කිරීම.

(ඇ) කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත ණය සුරැකුම්පත් වලින් ලැබෙන පොලිය මත අය කරනු ලැබූ රඳවා ගැනීමේ බද්ද ඉවත් කිරීම.

(ඈ) කොටස් බලපත්‍ර හා අනෙකුත් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත අය කරනු ලැබූ ප්‍රාග්ධන බද්ද අහෝසි කිරීම.

## නීති අනපනත් සම්පාදනය හා යෝජිත පනත්

1999 අංක 22 දරණ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සංශෝධිත පනත 1999 දී නීතිගත කෙරුණි. විශේෂිත ඉතිරි කිරීමේ බැංකුවක් වශයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට නියුක්ත විය හැකි කාර්ය පරාසය මෙම පනතෙහි සංශෝධන මගින් තීරණය කෙරේ. අක්‍රීය ගිණුම් ප්‍රාග්ධනීත කිරීම තුළින් බැංකුව සඳහා ප්‍රාග්ධන පදනමක් ලබා දීමත් ඒ සඳහා ඇති බාධා ඉවත් කිරීමත් යෝජිත සංශෝධන මගින් අපේක්ෂා කෙරේ.

වසර තුළදී පනත් හා විධිවිධාන කිහිපයක් කෙටුම්පත් කරනු ලැබූ අතර, ඒවා 2000 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අවසාන කිරීමට නියමිතය. කෙටුම්පත් කරනු ලැබූ පනත් හා විධිවිධාන පහත දක්වේ.

### (අ) 1949 අංක 58 දරණ මුදල් නීති පනත සංශෝධනය කිරීම

මිල ස්ථාවරත්වය ප්‍රධාන අරමුණ වන පරිදි මහ බැංකුවේ අරමුණු සංශෝධනය කරනු ලැබේ. මේ මගින් අරමුණු රාශියක් ඉටු කර ගැනීමට යාමේදී වන ප්‍රතිපත්තිමය ගැටුම් වළක්වාලීමට බලාපොරොත්තු වේ. අනෙකුත් යෝජිත සංශෝධන වලින් මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑම වැඩි වන ආකාරයට 'මුදල් සැපයුම' යන්නෙහි අර්ථ දක්වීම පුළුල් කිරීම සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා පවත්වාගෙන යාමේදී සිදු වන සමහර විෂමතා නැති කිරීම හා සම්බන්ධ වේ.

### (ආ) 1988 අංක 30 දරණ බැංකු පනත සංශෝධනය කිරීම

යෝජිත සංශෝධන මගින් මහ බැංකුවට ඇති අධීක්ෂණ සහ පාලන බලතල ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. බලපත්‍රලාභී ක්‍රියා මාර්ගයන් හා සම්බන්ධ වීම, බලපත්‍ර අවලංගු කිරීම, බැංකු ඒකාබද්ධ කිරීම, පාඩු ලබන බැංකු වසා දැමීම සහ බැංකු අධ්‍යක්ෂවරු හා උසස් කළමනාකාර තනතුරු සඳහා සුදුසුකම් නියම කිරීම, පත් කිරීම සහ ඉවත් කිරීම යන කටයුතු මේ සංශෝධනවලට අයත් වේ. මුදල් ගණුදෙනුවලට වඩා අනෙකුත් මූල්‍ය ව්‍යාපාරවල යෙදෙන ආයතන එනම්, ලියාපදිංචි මූල්‍ය ආයතන සඳහා නියාමකාත්මක අවශ්‍යතා ඇති කිරීමද යෝජිත සංශෝධනවලට අයත් වේ.

### (ඇ) රක්ෂණ පාලන ව්‍යවස්ථා කෙටුම්පත

නව රක්ෂණ පනත මගින් රක්ෂණ කර්මාන්තය සඳහා නියාමකාත්මක අධිකාරයක් පිහිටුවීමට ඉඩකඩ සැලසේ. මෙම රක්ෂණ නියාමකාත්මක ආයතනය මගින් රක්ෂණ සමාගම්, රක්ෂණ බ්‍රෝකර් සමාගම් සහ ඒජන්ත වරුන්ගේ ක්‍රියාකාරී පරිසරය අධීක්ෂණය කරනු ඇත. මෙම විශේෂිත පනත මගින් රක්ෂණ සමාගම් සඳහා වන අවම ප්‍රාග්ධන ප්‍රමාණය සහ අවශ්‍ය ප්‍රතිපාදන එනම්, ණය ගෙවිය හැකි මට්ටම් සහ සංචිත වැනි දේ සඳහා සීමාවන් නිර්දේශ කරනු ලැබේ. නව පනත මගින් රක්ෂණ සමාගම්, රාජ්‍ය සුරැකුම්වල යෙදිය යුතු ආයෝජන ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට කටයුතු කර ඇත. රක්ෂණ සහ බ්‍රෝකර් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය හා උසස් නිලධාරීන්ගේ සුදුසුකම් පනතේ නිර්දේශ කරනු ලැබේ. ඊට අමතරව, එම පනතේ තක්සේරු හා විගණන වාර්තා සඳහා අවශ්‍යතාද සඳහන් කර ඇත. යෝජිත පනත පැනවීමත් සමග 1962 අංක 25 දරණ රක්ෂණ සමාගම් පාලනය කිරීමේ පනත අහෝසි වනු ඇත.

### (ඈ) මූල්‍ය කල්බදු පනත් කෙටුම්පත

යෝජිත මූල්‍ය කල්බදු පනත මගින් කල්බදු කර්මාන්තය සඳහා පරිපාලනමය හා අධීක්ෂණ රාමුවක් ලබා දීමත්, මූල්‍ය කල්බදු ගණුදෙනු පිළිබඳ අයිතිවාසිකම් හා වගකීම් නිශ්චය කිරීමත් කරනු ඇත. මෙම යෝජිත පනත මගින් කල් බදු මූල්‍යකරණ කටයුතු වල යෙදී සිටින ආයතනයන්ට බලපත්‍ර ලබා දීම හා ඒවා අධීක්ෂණය කිරීම මහ බැංකුව විසින් කරනු ඇත.

### (ඉ) විශ්‍රාම නඩත්තු ව්‍යවස්ථා කොමිෂන් සභා පනත් කෙටුම්පත

පෞද්ගලික විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සඳහා ව්‍යවස්ථාපිත අධිකාරියක් පිහිටුවීම යෝජිත පනත මගින් කෙරෙනු ඇත.

### (ඊ) ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥ පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥ පනත යටතේ ප්‍රාථමික අලෙවි කරුවන් සඳහා නීති පද්ධතීන්.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ප්‍රාථමික අලෙවිකරුවන්ට ඒ සඳහා වෙන් වූ මූලධනයකින් යුත් වෙන වෙනම සමාගම් ඇති කිරීමට අවශ්‍ය වන අයුරින් ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥ පනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥ පනත යටතේ නව අනපනත් 2000 වසරේ සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම අනපනත් යටතේ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරී සහ අධීක්ෂණ රාමුවක් පිහිටුවීමට තීරණය කර ඇත.

## ගිණුම් හා විගණන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිළිගත් ගිණුම් හා විගණන ප්‍රමිතීන් 1999 දී ගැසට් කරන ලදී. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතීන් පනතේ නිර්දේශිත ව්‍යාපාර ආයතන වශයෙන් අර්ථ දක්වෙන අන්දමට මෙම ගිණුම් පිළියෙල කිරීමට හා ඒවා විගණනය කිරීමට අවශ්‍ය බව දක්වා ඇත. ව්‍යවස්ථාපිත ගිණුම් හා විගණන ප්‍රමිති උපදේශක මණ්ඩලය මගින් මෙම ප්‍රමිති ක්‍රියාත්මක කිරීම හා ඒවාට අනුකූල විය යුතු බවට අනුමැතිය දීමට කරුණු සොයා බලනු ඇත.

## ශ්‍රී ලංකා රජය හා රජය සතු වාණිජ බැංකු අතර ඇති කර ගන්නා ලද ගිවිසුම්

1998 ජුලි මස 16 වැනි දින අත්සන් කරන්නට යෙදුණු රජය සහ ලංකා බැංකුවත්, මහජන බැංකුවත් අතර ගිවිසුම් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ඒවායෙහි ක්‍රියාකාරිත්වය සොයා බලනු ඇත.

මෙම ගිවිසුම්වල අරමුණ වන්නේ අදාල බැංකුවල කාර්යයන් වාණිජ පදනමක් මත ගෙන යාමත් හා ඒවා තවදුරටත් ශක්තිමත් කර ගැනීම, ඵලදායීතාවය ඉහළ නැංවීම, පිරිවැය අඩු කිරීම, සේවක මට්ටම් හා ශාඛා පද්ධතිය විධිමත් කිරීම, වත්කම් සංරක්ෂණය කිරීම සහ අවදානම් මනා ලෙස කළමනාකරණය කිරීම යනාදී ක්‍රියා මාර්ග තුළින් බැංකුවල ලාභදායිකත්වය, කාර්යක්ෂමතාවය හා මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීමයි.

කළමනාකාරිත්වයට පරිපාලනමය ස්වාධීනත්වය ලබා දීම හා වාර්ෂික ප්‍රමාණාත්මක කාර්ය සාධන ඉලක්කයක් නියම කිරීම තුළින් බැංකුවල අභ්‍යන්තර පරිපාලනයත්, මූල්‍ය තත්ත්වය වර්ධනය කිරීමත් මෙම ගිවිසුම් වලින් අපේක්ෂා කෙරේ. ලාභදායිකත්වය පිළිබඳ නිර්නායකයන් වූ ප්‍රාග්ධනය මත ඉපැයීම හා වත්කම් මත ඉපැයීමද, කාර්යක්ෂමතාවය මනිනු ලබන සාමාන්‍ය වත්කම් මත සේවක පිරිවැය හා පොදු කාර්ය පිරිවැයද, මූල්‍ය ස්ථාවරත්වයට අදළ අක්‍රිය ණය මට්ටම් හා ණය ආපසු අය කර ගැනීමද මෙම ඉලක්කවලට ඇතුළත් වේ. ශාඛා පද්ධතිය විධිමත් කිරීමෙන් හා සේවක මටටම් සීමා කිරීමෙන්, පරිපාලන පිරිවැය හා මූල්‍ය අතරමැදි පිරිවැය පහත හෙළීමද ගිවිසුම්වල තවත් ඉලක්කයකි. දෙනු ලැබූ ඉලක්කයන් හා අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කර ගත් ආකාරය දක්වමින් බැංකු විසින් කාර්තුමය පදනමක් මත රජයට හා මහ බැංකුවට වාර්තා සැපයිය යුතු වේ.

ශාඛා පද්ධතියේ ලාභදායිත්වය හා සාර්ථකත්වය මැන බැලීමේ අරමුණින්, ලංකා බැංකුව නව ශාඛා ගිණුම්කරණ ක්‍රමයක් වර්ෂය තුළදී හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා වරලත් ගිණුම්කරණ ආයතනයක නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කමිටුවක් විසින් බැංකු දෙක සඳහා පොදු හුවමාරු මිල කිරීමේ හා පිරිවැය විභාජනය කිරීමේ ක්‍රමයක් නිර්දේශ කරන ලදී. මහජන බැංකුව වර්ෂ 2000 දී නව ශාඛා ගිණුම් කරන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ වර්තමාන ණය හා ආයෝජන විගණනය කිරීම සඳහා 1999 වර්ෂයේදී අදල කටයුතු සංවිධානය කරන ලදී. මෙම විගණනයේ අරමුණ වන්නේ ජාත්‍යන්තර සම්මතීන්ට අනුකූල වන පරිදි බැංකුවේ ණය හා ආයෝජනවල ගුණාත්මක භාවයත් ඒ සඳහා තිබිය යුතු ප්‍රතිපාදන මට්ටමත් නිශ්චය කිරීමයි. මෙම විගණන පවත්වන ලද්දේ ජාත්‍යන්තර විගණකවරු විසිනි.

ලංකා බැංකුව සහ මහජන බැංකුව එහි උපාය මාර්ග සහ ව්‍යුහමය ප්‍රතිසංස්කරණ සැලැස්ම පිළියෙල කිරීම සඳහා උපදේශකවරුන්ගේ සේවය ලබාගෙන ඇත.

## තාක්ෂණික ආධාර ව්‍යාපෘතීන්

පහත සඳහන් තාක්ෂණික ආධාර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය වෙළඳපොළ දෙපාර්තමේන්තුව විවිධ ආයතන සමග සම්බන්ධීකරණ වී කටයුතු කරනු ලැබිනි.

### (අ) සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන කළමනාකරණ හැකියාව දියුණු කිරීම.

සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන කළමනාකරණය දියුණු කිරීම සඳහා උපදේශක කණ්ඩායමකගේ සහාය ලබා දුනි. සේ.අ.අ. සඳහා ආයෝජන නීතිරීති මාලාවක් සම්පාදනය කිරීමත් හා එහි සේවක මණ්ඩලයට අරමුදල් කළමනාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුවක් ලබා දීමත් මෙම තාක්ෂණික ආධාර ව්‍යාපෘතියට අයත් විය.

### (ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් ක්‍රමය හා රජයේ ණය සුරැකුම්පත් වෙළෙඳපොළ ස්වයංක්‍රියකරණය.

1999 වර්ෂය තුළදී උපදේශකවරුන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් ක්‍රමය සහ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ පත්‍ර රහිත ක්‍රමය ස්වයංක්‍රියකරණය සඳහා අධ්‍යයනයක් කරන ලදී. මෙම උපදේශකවරුන් "තත්කාලීන දළ නිෂ්කාශන ක්‍රමය" සඳහා අවශ්‍ය වන පරිගණක දෘඩාංග සහ මෘදුකාංගවලට අදළ තාක්ෂණික විස්තරද පිළියෙල කරන ලදී.

### (ඇ) ප්‍රාථමික වෙළෙඳුන් අධීක්ෂණය කිරීම.

ප්‍රාථමික වෙළෙඳුන් අධීක්ෂණය කිරීම සඳහා නව නීති රාමුවක් මහ බැංකුව පිළියෙල කර ඇත. අධීක්ෂණ යාන්ත්‍රණය පිහිටුවීම හා සේවක මණ්ඩල පුහුණු කිරීම සඳහා මහ බැංකුවට සහාය වීමට උපදේශකවරු හඳුනාගෙන ඇත. මෙම උපදේශක වැඩසටහන 2000 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

**(ඈ) ස්ථානීය නොවන බැංකු අධීක්ෂණ ක්‍රමය පරිඝනකගත කිරීම.**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථානීය නොවන බැංකු අධීක්ෂණ කටයුතු සඳහා මෘදුකාංග සංවර්ධනය කරන ලදී. බැංකුවල මූල්‍ය දත්තයන් ලිපිතැටිවලට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආකෘති පිළියෙල කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. පූර්ව අනතුරු සංඥ දීමේ යාන්ත්‍රණයක්ද මෙම ක්‍රමය තුළ අන්තර්ගතය. 1999 වර්ෂයේදී මෙම ක්‍රමය ක්‍රියාවට නංවන ලදී.

**(ඉ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ හැකියාවන් උසස් කිරීම**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානීය සහ ස්ථානීය නොවන අධීක්ෂණ හැකියාව වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. අවදනම් මත පදනම් වූ බැංකු අධීක්ෂණය සහ ස්ථානීය නොවන අධීක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම හා කාර්ය මණ්ඩල පුහුණුව කෙරෙහි මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කරනු ඇත.

**(ඊ) පෞද්ගලික අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ වැඩසටහනක් පිළියෙල කිරීමට තාක්ෂණික ආධාර ප්‍රදානයක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කර ඇත. එනම් පොදු ව්‍යවසායයන් පෞද්ගලීකරණය සහ වාණිජකරණය කිරීම, යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා පෞද්ගලික ආයෝජන, තරඟකාරිත්වය, සංස්ථාමය පාලනය සහ පාරිභෝගික ආරක්ෂාව, කම්කරු වෙළඳපොළ ප්‍රතිසංස්කරණය කිරීම, මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය සහ රක්ෂණ නීති රීති පැනවීම යනාදියයි. පෞද්ගලික අංශයේ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් අඩංගු ප්‍රතිපත්ති ප්‍රකාශනයක් උපදේශකවරුන් විසින් පිළියෙල කර ඇත. මෙම තාක්ෂණික ආධාර වැඩසටහන 1999 වර්ෂයේදී අවසන් කිරීමටත්, 2000 වර්ෂය සඳහා ව්‍යාපෘතීන් ලේඛනගත කිරීමටත් උපදේශකවරු බලාපොරොත්තු වේ.

**(උ) විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**

විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා සහාය වීම පිණිස උපදේශකවරුන් යොදවා ගැනීමට තාක්ෂණික ආධාර ලබාගෙන ඇත. රක්ෂණ කර්මාන්තය සහ පුද්ගලික විශ්‍රාම නඩත්තු අරමුදල සඳහා නියාමක අධිකාරියක් පිහිටුවීම, විශ්‍රාමික හා සේවක අර්ථසාධක අරමුදල් ක්‍රමය සහ රක්ෂණ කර්මාන්තය නවීකරණය කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මෙම තාක්ෂණික ආධාර ප්‍රයෝජනයට ගනු ලැබේ. 2000 වර්ෂය මුල් වකවානුවේදී මෙය ආරම්භ කිරීමට උපදේශකවරු නියම කරගෙන ඇත.

## පර්යේෂණ කටයුතු

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ රජයේ ආර්ථික උපදේශක වශයෙන් මහබැංකුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා අධිපතිතුමා සහ මුදල් මණ්ඩලයට සහාය විය. දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ආර්ථිකයට අදාල සංඛ්‍යාන සහ අනෙකුත්තොරතුරු රැස්කිරීමේ සහ විශ්ලේෂණය කිරීමෙහි සහ ලෝක ආර්ථිකයෙහි මෑත කාලීන සංවර්ධනයන් සහ ප්‍රවනතාවයන් විශ්ලේෂණය කිරීමෙහිද නියුක්ත වූ අතර වැඩිදුර ආර්ථික පර්යේෂණ කටයුතුවලද නිරත විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානතම වගකීමක් වූ මහජනතාවට ආර්ථික තොරතුරු සැපයීමේ කටයුතු පුළුල් කරමින් වැඩිදියුණු කරන ලදී. දෙපාර්තමේන්තුව 'G 24' නම් අන්තර් රාජ්‍ය කණ්ඩායම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවයන් සෘජුව සම්බන්ධීකරණය කිරීමෙහිද, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් බහු පාර්ශවීය සහ ද්විපාර්ශික වශයෙන් ආධාර සපයන්නන් සමග මුදල් අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම පිණිස සහය වීමෙහි ද නියුක්ත විය. තවද, වෙළඳ අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර වශයෙන් වූ සමහර සම්බන්ධතාවයන් පවත්වාගැනීමේ සහ සම්බන්ධීකරණය කිරීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන ලදී. මීට අමතරව, මුදල් අමාත්‍යාංශය විසින් මෙන්ම බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විවිධ කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිමය උපදෙශ/ නිරීක්ෂණ ලබාදීමෙහිද නිරත විය. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා යාමට අපේක්ෂිත බැංකු නිළධාරීන් සඳහා අවශ්‍ය සේවාවන් සපයනු ලැබූ අතර පර්යේෂණ කටයුතු සඳහා මහපෙන්වීම තුළින් මෙන්ම ප්‍රසිද්ධ දේශණ, සම්මන්ත්‍රණ සහ වැඩමුළු තුළින් දැනුම බෙදා හරින ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සතිපතා සහ මාසික ආර්ථික දත්ත එක්රැස් කළ අතර මෙම තොරතුරු කඩිනමින් අන්තර් ජාලය සහ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මහජනතාව වෙත බෙදාහරින ලදී. මාසික විවරණිකා ප්‍රකාශන නිකුත්කිරීම සම්බන්ධයෙන් වූ කාල පමාව කෙටි කරන ලදී. විවිධ කාල පරිණතීන් සඳහා වාණිජ බැංකු අතර වූ රුපියල් ගනුදෙනු වෙනුවෙන් පවතින පොළී අනුපාතික සඳහා සංඥාවන් ලබාදීම පිණිස ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (SLIBOR) නමින් නව පොළී අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. (විශේෂ සටහන 9 බලන්න). මෙහි අරමුණ වූයේ නවතම මුදල් වෙළෙඳපොළ උපකරණයන් සඳහා වන ඵලදායී අනුපාතික නිර්ණය කරීමේ පදනමක් වශයෙන් මෙම අනුපාතිකය දේශීය මුදල් වෙළෙඳපොළෙහි භාවිතයට ගැනීම පිණිස උපකාරී වීමය.

දෙපාර්තමේන්තුව බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු වලද සහභාගිත්වය ඇතිව මහ බැංකුවේ 1998 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කිරීමට දායක වූ අතර එහි කටයුතු

සම්බන්ධීකරණය කළේය. මීට අමතරව, රජයේ අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී ප්‍රයෝජනයට ගනු ලබන, මූල්‍ය නීති පනතේ 116 ඡේදය ප්‍රකාර සකස් කරනු ලබන වාර්තාවක් වූ 'සැප්තැම්බර් 15 වාර්තාව' පිළියෙලකර ගරු මුදල් ඇමතිතුමිය වෙත ඉදිරිපත් කරන ලදී. එසේම අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී ප්‍රයෝජනයට ගනු ලබන වාර්තාවක් වූ 'ශ්‍රී ලංකා ආර්ථිකය 1999' නමැති වාර්තාව ද දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලදී. අනතුරුව, මෙම ප්‍රකාශනය යුද්ධය 'සහිත' සහ යුද්ධය 'රහිත' තත්වයන් යටතේ ඇති විය හැකි ප්‍රවනතාවයන් පිළිබඳ විග්‍රහයන් අඩංගු කොට 'ආර්ථිකයේ මතු බලාපොරොත්තු' නමින් යාවත්කාලීන කරන ලදී. මෙය, වසර 2000 සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සමඟ ප්‍රකාශයට පත්කරන ලදී.

ප්‍රධාන කර්මාන්තශාලා 100 කින් යුත් නියැදි සමීක්ෂණය මත ගණනය කරනු ලබන 'මාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ දර්ශකය' නොකඩවා ප්‍රකාශයට පත් කෙරිණ. පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන පිළිබඳ සවිස්තරාත්මක අර්ධ වාර්ෂික සහ වාර්ෂික සමීක්ෂණයන්ද නොකඩවා සිදු කරන ලදී. 'කොළඹ නගර සහා ප්‍රදේශයේ භෝජනශාලා විසින් භාණ්ඩ සහ සේවා බද්ද ගෙවීම' පිළිබඳ සමීක්ෂණයක් ද පවත්වන ලදී.

1999 දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ජාත්‍යන්තර සම්මකන්ත්‍රණ දෙකක්, එනම් 'ජී 24 තාක්ෂණ කණ්ඩායමේ රැස්වීම' සහ 'වයස්ගත ජනගහනය සහ සමාජයීය ආරක්ෂණ ක්‍රමය' පිළිබඳ සම්මන්ත්‍රණයෙහි සම්බන්ධීකරණ කටයුතු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරීන්, බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් සංවිධානය කළ අභ්‍යන්තර සම්මන්ත්‍රණ සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ කිහිපයකම සම්පත් දායකයන් ලෙස සහභාගී වූහ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පර්යේෂණ අධ්‍යයන ගණනාවක් සිදුකළ අතර මින් සමහරක් ඔවුන් විසින් ස්වේච්ඡාවෙන් සිදුකළ ඒවා විය. මෙම පර්යේෂණයන් මගින් සාර්ව සහ සූක්ෂම ආර්ථික ගැටළු මෙන්ම ප්‍රතිපත්ති තීරණ යන විෂය ක්ෂේත්‍රයන් වැඩිමනත්ම ආවරණය වූ අතර, ඉන්දු ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුමෙන් ඇතිවියහැකි බලපෑම් සම්බන්ධයෙන් වූ අධ්‍යනයක්ද අඩංගු විය. මින් සමහරක් මහ බැංකුවේ 'මාණ්ඩලික පත්‍රිකා' අවසන් ප්‍රකාශනයන් දෙකෙහි ප්‍රකාශයට පත් කරන ලදී.

අග්නිදිග ආසියාතු මහ බැංකු පර්යේෂණ හා පුහුණුකිරීම් කේන්ද්‍රය විසින් පවත්වාගෙන යන පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය දායකත්වය ලබාදුන් අතර ඇතැම් නිළධාරීන් එම කේන්ද්‍රය මගින් දැනට කරගෙන යනු ලබන පර්යේෂණ ව්‍යාපෘතීන්හි සහයෝගී ක්‍රියාකාරීත්වයන් සඳහා සෘජුවම සම්බන්ධ විය. අග්නිදිග ආසියාතු කලාපීය සහයෝගිතා සංවිධානයෙහි මහ බැංකු කටයුතු සම්බන්ධ 23 වැනි පුහුණු පාඨමාලාව සම්බන්ධයෙන් සහ අග්නිදිග ආසියාතු කලාපීය සහයෝගිතා සංවිධානයෙහි අධිපතිවරුන් සඳහා වූ වසර 2000 සම්මන්ත්‍රණය සම්බන්ධවද සත්කාරක වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කිරීමට නියමිත නිසා පුහුණු පාඨමාලාව සකස් කිරීමේ සහ මෙම කටයුතු දෙක සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණයෙහිද නියුක්ත විය. දකුණු ආසියාතු කලාපීය සහයෝගිතා සංවිධානයයේ සාමාජික රටවල මහ බැංකු අධිපතිවරුන්ගේ හා මුදල් ලේකම් වරුන්ගේ සංගමයයේ (SAARCFINANCE) කටයුතු සම්බන්ධීකරණය සඳහා දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලද ඒකකය මගින් එම සංවිධානයේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

ශ්‍රී ලංකා රජය හා ආධාර දෙන රටවල් අතර ඇතිකරගත් විවිධ විදේශ ණය ගිවිසුම් වල මූල්‍යමය ප්‍රතිවිපාක සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් මුදල් මණ්ඩලය වෙත මුදල් මණ්ඩල පත්‍රිකා ගණනාවක් ඉදිරිපත් කරන ලද අතර මුදල් මණ්ඩලයේ තීරණ මුදල් අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. නවද, දෙපාර්තමේන්තුව නව මහ බැංකු සේවකයින් සඳහා වන මහ බැංකු දායකත්ව විශ්‍රාම යෝජනා ක්‍රමය සඳහා උපදෙස් මාලාවක් පිළියෙල කිරීම පිණිස උපකාරී විය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සමහර ජ්‍යෙෂ්ඨ නිළධාරීන්, බැංකුව ඇතුළත සහ බැංකුවෙන් පිටත වැදගත් කමිටු ගණනාවක සේවය කළහ. මෙම කමිටු අතර, වෙළඳසේවා සඳහා වන අන්තර් අමාත්‍යාංශ උප කමිටුව, නිෂ්පාදන ප්‍රතිප්‍රතාතන (Anti-dumping) සහ ප්‍රතිතෝලන (Countervailing) බදු පිළිබඳ වන උප කමිටුව, ගෙවුම් ශේෂ්‍ය පිළිබඳ කමිටුව, විනිමය අනුපාතික කමිටුව, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන කමිටුව සහ මූල්‍ය මෙහෙයුම් කමිටුව ද විය. 1999 අවසානයේදී මූල්‍ය මෙහෙයුම් කමිටුව වෙනුවට ද්‍රවශීලතා ගණනය කිරීමේ කමිටුව, විවට වෙළඳපල කටයුතු පිළිබඳ කමිටුව සහ දේශීය ණය කළමණාකරනය පිළිබඳ වූ කමිටුව යනුවෙන් කමිටු තුනක් ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා - චීන ඒකාබද්ධ කොමිසම සහ පකිස්ථාන - ශ්‍රී ලංකා වෙළඳ සම්බන්ධතා කොමිසම වැනි ද්විපාර්ශවික වෙළඳ සම්බන්ධතා පිළිබඳ කටයුතු පිළියෙල කිරීමේ රැස්වීම් වලදීද, බංගලාදේශය, ඉන්දියාව, මියැන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්තය ඇතුලත් ආර්ථික සහයෝගිතා සංවිධානය සඳහා බැංකොක්හි පැවති වටමේසය සම්මේලනයේ සහ ඉහත සඳහන් කරන ලද රටවල් සඳහා වූ කොළඹ පැවති සංචාරක කටයුතු පිළිබඳ සංම්මේලනයෙහි දී ද දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ලදී.

මූල්‍ය සමස්ථයන් සඳහා වූ පුරෝකථනය සඳහා පුළුල් මුදල් සමීක්ෂණ (විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ඇතුලත් කරන ලද මූල්‍ය සමීක්ෂනය) යොදා ගැනීම මගින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස යොදාගත් මූල්‍ය වැඩසටහන් රාමුව, තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

## සංඛ්‍යාන සහ ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් (අ) ජාතික ගිණුම්, මිල සහ වැටුප් ඇතුළත් සාර්ව ආර්ථික හා සමාජ දත්ත සහ (ආ) කුටුම්භ හා ආයතනික අංශ පිළිබඳ මූලික දත්ත එක්රැස් කිරීම හා ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම හා

ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ කටයුතු මෙම වසරෙහි ද නොකඩවා කරගෙන යන ලදී. මීට අමතරව මෙම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික නිෂ්පාදන භාණ්ඩ සඳහා ඉදිරි වෙළඳපොළ ක්‍රමය හඳුන්වාදීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයන්හි ආහාර ද්‍රව්‍යවල තොග සහ සිල්ලර මිල ගණන් එක්රැස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. වෙළෙඳ මධ්‍යස්ථාන කීපයකම සතිපතා කරනු ලැබූ සිල්ලර මිල ගණන් තොරතුරු රැස්කිරීමේ කටයුතු දෛනික පදනමකින් සිදුකිරීම ඇරඹුනි. ඒ සමගම මිල සහ වැටුප් දත්ත ප්‍රකාශයට පත් කිරීම් වඩාත් පුළුල් අයුරින් සිදු කරන ලදී. දෛනික මිල තොරතුරු මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත් කෙරුණු අතර අදාළ ආයතන වෙත ද නිකුත් කිරීම සිදු කෙරිණි.

මෙම වසරේදී දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද ප්‍රධානතම කාර්යයන් වශයෙන් 1996/97 පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාව එළිදැක්වීම හා කෘෂිකාර්මික භාණ්ඩ සඳහා ඉදිරි වෙළඳ යෝජනා ක්‍රමය හඳුන්වාදීම දැක්විය හැකිය. හඳුනාගත් නියමු ව්‍යාපෘති කීහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වෙළඳ ක්‍රමය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක් පවත්වන ලදී. මෙහි මුල්ම ව්‍යාපෘතිය 1999 දෙසැම්බර් මස ඇරඹුනි. මෙහිදී මහියංගනයෙහි පිහිටි මොරයාය ප්‍රදේශයෙහි ගොවීන් සමූහයක් 1999/2000 මහ කන්නයේ ලබා ගැනීමට අදහස් කරන වී අස්වැන්න, කලින් සාකච්ඡා කර තීරණය වූ ගිවිසුම් ගත මිලකට සී/ස. සී.අයි.සී. සීඩ්ස් පෞද්ගලික සමාගමට විකිණීම සඳහා ඉදිරි ගිවිසුම්වලට එළඹිණි.

## පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය 1996/97

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1996/97 පවත්වන්නට යෙදුන පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයෙහි වාර්තාව 1999 දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සමීක්ෂණය කරුණු කීපයක් නිසා සුවිශේෂිත වූ සමීක්ෂණයක් වශයෙන් සැලකිය හැකිය. පළමුව ශ්‍රී ලංකාවේ පනස්වන නිදහස් සමරුවට සමගාමී වීමද, දෙවනුව නිදහස් ආර්ථිකය හඳුන්වාදීමෙන් පසු විසිවසරක් ගතවීම හා සමගාමී වීම ද දැක්විය හැකිය. තෙවනුව, ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන්නා වූ රටවල් කාණ්ඩයට ඇතුළත් වෙමින් පවතින කාලපරිච්ඡේදයකදී මෙම සමීක්ෂණය කෙරුණු හෙයින් එම සංක්‍රාන්ති කාලය තුළ පිළිබිඹුවන සමාජ ආර්ථික තත්ත්වයන් මෙමගින් වඩාත්ම එළිදැක්විණි. සිව්වැනිව, 21 වන සියවසෙහි සමාජ ආර්ථික අපේක්ෂා මනාව විදහා දැක්වීම සඳහා මෙම සමීක්ෂණ තොරතුරු උපකාරී වනු ඇත.

සමීක්ෂණයෙන් හෙළිදරව් වූ තොරතුරු පරිච්ඡේද 7ක් යටතේ සාකච්ඡා කරනු ලැබේ. ඒවා නම්; (1) සමීක්ෂණයේ අරමුණු හා ක්‍රමවේදය (2) ජන විකාශ පිළිබඳ තොරතුරු (3) සමාජ ආර්ථික තත්ත්වයන් (4) ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය (5) ආදායම (6) වියදම හා පරිභෝජනය සහ (7) ඉතිරිකිරීම්, ආයෝජන හා ණය යනුවෙනි.

මෙම කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවල ඉල්ලීම පරිදි මෙම සමීක්ෂණයට අදාළව විශේෂයෙන් සකසන ලද සංඛ්‍යා සටහන් ඇතුළත් දත්ත සම්පාදනය කරන ලදී.

මෙම සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු මගින් සමාජ-ආර්ථික තොරතුරු දත්ත පදනම වඩාත් ශක්තිමත් කෙරිණි. එසේම මෙම සමීක්ෂණයෙහි දත්ත පදනම් ඇස්තමේන්තු වශයෙන් උපයෝගී කරගෙන ජාතික ගිණුම් දත්ත පදනම ද වැඩි දියුණු කරන ලදී. තවද කොළඹ, අනුරාධපුරය, මාතර හා මාතලේ දිස්ත්‍රික්ක පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමටත් මෙම දත්ත උපයෝගී කර ගන්නා ලදී.

## කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වූ ඉදිරි වෙළඳ වැඩසටහන

ඉදිරි වෙළෙඳ ගිවිසුම් යටතේ කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීමේ ක්‍රමය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් යෝජනා කර හඳුන්වා දී ඇත. ගොවියාට ස්ථිර මිලක් ලබාදීම හා ඉතා හොඳ තත්ත්වයෙන් යුත් භාණ්ඩ, වෙළෙඳුන්, කෘෂි සැකසුම් කර්මාන්ත හා අපනයනකරුවන් වෙත නොකඩවා ලැබීම තහවුරු කිරීම මෙම යෝජනාවෙහි පරමාර්ථය විය. මෙම යෝජනාව මගින් හඳුන්වා දෙනු ලැබූ ඉදිරි වෙළෙඳ ගිවිසුම් ලියවිල්ල මගින් මෙතෙක් පැවැත් වූ සම්ප්‍රදායානුකූල අසංවිධිත ඉදිරි වෙළඳ ක්‍රමය, සංවිධිත ඉදිරි වෙළෙඳ ක්‍රමයක් බවට පරිවර්තනය විය. ඒ අනුව ගිවිසුමට බැඳෙන දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කර එකඟතාවයකට පත් කරගත් නියමයන් හා කොන්දේසි සමග ගිවිසුම්ගත මිල, භාණ්ඩවල ප්‍රමාණය හා ඒවායෙහි ප්‍රමිතිය, භාණ්ඩ සැපයිය යුතු කාලය ආදී සියළුම කරුණු ගිවිසුමට ඇතුළත් කර ඇත. මෙහිදී පහසුකම් සපයන්නෙකු ලෙස බැංකු ක්‍රියාකරනු ඇත.

පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කරන බැංකු විසින් විකුණුම්කරු හා ගැණුම්කරු මුණගැස්වීමේ කාර්යය සිදු කරනු ඇත. ගැණුම්කරු හා විකුණුම්කරු යන දෙපාර්ශ්වයටම මෙම ගිවිසුම් ලියවිල්ල ඇපකරයක් ලෙස බැංකුවට පැවරිය හැකිවන නිසා, කෘෂිකාර්මික නිෂ්පාදන, කෘෂි සැකසුම් හා අලෙවිකරණ කටයුතු සඳහා බැංකු අංශයෙන් ණය පහසුකම් ලබා ගැනීමෙහි ප්‍රවේශයක් මෙම වැඩ සටහන නිසා සිදු වේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ ලංකා බැංකුව මෙම ක්‍රමය යටතේ ණය යෝජනාවලියක් දැනටම සකස් කර ඇති අතර අනෙකුත් බැංකුද යථා කාලයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ ණය සැපයීම සඳහා මහත් උනන්දුවෙන් බලා සිටී.

## දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1978 දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල 1999 දී එහි ක්‍රියාකාරිත්වයෙහි විසිඑක්වන වසර සම්පූර්ණ කරන ලදී. මෙම වැඩපිළිවෙල යටතේ, පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන් පිළිබඳ තොරතුරු, කෘෂිකාර්මික

භාණ්ඩවල නිෂ්පාදන මිල ගණන් සහ අසංවිධිත අංශයේ වැටුප් එක්රැස් කිරීම නොකඩවා සිදු කෙරිණි. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල කෘෂිකර්මාන්තයේ දයකත්වය මැන බැලීම සඳහා ද මෙම වැඩපිළිවෙල යොද ගැණුනි. සමස්ත දිවයින නියෝජනය වන පරිදි තෝරාගත් පාසල් ගුරු හවතුන් විසින් මෙම දත්ත රැස් කිරීමේදී සංඛ්‍යාන විමර්ශකයින් ලෙස ක්‍රියාකරනු ලබයි. වී, තේ, රබර් සහ පොල් වගා උප අංශයන් සහ සුළු පරිමාණයෙන් කෙරෙන ඉදිකිරීම් කටයුතු ද මෙම වැඩපිළිවෙලෙන් ආවරණය වේ. මෙසේ රැස් කරන තොරතුරු මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවලින් ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු වේ. ප්‍රාදේශීය මිල දර්ශක ගණනය කිරීම වැනි සුවිශේෂ කටයුතු සඳහා මෙම දත්ත භාවිතා කරන නිසා දත්තවල ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අදහසින් විමර්ශකයින් පුහුණු කිරීම සඳහා 1999 දී කොළඹ, අනුරාධපුරය, මහනුවර සහ මාතර සම්මන්ත්‍රණ පවත්වන ලදී.

පිටකොටුව තොග වෙළඳපොළ සහ මරදගහමුල සහල් වෙළඳපොළ වැනි අනෙකුත් නිෂ්පාදන මධ්‍යස්ථානවලින් සහ දඹුල්ල වෙළඳපොළෙහි සිල්ලර මිල සහ තොග මිල ගණන් දිනපතා එක්රැස් කිරීම දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යයි. ගොවියන්, වෙළෙඳුන් සහ පාරිභෝගිකයන්ට තොරතුරු ව්‍යාප්ත කිරීමේ අදහසින් යුතුව මෙම තොරතුරු පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය මගින් දිනපතා ප්‍රකාශයට පත් කරනු ලැබේ. විශේෂයෙන් ඉදිරි වෙළඳපොළ ගනුදෙණු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දත්ත සපයනු ලැබේ. මීට අමතරව රජය සහ පෞද්ගලික අංශයේ ආයතනවලටද මෙම දත්ත සපයනු ලැබේ.

## දිස්ත්‍රික්ක අනුව පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අතිරේක වශයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1998 හඳුන්වා දුන් කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) ගණනය කිරීම තවදුරටත් සිදු කෙරේ. මෙම දර්ශකය සඳහා භාවිතා කරන ලද ඉලක්කගත ජනගහනය, ආදයම අනුව පෙළ ගස්වන ලද කොළඹ දිස්ත්‍රික්කයෙහි කුටුම්භවල පහළම සියයට 40 න් සමන්විත වේ. එය කො.පා.මි.ද ට වඩා පුළුල් පරාසයකින් යුක්තය. දර්ශකය ගණනය කිරීම සඳහා වූ තොරතුරු කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 11 කින් ලබාගනු ලැබේ. ඒවානම් දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල යටතේ ඇතිකරනු ලැබූ මධ්‍යස්ථාන වන හංවැල්ල, හෝමාගම, මොරටුව, අවිස්සාවේල්ල හා පිටකොටුව සහ 1999 ජනවාරි සිට අළුතෙන් හඳුන්වාදෙනු ලැබූ කොළොන්නාව, නුගේගොඩ, දෙහිවල, පිළියන්දල, මහරගම හා පාදුක්ක යන මධ්‍යස්ථානයි. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පත්කරනු ලැබ ඇති දත්ත විමර්ශන ගුරු හවතුන් විසින් මෙම මධ්‍යස්ථානවලින් තොරතුරු එකතු කර ගැනේ.

දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුරය, මාතර හා මාතලේ දිස්ත්‍රික්ක සඳහා ද ප්‍රාදේශීය පාරිභෝගික මිල දර්ශක තුනක් ගණනය කරනු ලැබේ. මහ බැංකුව විසින් 1996/97 පවත්වන ලද පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයෙන් අදළ දිස්ත්‍රික්ක සඳහා ලබාගන්නා ලද වියදම් රටාවන් මත දර්ශක සඳහා භාණ්ඩ බරතැබීම පදනම් විය. දර්ශකවල බර තැබීම් සකස් කිරීමට යොදගනු ලැබූ ඉලක්ක ජනගහනය ආදයම් අනුව පෙළගස්වන ලද දිස්ත්‍රික්කයේ පහළම ආදයම් ලබන කුටුම්භයන් සියයට 40 න් සමන්විත විය. මෙම දර්ශක ප්‍රාදේශීය මිල වෙනස්කම් විග්‍රහ කිරීමට ප්‍රයෝජනවත් වේ. තවද ප්‍රාදේශීය මිල වෙනස්වීමේ තොරතුරු කෘෂිකාර්මික භාණ්ඩවල ඉදිරි වෙළඳ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ.

තවද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අත්හද බැලීමේ පදනම මත බස්නාහිර පළාත සඳහා කො.දි.පා.මි.ද. ට වඩා පුළුල් නියෝජනයක් සහිත අළුත් දර්ශකයක් ගණනය කිරීමේ නියුතුව සිටී. ආදයම් මට්ටම අනුව පෙළගස්වන ලද පහළම සියයට 80 අයත්වන කුටුම්භ මෙම දර්ශකය මගින් ආවරණය කෙරෙයි. බර තැබීම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1996/97 පවත්වන ලද පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයෙන් හෙළිදරව් වූ වියදම් රටාව මත පදනම් වී ඇත. වෙනස්වන පාරිභෝගික රටාවන් හසුකර ගැනීම සඳහා කො.දි.පා. මිල දර්ශකයේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානවලට අමතරව නගරයේ තෝරා ගත් සුපිරි වෙළෙඳසැල් ද ඇතුළත් වන පරිදි දත්ත එකතුකිරීමේ මධ්‍යස්ථාන පුළුල් කර ඇත.

## ජාතික ගිණුම්

ජාතික ගිනුම් ඇස්තමේන්තු කිරීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නියුක්ත විය. කාර්තුමය හා වාර්ෂිකමය පදනමකින් ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ දත්තයන් එක්රැස් කිරීම හා ගිණුම්ගත කිරීම මෙයට ඇතුළත් වේ. 1998 සිට දෙපාර්තමේන්තුව කාර්තුමය පදනමකින් (ස්ථාවර සාධක මිල යටතේ) ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම ඇරඹීය. කාර්තුමය පදනමකින් ගිණුම් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය 1999 වර්ෂය තුළදී තවදුරටත් ශක්තිමත් කරන්නට යෙදුණි. 1998 ජුනි මස සිට කාර්තුමය පදනමකින් යුතුව ස්ථාවර සාධක මිල යටතේ ගිණුම් මාලාවක් ප්‍රකාශයට පත් කිරීමට අමතරව, පවත්නා සාධක මිල අනුව දත්ත මාලාවක් දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලදී. එය ප්‍රථම වරට මෙම වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත්කර ඇත.

අවිධිමත් සහ අළුතින් මතුවන ආර්ථික ක්‍රියාකාරකම් වඩාත් පුළුල් ලෙස ආවරණය වන පරිදි, පොදුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාදමය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 1999 දී උත්සාහයක් දරනු ලැබිණ. සිල්ලර වෙළෙඳම, ලුහු ඉංජිනේරු, ආපනශාලා හා ආහාරපාන සැපයීමේ සේවාව, වාහන නඩත්තු කිරීම, වායු සමීකරණ, පරිගණක එකලස් කිරීම සහ මෘදුකාංග කර්මාන්තය, පුද්ගලික සේවාවන්, විනෝදස්වාදය සැපයීමේ සේවා, ප්‍රචාරණය ආදී ආර්ථික කටයුතු මීට ඇතුළත් විය.

මේ අතර කාර්තුමය පදනමේ ජාතික ගිණුම් දත්තයන්, පොදු මහජනතාවට සහ ප්‍රයෝජනයට ගන්නන් උදෙසා, මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමෙහිලා දෙපාර්තමේන්තුව 1999 වර්ෂය තුළදී තවදුරටත් නිරත විය. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වෙබ් අඩවිය හරහා මෙම දත්ත ලබා ගත හැකිය.

## ප්‍රකාශන

දෙපාර්තමේන්තුව විසින් "ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 1999" - 22 වැනි වෙළුම, "ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන" 21 වැනි වෙළුම යන වාර්ෂික ප්‍රකාශනයන් දෙක පළ කරනු ලැබීය. මෙම ප්‍රකාශන මගින් ශ්‍රී ලංකාවේ ජන විකාශ තොරතුරු, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය, ජාතික ආදායම සහ වියදම, කෘෂිකර්මය, කර්මාන්ත, විදේශ වෙළඳම සහ මුදල්, මිල සහ වැටුප්, මුදල්, බැංකු, ප්‍රාග්ධන වෙළඳපොළ, රාජ්‍ය මූල්‍ය සහ සමාජ ආර්ථික සේවා යනාදී සමාජ ආර්ථික විචල්‍යයන්ට අදාළ විස්තරාත්මක දත්ත කාලශ්‍රේණි හා හරස්කඩ පදනමින් ඉදිරිපත් කෙරේ. තවද කලාපීය රටවල් පිළිබඳව සංසන්දනාත්මක දත්ත ද මෙම ප්‍රකාශයනයන්හි අඩංගු වේ. 1999 වර්ෂයේදී මෙම ප්‍රකාශන දෙකෙහිම දත්ත ආවරණය සහ ඉදිරිපත් කිරීම වැඩිදියුණු කොට ඇත. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ අනිකුත් ප්‍රකාශනයන් කිහිපයක් සඳහා ද මෙම දෙපාර්තමේන්තුව දායක විය.

# සේවක අර්ථසාධක අරමුදල

මහ බැංකුවේ මුදල් මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු වශයෙන් 1999 වර්ෂය පුරාද සිය කටයුතු තවදුරටත් සාර්ථකව පවත්වාගෙන යන ලදී. මෙහිලා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය සමග සමීප සම්බන්ධතාවයක් අඛණ්ඩව පවත්වා ගනිමින් එකී කටයුතු කරන ලදී. සේ.අ.අ. පනතට අනුව මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් වනුයේ දායක මුදල්, දඩ මුදල් සහ ආයෝජන ආදායම් ලබා ගැනීම, ලියාපදිංචි කරන ලද සේවා යෝජකයින්ගේ හා අරමුදලේ සාමාජිකයන්ගේ ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම, අතිරේක මුදල් වඩාත් ඵලදායී මාර්ගවල ආයෝජනය කිරීම සහ අරමුදලේ සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවීම යන කාර්යයන් වේ.

1996 වර්ෂයේ ආරම්භ වූ සේ.අ.අ. නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය 1999 වසර පුරාද අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණ. මෙම ව්‍යාපෘතියට අනුව අරමුදලේ අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු මහ බැංකුවේ පරිගණක මෘදුකාංග ප්‍රවර්ධකයන්ගේ සහභාගිත්වය ඇතිව වඩාත් නවීන මෘදුකාංග යොදා ගනිමින් මුළුමනින්ම පරිගණකගත කරන ලදී. අරමුදලේ ගිණුම් යාවත්කාලීන කිරීමට, ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමට සහ සාමාජිකයන්ට හා සේවා යෝජකයන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමට මෙය බෙහෙවින් ඉවහල් විය. මීට අමතරව, රටේ මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය සැළකිල්ලට ගනිමින් අරමුදල සිය ආයෝජනයන් විවිධාංගකරණය කිරීමේ කටයුතුද 1999 වර්ෂය තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. මෙම ආයෝජන විවිධාංගකරණ වැඩසටහනෙහි අරමුණ වනුයේ ආයෝජනයන්හි සුරක්ෂිත භාවය ආරක්ෂා කර ගනිමින් අරමුදලේ ආදායම් තත්ත්වය නංවාලීම තුළින් සාමාජිකයන්ට හැකි උපරිම ඵලද අනුපාතයක් ලැබීමට මං පාදාලීමය.

නවීකරණ ව්‍යාපෘතිය තුළින් සේවක අර්ථසාධක අරමුදල ලබා ඇති සංවර්ධනයෙහි කැපී පෙනෙන කරුණු පහත දක්වේ.

## ආපසු ගෙවීම් අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංකෘත කිරීම

අරමුදලේ ආරම්භයේ සිටම පැවති පිළිවෙත වූයේ ආපසු ගෙවීම් අනුමත කිරීම (තීරණ ලිපිය) කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් මහ බැංකුව වෙත ලිපියක් මගින් දැනුම් දීමයි. මෙම ක්‍රමය 1999 වර්ෂය තුළදී මුළුමනින්ම පරිගණකගත කරන ලද අතර, කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයාට සිය ප්‍රතිලාභ ආපසු ගෙවීම් අනුමත කිරීම් විද්‍යුත් මාර්ගයෙන් සෘජුවම අරමුදලෙහි ප්‍රධාන පරිගණක ජාලය වෙත යොමු කිරීමට පහසුකම් සපයන ලදි. මෙම නව ක්‍රියා මාර්ගය නිසා ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ක්‍රියා මාර්ගය කිරීමට පහසුකම් සපයන ලදී. මෙම නව ක්‍රියා මාර්ගය නිසා ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ක්‍රියා මාර්ගය වඩාත් සරල වූවා පමණක්නොව එම ක්‍රියාවලිය සඳහා ගත වක කාලපරාසයේ පැහැදිලි අඩු වීමක් සිදු විය.

## කම්කරු දෙපාර්තමේන්තුව වෙත බාහිර ටර්මිනල පහසුකම්

සේ.අ.අ. සතු ප්‍රධාන පරිගණක ජාලය සමග සෘජු සම්බන්ධකම් ඇති කොට සාමාජික නාම, සාමාජික අංක සහ දායක මුදල් පිළිබඳව තොරතුරු ක්ෂණිකව ලබා ගැනීම සඳහා කම්කරු කොමසාරිස් වෙත ටර්මිනල සම්බන්ධතා පහසුකම් සපයන ලදී. මෙම පහසුකම් උපකාරයෙන් කම්කරු කොමසාරිස්වරයාට ප්‍රතිලාභ අයදුම් කරන සාමාජිකයන්ගේ අයදුම්පත්වල සාමාජික නම, අංකය හෝ දායක මුදල්වල යම් දෝෂයන් වේ නම් ඒවා මුල් අවස්ථාවේදීම සොයා නිවැරදි කරගත හැකි වීම නිසා අනවශ්‍ය ප්‍රමාදවීම් සහ අපහසුතාවයන් මග හරවා ගත හැකි වෙයි. මේ නිසා මීට පෙර ඉහත කී දෝෂයන් හේතුවෙන් කම්කරු කොමසාරිස් වෙත ආපසු හරවා යවනු ලැබූ ප්‍රතිලාභ නිර්දේශයන්

බොහොමයක් හා අදාලව කඩිනමින් ක්‍රියාමාර්ග ගත හැකිව ඇත.

මීට අමතරව මහනුවර, කෑගල්ල, හැටන්, රත්නපුර, ගම්පහ, ගාල්ල සහ මාතර වැනි පිට පළාත්වල පිහිටි ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හිද අරමුදලේ ප්‍රධාන පරිගණක පද්ධතිය හා සම්බන්ධිත පරිගණක ටර්මිනල පහසුකම් සලස්වන ලදී. ඒ හැර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයටද මෙවැනිම වූ පරිගණක ටර්මිනලයක් මගින් අවශ්‍ය පහසුකම් සලසන ලදී. මෙම ටර්මිනල මගින් සාමාජිකයන්ට කොළඹ පිහිටි මහ බැංකුවට හෝ ප්‍රධාන කම්කරු කාර්යාලයට නොපැමිණ සිය ශේෂය දක්වෙන ගිණුම් ප්‍රකාශයක් ලබා ගැනීමටද, කම්කරු නිලධාරීන්ට ගෙවීම් පැහැර හැරි සේවාදයකයන් පිළිබඳ තොරතුරුද එක එල්ලේ දැනගත හැකි වේ.

## අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුතුව ආරම්භ කිරීම

අරමුදලේ ඉතිහාසයේ ප්‍රථමවරට, තමන් මාසිකව ගෙවූ දයක මුදල් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශනයක් අදාල සාමාජිකයන් වෙත අර්ධ වාර්ෂිකව නිකුත් කිරීමට පියවර ගනු ලැබීය. මේ අනුව 1999 වර්ෂයේ පළමු අර්ධ වාර්ෂිකයට අදාළ දයක මුදල් ලැබීම් දක්වෙන ගිණුම් ප්‍රකාශන 1999 නොවැම්බර් මාසයේදී නිකුත් කරනු ලැබූ අතර, දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන වාර්තාව 2000 අප්‍රේල් මාසය අවසන් වීමට ප්‍රථම නිකුත් කිරීමට කටයුතු යොද ඇත. මෙම නව ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමේ ක්‍රමය මගින් මාසිකව ගෙවූ දයක මුදල් පිළිබඳව යාවත්කාලීන වූ තොරතුරු සාමාජිකයන්ට දැන ගැනීමට හැකි වේ. මෙම ගිණුම් ප්‍රකාශයේ මාසික ගෙවීම් වෙන් වෙන්ව දක්වා ඇති බැවින්, යම් සේවා දයකයෙක් කිසියම් සාමාජිකයෙක් වෙනුවෙන් යම් මාසයක් සඳහා දයක මුදල් නොගෙවා ඇත්නම් එය සාමාජිකයාට වහාම හෙළිදරව් වේ. මේ නිසා, මෙම ගිණුම් ප්‍රකාශ දයක මුදල් ගෙවීම පැහැර හරින සේවාදයකයන් ඉන් වැළැක්වීම සඳහා පිහිටවූ ස්වයංක්‍රීය පාලන ක්‍රමයක් ලෙස හැඳින්විය හැක.

## විද්‍යුත් මාධ්‍යයෙන් දයක මුදල් ලබා ගැනීම

1958 දී අරමුදල පිහිටවූද සිට සේවා දයකයන් විසින් සේ.අ.අ. දයක මුදල් ගෙවීමේදී අනුගමනය කළේ සාමාජිකයන්ගේ විස්තර (නම, අංකය සහ දයක මුදල ආදිය) ඇතුළත් උපලේඛනයක් සහිතව දයක මුදල් ගෙවීමයි. සේවා දයකයන් විසින් මෙසේ එවනු ලබන දත්ත පරිගණකගත කිරීම සඳහා අරමුදලට මහත් වෙහෙසකින් සහ වැඩි වියදමක් දරමින් ක්‍රියා කිරීමට සිදු විය. ඒ හැර ඒ සඳහා ගත වූ දීර්ඝ කාලය සාමාජික ශේෂ ප්‍රකාශන නිකුත් කිරීමද ප්‍රමාද කරවීය. මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව, පරිගණක මෘදුකාංග පද්ධතියක් දියුණු කරනු ලැබූ අතර, 1999 වර්ෂයේ සිට විශාල පරිමාණයේ සේවා යෝජකයන්ගේ දයක මුදල් එකතු කිරීම විද්‍යුත් මාධ්‍යයෙන් සිදු කිරීම ආරම්භ කෙරිණ. ආරම්භයේදී සාමාජික වැටුප් විස්තර අන්තර්ගත කෙරුණු පරිගණක තැටිති මගින් එය සිදු කෙරිණ. එහෙත් පසුව අවශ්‍ය මෙවලම් සවි කිරීමෙන් අනතුරුව විද්‍යුත් තැපැල මගින් තොරතුරු සෘජුවම ලබා ගැනීම ආරම්භ කරන ලදී. මෙම සේවා යෝජකයන් චෙක්පත් මගින් ගෙවීම් කිරීමට අකමැති නම් ස්වකීය අභිමතය පරිදි ශ්‍රී ලංකා අන්තර් බැංකු ක්‍රමය මගින් විද්‍යුත් ගෙවීම් කිරීමටද පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ සලසා ඇත.

1999 වර්ෂය අවසාන වනවිට ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ඇඟළුම් කම්හල් හිමියන් ඇතුළුව සේවා යෝජකයන් 70 දෙනෙකු මෙම ක්‍රමයට දයක වී සිටියහ. ඉදිරි වර්ෂවලදී මෙම ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රචලිත කරමින් පරිගණක මගින් වැටුප් විස්තර පවත්වාගෙන යනු ලබන සියළුම සේවා යෝජකයන් මේ යටතට ගැනීමට අපේක්ෂා කෙරේ.

## ආයෝජන විධිමත් කිරීම

අරමුදලේ ආයෝජන ක්‍රමය විධිමත් කිරීම සඳහා ලෝක බැංකුවෙන් ලබා දෙනු ලැබූ විදේශ ආධාර උපයෝගී කර ගනිමින් සුදුසුකම් ලත් උපාධිධාරීන් දෙළොස් දෙනෙකු අරමුදල් කළමනාකරුවන් වශයෙන් පුහුණු කිරීම සඳහා බඳවා ගන්නා ලදී.

අරමුදල තම ආයෝජනයන්ගෙන් කොටසක් බාහිර ආයෝජකයන් ලවා පාලනය කරවා ගැනීම පිළිබඳව සැළකිල්ල දක්වා ඇත. එබැවින්, මෙම පුහුණු පාඨමාලාවේ එක් අරමුණක් වනුයේ එකී බාහිර ආයෝජන කළමනාකරුවන්ගේ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා සුදුසුකම් ලබා ගැනීමය. එයට අමතරව, අරමුදලේ අභ්‍යන්තර ආයෝජන කළමනාකරණ හැකියාව වැඩි දියුණු කර ගනිමින් ආයෝජනයන් විවිධාංගීකරණය කිරීමටද මෙකී පුහුණු වූ ආයෝජන කළමනාකරුවන් යොද ගත හැකි වනු ඇත.

## කොටස් වෙළඳපොළ ආයෝජනය

ආයෝජන විවිධාංගකරණ වැඩපිළිවෙල යටතේ 1998 වර්ෂයේදී සේ.අ.අ. විසින් කොටස් වෙළඳපොළේ ආයෝජන කටයුතු ආරම්භ කරන ලදී. මෙම ආයෝජන කටයුතු, විමර්ශනයට භාජනය කෙරෙන වර්ෂය තුළදීද නොකඩවා සිදු කෙරුනු අතර, ආයෝජනය කිරීම සඳහා කොටස් තෝරා

ගැනීමේදී විමර්ශනාත්මකව තෝරා ගත් හොඳ කොටස්වල පමණක් ආයෝජනය කිරීම කෙරෙහි සැළකිලිමත් විය.

1999 වර්ෂය අවසාන වනවිට කොටස් වෙළඳපළ ආයෝජන තත්ත්වය හා ඒ සඳහා ලැබුණු විවිධ ලැබීම් අංක II-15 දරණ සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. මෙම ආයෝජන ක්‍රමය අරමුදලට වඩාත් නැවුම් අංගයක් වුවත් අදල වර්ෂයේදී කොටස් වෙළඳපළ ආයෝජනයෙන් ලත් වාර්ෂික ඵලදයීතාව සියයට 28 ක තරම් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය.

**II - 15 සංඛ්‍යා සටහන**
**1998 සහ 1999 වර්ෂ තුළ**
**සේ.අ.අ. කොටස් වෙළඳපොළ සාඵල්‍යතාවය**

(රුපියල් දශලක්ෂ)

| විස්තරය | 1998 (24.04.1998 සිට 31.12.1998) | 1999 (01.01.1999 සිට 31.12.1999) | එකතුව |
|---|---|---|---|
| කොටස් වෙළෙඳපොළ ආයෝජන සාමාන්‍ය | 279 | 466 | |
| මුළු ලාභාංශ ලැබීම් | 5 | 27 | 32 |
| මුළු ප්‍රාග්ධන ඉපැයීම් | 5 | 15 | 20 |
| ප්‍රසාද කොටස් (99.12.31 දිනට වටිනාකම) | - | 91 | 91 |
| මුළු ලාභාංශ, ප්‍රාග්ධන ඉපැයීම් හා ප්‍රසාද කොටස් | 10 | 133 | 143 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## ද්විතීය වෙළඳපළ කටයුතු

1999 සේ.අ.අ. භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ද්විතීය වෙළඳපළ කටයුතුවල ඉතා ක්‍රියාකාරි ලෙස නිරත විය. මෙම ද්විතීය වෙළඳපළ කටයුතු මගින් ලත් ප්‍රාග්ධන වාසි හේතුකොටගෙන භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන නිශ්චිත පොලී ප්‍රමාණයට වඩා වැඩිමනත් පොලී ආදයමක් ලබා ගැනීමට අරමුදලට හැකි විය.

**II - 16 සංඛ්‍යා සටහන**
**සේ.අ.අ. : 1999 වර්ෂය තුළ ද්විතියික**
**වෙළඳපොළ කටයුතු**

(රුපියල් දශලක්ෂ)

| සුරැකුම්පත් වර්ගය | වටිනාකම* | ප්‍රාග්ධන ලාභය |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 9,514 | 115 |
| භාණ්ඩාගාර බිල්පත් | 1,451 | 2 |
| ව්‍යාපාර කොටස් | 427 | 15 |
| එකතුව | 11,392 | 131 |

*මිලදී ගැනීම් සහ අලෙවි කිරීම් දෙකම ඇතුලත්ය.

මූලය : සේවක අර්ථසාධක අරමුදල

සේ.අ.අ අරමුදලේ කැපී පෙනෙන ප්‍රධාන අංශයන් සම්බන්ධව පෙර වර්ෂය හා සංසන්දනාත්මක සංඛ්‍යා ලේඛන II-17 වන සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

**II - 17 සංඛ්‍යා සටහන**
**සේ.අ.අ. : ප්‍රධාන තොරතුරු**

| අයිතමය | 1998 | 1999* |
|---|---|---|
| 1. මුළු සාමාජික සංඛ්‍යාව (ඒකක) | | |
| ක්‍රියාකාරී (නොකඩවා දයක මුදල් ගෙවූ) | 1,790,044 | 1,900,000 |
| අක්‍රියාකාර් (අදළ වර්ෂයේදී දයක මුදල් නොගෙවූ) | 5,926,932 | 6,150,000 |
| 2. අරමුදලේ වටිනාකම (රුපියල් බිලියන) | 161 | 186 |
| 3. වාර්ෂික දයක මුදල (රුපියල් දශ ලක්ෂ) | 12,039 | 13,679 |
| 4. ආයෝජන ආදයම (රුපියල් දශ ලක්ෂ) | 20,690 | 22,596 |
| 5. අරමුදලේ සාමාන්‍ය ආදයම් අනුපාතිකය (%) | 13.89 | 13.12 |
| 6. සාමාජික අරමුදල් ශේෂ මත ප්‍රකාශිත නාමික පොලී අනුපාතය (%) | 12.25 | 11.50 |
| 7. සාමාජික අරමුදල් ශේෂ මත ගෙවූ සඵලතා පොලී අනුපාතය (%) | 12.46 | 11.72 |
| 8. සාමාජික අරමුදල් ශේෂ මත මූර්ත සඵල පොලී අනුපාතය (%) | 3.06 | 7.02 |
| 9. ගෙවන ලද ආදයම් බදු (රුපියල් දශ ලක්ෂ) | 2,080 | 2,271 |
| 10. ප්‍රතිලාභ ආපසු ගෙවූ සංඛ්‍යාව (ඒකක) | 68,928 | 99,386 |
| 11. ප්‍රතිලාභ ආපසු ගෙවීම් වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | 6,402 | 7,691 |
| 12. පරිපාලන වියදම (සේ.අ.අ., ශ්‍රී ලංකා මහ බැංකුව හා සේ.අ.අ./කම්කරු දෙපාර්තමේන්තුව(රුපියල් දශලක්ෂ) | 176 | 185 |
| 13. පරිපාලන වියදම් ආයෝජන ආදයමේ ප්‍රතිශතයක් ලෙස (%) | 0.8 | 0.8 |
| 14. මුද හරින ලද නිවාස ණය අයදුම්පත් (සංඛ්‍යාව) | 7,005 | 8,000 |

*තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල

# විනිමය පාලන

1999 වර්ෂය තුළ විනිමය පාලන දෙපාර්තමේන්තුව (වි.පා.දෙ.) විනිමය අක්‍රමිකතා සහ අවභාවිතය වැළැක්වීමේ අරමුණින් විදේශ විනිමය ගණුදෙනු මෙහෙයුම් වැඩපිළිවෙළද ශක්තිමත් කරන ලද අතර, විනිමය පාලනය තවදුරටත් ලිහිල් කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග කීපයක්ම ක්‍රියාත්මක කරන ලදී. ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ අනුමත කරන ලද සමාගම් හැරුණුවිට අනේවාසික පාලනය යටතේ පවත්නා සමාගම් සඳහාද රුපියල් ණය පහසුකම් ලබා දීම සඳහා බැංකු පනත යටතේ බලපත්‍ර ලත් සියළුම බැංකු සඳහාද සාමාන්‍ය අවසරය ලබා දීම, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (නේ.වි.ව්‍ය.මු.) ගිණුම් පවත්වාගෙන යාම සඳහා අවම වශයෙන් එ.ජ. ඩොලර් 500 ක් හෝ ඒ හා සමාන වටිනාකමකින් යුත් අනුමත වෙනත් විදේශ මුදල් ප්‍රමාණයක් තබාගත යුතුය යන අවශ්‍යතාවය ඉවත් කිරීම සහ ශ්‍රී ලංකා විගාමිකයින් හා අනේවාසිකයින් විසින් පවත්වාගෙන යනු ලබන ආවෘත අරමුදල් සඳහා පොළී ඉපැයීමට සහ එවැනි පොළී මුදල් ප්‍රේෂණය කිරීමට අවසරය ලබා දීම, විනිමය පාලනය තවදුරටත් ලිහිල් කිරීම සඳහා ගනු ලැබූ පියවරයන් විය. විදේශ සංචාරයන් සඳහා එ.ජ. ඩොලර් 5,000 කට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් එම මුදල් වර්ගයෙන් හෝ අනුමත වෙනත් විදේශීය මුදල් වර්ගයකින් හෝ මිලදී ගැනීමට අයදුම් කිරීමේදී, ආදායම් බදු ලිපිගොනු අංකය සඳහන් කිරීමේ අවශ්‍යතාවය හඳුන්වා දීම සහ ශ්‍රී ලංකා නේවාසිකයින් විසින් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් (වි.අ.පැ.) උපයෝගී කරගෙන විදේශයන්හිදී කරනු ලබන විදේශ විනිමය ගෙවීම් මෙහෙයුම් සඳහා වාර්තා කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමද, මෙහෙයුම් වැඩපිළිවෙල ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග කිහිපයකි.

පෙර වර්ෂයේ දී මෙන්ම, විනිමය පාලන දෙපාර්තමේන්තුව ප්‍රාග්ධන ගණුදෙනු, විදේශීය ආයෝජන, අනේවාසිකයින් සහ ශ්‍රී ලංකා විගාමිකයින්ගේ ආවෘත අරමුදල්, පෞද්ගලික විදේශීය ණය ගැනීම්, ජංගම ජාත්‍යන්තර ගණුදෙනු මෙහෙයුම්, නැව් ඉඩපහසුකම් වෙන්කරන්නන් ලියාපදිංචි කිරීම, විදේශ මුදල් මාරු කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම සහ විදේශිකයින්ට සපයනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් ගෙවීම් භාර ගැනීම සඳහා බලය ලත් හෝටල් කරුවන්, ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියන් සහ අනෙකුත් අය සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා අළුත්කිරීම වැනි ක්‍රියාකාරකම්හි තවදුරටත් නියැලුණි.

## (1) ප්‍රාග්ධන ගණුදෙනු

### (අ) අනේවාසික පාලිත සමාගම් සඳහා රුපියල් ණය

අනේවාසිකයින් විසින් පාලනය කරනු ලබන සමාගම් සඳහා රුපියල් ණය පහසුකම් ලබා දීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමේ අරමුණින් විනිමය පාලන පනතේ විධිවිධාන අනුව ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි ජේදය යටතේ අනුමත සමාගම් හැරුණුවිට, වැඩි කොටස් ප්‍රමාණයක් අනේවාසිකයින් සතු ශ්‍රී ලාංකික සමාගම් සඳහා ණය සහ අත්තිකාරම් සැපයීම සඳහා බැංකු පනත යටතේ බලපත්‍ර ලත් සියළුම බැංකු සඳහා සාමාන්‍ය බලය පවරන ලදී. ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි ජේදය යටතේ, අනුමත කරන ලද අනේවාසික පාලිත සමාගම් විසින් ඉදිරිපත් කළ රුපියල් ණය පහසුකම් සඳහා වූ අයැදුම්පත් දෙපාර්තමේන්තුව විසින් එකින් එක සලකා බලන ලදී.

### (ආ) නේවාසික සමාගම් විසින් කරනු ලබන විදේශ ණය ගැනීම්

ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ අනුමත සමාගම් සහ විනිමය පාලන පනතේ විධිවිධානයන්ගෙන් නිදහස් වූ සමාගම් වලින් පරිබාහිර වූ අනෙකුත් සමාගම් විසින් විදේශ රට වලින් විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සලකා බැලීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරන ලදී. වර්ෂය තුළ විදේශ ණය ගැනීම් වෙනුවෙන් ඉදිරිපත් වූ අයැදුම්පත් තුනක් සඳහා අනුමැතිය දෙන ලදී.

### (ඇ) ශ්‍රී ලංකාවේ අනේවාසික ආයෝජන

1992 ජූනි මස 29 වැනි දින අංක 721/4 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පරිදි සාමාන්‍ය අනුමැතියට යටත් නොවන, අනේවාසිකයින් විසින් ශ්‍රී ලංකාවේ කරනු ලබන, ආයෝජන කාණ්ඩයට ගැනෙන කොටස් විකුණුම් ආදායම වැනි ප්‍රාග්ධන පැවරුම් සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව තවදුරටත් අනුමැතිය ලබා දෙන ලදී.

### (ඈ) ශ්‍රී ලාංකික නේවාසිකයින් විසින් විදේශයන්හි කරනු ලබන ආයෝජන

ශ්‍රී ලාංකික නේවාසිකයින් විසින් විදේශ ව්‍යාපෘතීන්හි කරනු ලබන ආයෝජන සම්බන්ධ ප්‍රාග්ධන පැවරුම් ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමියගේ අනුමැතිය මත එක් එක් ඉල්ලීම වෙන වෙනම අධ්‍යයනය කර, අනුමැතිය දීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් දිගටම කරගෙන යනු ලැබීය. 1999 වර්ෂය තුළ විදේශීය රටවල් කිහිපයකින් ව්‍යාපෘති 12 ක ආයෝජනයන් සඳහා ලද අයදුම්පත් අනුමත කරන ලද අතර මෙම ආයෝජනයන්හි මුළු වටිනාකම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 24.4 ක් විය.

### (ඉ) ශ්‍රී ලාංකික විගාමිකයින් සහ විදේශිකයින් සතු ආවෘත අරමුදල්

ශ්‍රී ලාංකික විගාමිකයින් සහ විදේශිකයින් සතු

ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද අරමුදල් ආවෘත ගිණුම්වල තවදුරටත් රඳවා ගනු ලැබූ අතර කෙනෙකුට රු. 750,000 ක් වශයෙන් සහ පවුලකට රුපියල් දශ ලක්ෂ 1.0 ක උපරිමයකට යටත්ව වාණිජ බැංකු මගින් මුදා හැරීම සඳහා අවසර දෙන ලදී. 1999 වසර තුළ අයදුම්පත් 86 ක් මගින් කරනු ලැබූ ඉල්ලීම් මත රුපියල් දශ ලක්ෂ 48.0 ක් වූ ආවෘත අරමුදල් මුදා හැරීම සඳහා අනුමැතිය දෙන ලදී. 1999 දී වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලැබූ ආවෘත අරමුදල් සඳහා පොළී ගෙවීමටද, එම ගෙවිය යුතු පොළී, ගිණුම් හිමියන්ට ප්‍රේෂණය කිරීමටද අවසර දෙන ලදී.

## (2). නැව් ඉඩපහසුකම් වෙන්කරන්නන් ලියාපදිංචි කිරීම සහ විදේශ විනිමය ගණුදෙනු සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

නැව් ඉඩපහසුකම් වෙන්කරන්නන් ලියාපදිංචි කිරීම, විදේශ මුදල් මාරු කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම/අළුත් කිරීම, සංචාරකයින් සඳහා සපයනු ලබන සේවාවන් සඳහා විදේශ මුදල් ගෙවීම් භාර ගැනීම සඳහා හෝටල්, බදු රහිත සාප්පු, සංචාරක නියෝජිතයින් ආදී ආයතනයන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීමද විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් දිගටම ක්‍රියාත්මක කරන ලදී. ඉකුත් වසරේ මෙන්ම නැව් ඉඩපහසුකම් වෙන්කරන්නන්ගේ කටයුතු සහ බලපත්‍ර ලද ආයතන විසින් කළ විදේශීය විනිමය ගණුදෙනු පිළිබඳව විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් කටයුතු සිදුකරණු ලැබිණි.

### (අ) සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා සංචාරක නියෝජිතයින් වෙත බලය පැවරීම.

විදේශ ගමන්වල යෙදෙන ශ්‍රී ලාංකිකයන්ට සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා සංචාරක නියෝජිතයන් වෙත 1999 වසරේදී නව බලපත්‍ර නිකුත් නොකෙරිණි. මේ අනුව සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා බලය ලත් සංචාරක නියෝජිත ආයතන ගණන 6 ක්ව පැවතුනි.

### (ආ) විදේශ මුදල් මාරු කරන්නන් පත්කිරීම

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ විදේශ මුදල් මාරු කරන්නන් පත් කිරීමේ පටිපාටියෙහි වෙනසක් කරන ලදී. මේ අනුව යටත් පිරිසෙයින් ගෙවන ලද නිකුත් කළ ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 1.0 ක් සහිත සතුටුදායක කල්පැවැත්මක් ඇති ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම් පමණක් මුදල් මාරු කරන්නන් වශයෙන් පත්කිරීම සම්බන්ධයෙන් සළකා බැලීම සඳහා සුදුසුකම් ලබා ඇත. 1999 වර්ෂය අවසානයට අනුමත විදේශ මුදල් මාරු කරන්නන් 30 දෙනෙක් ලියාපදිංචි විය.

## (3). මෙහෙයුම්

විනිමය පාලනය ලිහිල් කිරීමත් සමගම ජංගම ගණුදෙනු සඳහා විනිමය මුදා හැරීමේදී ඉල්ලුමෙහි ඇති නිර්ව්‍යාජත්වය සලකා බලා නිවැරදිව විනිශ්චය කර සෑහීමකට පත් වීමෙන් අනතුරුව කිසිම බාධාවකින් තොරව විනිමය මුදා හැරීම සඳහා බලයලත් වෙළඳුන් හා අනුමත සංචාරක නියෝජිතයින් වෙත බලය පවරන ලදී.

මුදා හරිනු ලබන සියළුම විදේශ විනිමය පිළිබඳ තොරතුරු බලය ලත් වෙළෙඳුන් සහ අනුමත සංචාරක නියෝජිතයින් විසින් එම ගණුදෙනුවල මෙහෙයුම් කටයුතු සඳහා නොකඩවා විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු විය. විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් පිළිබඳව නිශ්චිත මෙහෙයුම් ප්‍රතිපත්තියක් නොතිබූ බැවින්, වි.අ.පැ. කාඩ්පත් උපයෝගී කරගෙන ශ්‍රී ලංකා නේවාසිකයින් විසින් විදේශයන්හිදී කරනු ලබන ගෙවීම් සඳහා මුදා හරිනු ලබන විදේශ විනිමය පිළිබඳ තොරතුරු බලය ලත් වෙළෙඳුන් විසින් විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු නොලැබීය. එමනිසා විදේශ සංචාර සඳහා විදේශීය ව්‍යවහාර මුදල් සහ සංචාරක චෙක්පත් නිකුත් කිරීමේදී අනුගමනය කළ වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටියට සමාන, වාර්තා කිරීමේ ක්‍රමයක් විද්‍යුත් අරමුදල් කාඩ්පත් මගින් මුදා හරිනු ලබන විදේශීය විනිමය සඳහාද හඳුන්වා දෙනු ලැබීය. මේ අනුව 1999 දෙසැම්බර් 17 වැනි දින සිට ශ්‍රී ලාංකික නේවාසිකයින් වෙත එතෙර භාවිතය සඳහා නිකුත් කරනු ලබන සියළුම වි.අ.පැ. කාඩ්පත් පිළිබඳ විස්තර විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළයුතු විය. මේ හැරුණුවිට එ.ජ. ඩොලර් 5,000 කට වැඩි මුදලක් හෝ ඒ හා සමාන වෙනත් මුදල් වර්ගයකින් එතෙරදී කාඩ්පත් මගින් විදේශ විනිමය වැය කරනු ලබන සියළුම කාඩ්පත් හිමියන් පිළිබඳ මාසික වාර්තාවක්ද සියළුම බලය ලත් වෙළෙඳුන් විසින් විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු විය.

ආනයන සඳහා කලින් කරන ලද විනිමය ගෙවීම්වලට අදළ භාණ්ඩ හා සේවා ලැබුණේද යන්න තහවුරු කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධ අත්තිකාරම් ගෙවීම් පිළිබඳ මෙහෙයුම් කටයුතු විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. විදේශීය ප්‍රධානීන් වෙනුවෙන් නැව් සහ ගුවන් සේවා නියෝජිතයින් මෙන්ම නැව් ඉඩපහසුකම් වෙන්කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන ජංගම රුපියල් ගිණුම්වල හර කිරීම් සහ බැර කිරීම්හි මෙහෙයුම් කටයුතු කරගෙන යනු ලැබීය. කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් තුළින් කරන ලද ප්‍රාග්ධන සංක්‍රාමයන් ද විනිමය පාළන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයුමට ලක් කරන ලදී.

## (4) විමර්ශනය

ඇතැම් නේවාසික හා අනේවාසික සමාගම් සහ ඇතැම් පුද්ගලයින් විසින් විනිමය පාලන පනතේ විවිධවිධාන උල්ලංඝණය කිරීමේ අවස්ථා කිහිපයක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. වරද කරුවන් සඳහා දඩ නියම කිරීම් සිදු කළ අතර වසර තුළ පනවන ලද එවැනි දඩ මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 28.0 ක් විය. 1999 වර්ෂයෙහි අරඹන ලද ඇතැම් විමර්ශන කටයුතු තවමත් අවසන් කොට නොමැත.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාණ්ඩුවේ දේශීය රාජ්‍ය ණය නිකුත් කිරීම, කළමනාකරණය, සේවාකරණය සහ විදේශීය ණය සේවාකරණය මහ බැංකුව වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් මෙම කටයුතු කරනු ලැබේ. මෙලෙස පැවරී ඇති වගකීම් ඉටු කරනු වස් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රුපියල් ණය, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දේශීය ණය උපකරණ නිකුත් කිරීම 1999 වර්ෂයේදී අඛණ්ඩව සිදු කරනු ලැබීය. රාජ්‍ය ණය නිකුත් කිරීම හා සේවාකරණයට අමතරව, මූල්‍ය උපකරණයක් ලෙස සැලකෙන මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා සේවාකරණය පිළිබඳ කටයුතුද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. කෙසේ වුවද, 1999 වර්ෂය තුළදී මහ බැංකු සුරැකුම්පත් නිකුත් නොකෙරුණි. බඳු සංචිත සහතිකපත්වලට අදළ සේවාකරණ කටයුතු සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ණයකර නිකුත් කිරීමට අදළ කටයුතුද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

## සංවර්ධන කටයුතු

1999 වර්ෂය තුළදී දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ තවදුරටත් දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. ණය සුරැකුම්පත් වෙළඳපොළේ ඇති වන වෙනස්කම් පිළිබඳ තොරතුරු අඛණ්ඩ ලෙස හුවමාරු කර ගැනීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් සමග නිරන්තර රැස්වීම් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

1998 ජූනි මාසයේදී පරීක්ෂණ පදනමක් මත හඳුන්වා දෙන ලද විද්‍යුත් මාධ්‍ය ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමය 1999 මැයි මාසයේ සිට නිල වශයෙන් ක්‍රියාත්මක වීම ආරම්භ විය. මේ ක්‍රමය මගින්ම භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ප්‍රාථමික වෙන්දේසිවල ප්‍රතිඵල නිකුත් කිරීමද සිදු කරන ලදී.

රාජ්‍ය ණය සුරැකුම් පිළිබඳව ද්විතීයික වෙළඳපොළ කටයුතු වඩාත් ක්‍රියාකාරී කිරීමේ අරමුණින් එක්තරා ප්‍රමාණයකට ලේඛන රහිත වූ සුරැකුම්පත් ක්‍රමයක් හඳුන්වා දීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මෙම ක්‍රමය සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලදී. මෙම ක්‍රමය තුළින් සුරැකුම්පත් විකිණීම හා මිලදී ගැනීම, ප්‍රති මිලදී ගැනුම් හා ප්‍රතිවර්තිත මිලදී ගැනීම් පිළිබඳ ගණුදෙනු සහ සුරැකුම්පත් ණය වශයෙන් දීම හා ලබා ගැනීම් සම්බන්ධ කටයුතු සඳහා අවකාශ සලසනු ඇත. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කිරීමට අපේක්ෂිත මධ්‍යම තැන්පතු ක්‍රමය (Central Depository System) බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ ගණුදෙනු පියවීමේ ක්‍රමය හා සෘජු සම්බන්ධතාවයකින් ක්‍රියාත්මක වනු ඇත. පරිගණක මෘදුකාංග ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය සඳහා ආදර්ශ සංචිතයක් භාවිතයෙන් මෙම ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම 1999 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. යම් ප්‍රමාණයකට ලේඛණ රහිත වූ තැන්පතු ක්‍රමය හා ඊට අදළ වෙළඳ කටයුතු වාර්තා කිරීමේ ක්‍රමය පිළිබඳ ක්‍රියාත්මක වීමේ උපදෙස් සකස් කර ඒවා ප්‍රාථමික අලෙවිකරුවන් වෙත නිකුත් කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළදී සිදු කරන ලදී. තවද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් සමග එක්ව විද්‍යුත්මය පූර්ව-අන්ත වෙළඳ ගණුදෙනු හෙවත් පරිගණක ආශ්‍රිත තැරැව්කරු (Electronic Front - End Trading/ Screen Broker System) ක්‍රමය ප්‍රාථමික අලෙවිකරුවන් අතර හඳුන්වා දීම සඳහා මූලික පියවර ගනු ලැබිණි.

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය උපකරණ හා සම්බන්ධ ප්‍රාථමික නිකුතු හා ද්විතීයික වෙළඳපොළේ අලෙවි කටයුතු වැඩි දියුණු කිරීමට අදළ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමේ කටයුතුවල නිරත විය. ඊට අදළ එක් කටයුත්තක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ දින ගණනය කිරීමේ පදනම (Day count Basis) අන්තර් ජාතික පදනමට අනුෂංගිකව සිදු කිරීම 1999 ඔක්තෝබර් මස සිට ආරම්භ කෙරිණි. මේ අනුව ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ද්වයම සඳහා සත්‍ය දින/දින 364 යන දින ගණන් ගැනීමේ පදනම භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනු සඳහා හඳුන්වා ගන්නා ලදී. මෙතෙක් පරිණත කාලය මාස 3, මාස 6 හා මාස 12 වශයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් වෙනුවට දින 91, දින 182 හා දින 364 යන කාලසීමාවන් යටතේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මෙම පදනම මත ආරම්භ විය. මෙම ඒකීය භාවිතය සමස්ථ වෙළඳපොළ තුළම ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ද්විතීයික වෙළඳපොළ තුළදීද නව දින ගණනය කිරීමේ ක්‍රමය (සත්‍ය දින/දින 364) ප්‍රාථමික වෙළෙඳුන් විසින් යොදා ගනු ඇතැයි අපේක්ෂා කෙරිණි. මීට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් පරිණත කාලය මාස 3, මාස 6 සහ මාස 12 ලෙසින්ම ඒවා පරිණත වනතුරු වෙළඳපොළ තුළ පවතිනු ඇත. ප්‍රාථමික වෙළඳපොළේ භාණ්ඩාගාර බිල්පත්වලට අදළ ඵලද අනුපාතිකය ගණනය කිරීමේ ක්‍රියාදමයද ආදියද නව පදනමට සමානව සංශෝධනය කෙරිණි.

රාජ්‍ය ණය වෙළඳපොළ කටයුතු පිළිබඳ දත්ත පදනම සඳහා අළුත් දත්ත රැස් කිරීම හා පවත්වාගෙන යාම නොකඩවා සිදු කෙරිණි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් මෙම දත්තයන් විශ්ලේෂණය කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. රාජ්‍ය ණය සුරැකුම් පිළිබඳව මහජනතාවගේ අවබෝධය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය තුළින් පළකරනු ලබන පුවත්පත් නිවේදන මගින් නොකඩවා තොරතුරු ප්‍රකාශයට පත් කරනු ලැබිණි. එමෙන්ම මෙම දත්ත වෙළඳපොළ කටයුතු මෙන්ම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ

කාර්ය සාධනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය දර්ශකයන් සකස් කිරීම සඳහාද යොද ගනු ලැබිණි. මුළු වෙළඳපොළට අදාලව තම තත්වය තහවුරු කර ගැනීම සඳහා ද මෙම තොරතුරු ප්‍රාථමික වෙළෙඳුන්ට උපකාරී විය. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්ය සාධනය පිළිබඳව සිදු කරන වාර්ෂික විශ්ලේෂණ සඳහාද මෙම දත්ත පදනම 1995 සිට භාවිතා කරනු ලැබිණි.

1999 වර්ෂය තුළදී රාජ්‍ය ණය සුරැකුම් පිළිබඳව මහජනතාව හා ආයතනික ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාදේශීය කාර්යාල තුන හා ඒකාබද්ධව වැඩමුළු කීපයක් සංවිධානය කරන ලදී. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය (USAID) හා එක්ව දින භාගයකින් යුතු වැඩ මුළු දෙකක් ප්‍රාථමික අලෙවිකරුවන් හා ආයතනික ආයෝජකයන් සඳහා පවත්වන ලදී.

1999 දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විදේශ උපදේශකවරයෙකුගේ සහාය ලබා ගන්නා ලද අතර, ඔහු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්, ප්‍රාථමික වෙළෙඳුන් සහ ආයතනික ආයෝජකයන් සඳහා පුහුණු වැඩමුළු කීපයක් පවත්වනු ලැබීය. තවද ප්‍රාථමික අලෙවිකරුවන් නිරීක්ෂණය කිරීමේ ක්‍රමයක් සකස් කිරීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව උපදේශක සේවාවක් ලබා ගැනීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගනු ලැබිණ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත වෙළඳපොළ කටයුතු හා දේශීය ණය කළමනාකරණය වැඩි දියුණු කිරීමේ අරමුණින් 1999 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙතෙක් පැවති මූල්‍ය මෙහෙයුම් ඒකකය වෙනුවට ද්‍රවශීලතා ඇගයීම් කමිටුව, විවෘත වෙළඳපොළ කටයුතු පිළිබඳ කමිටුව සහ දේශීය ණය කළමනාකරණ කමිටුව යනුවෙන් කමිටු 3 ක් පිහිටුවන ලදී. රාජ්‍ය ණය අධිකාරී විසින් ප්‍රධානත්වය දරන දේශීය ණය කළමනාකරණ කමිටුවට රජයේ ණය පිරිවැය අවම වන පරිදි දේශීය ණය කළමනාකරණය කිරීමේ වගකීම පවරන ලදී. ණය අවශ්‍යතාවයන් සහ දේශීය රාජ්‍ය ණය ප්‍රමාණය, එහි සංයුතිය සහ දේශීය රාජ්‍ය ණය උපකරණ නිකුත් කිරීමේදී පරිණත කාලසීමාව ආදිය පිළිබඳ තීරණ ගැනීම පිණිස භාණ්ඩාගාර මූල්‍ය ප්‍රවාහය විමර්ශනය කිරීම සඳහා සතියකට වරක් මෙම කමිටුව රැස් වනු ඇත.

රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළ තවදුරටත් දියුණු කිරීමේ අරමුණින් ප්‍රාථමික වෙළඳ කටයුතු එම කාර්ය සඳහාම කැප වූ නෛතික ආයතන රටාවක් යටතට පැවරීමටත්, මෙම ආයතන රුපියල් දශ ලක්ෂ 150 ක මූලික ප්‍රාග්ධනයකින් සමන්විත විය යුතු බවටත් තීරණය කරන ලදී. ඒ අනුව, වාණිජ බැංකු 7 කින් හා බැංකු නොවන මූල්‍ය ආයතන 7 කින් යුක්ත වූ ප්‍රාථමික වෙළෙඳුන් 14 ක් විසින් ප්‍රාථමික අලෙවි කාර්ය සඳහාම කැප කරන ලද ප්‍රාග්ධනයක් සහිතව රජයේ සුරැකුම්පත් සඳහා වෙන් වූ නෛතික ආයතන පිහිටුවීම සඳහා එකඟ වන ලදී. ලියාපදිංචි ව්‍යාපාර වස්තු සහ සුරැකුම්පත් පනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් පනතට අනුව ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කළයුතු රෙගුලාසි හා ඒ යටතේ නිකුත් කළයුතු මාර්ගෝපදේශ මාලාවක් කෙටුම්පත් කරන ලද අතර, ප්‍රාථමික වෙළෙඳුන් පත් කිරීම සඳහා අවශ්‍ය නිර්නායකද වර්ෂය තුළදී සකස් කරන ලදී. 1999 අවසානයේදී ප්‍රාථමික වෙළෙඳුන් සංඛ්‍යාව 18 ක් ලෙස නොවෙනස්ව පැවති අතර, වාණිජ බැංකු 11 ක් හා වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතන 7 ක් වශයෙන් වූ එහි සංයුතියද නොවෙනස්ව පැවතුණි.

වෙළඳපොළ වෙත වඩාත් නැඹුරුවූ රාජ්‍ය ණය සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා පියවර ගන්නා ලද අතර මේ යටතේ 1999 දී දේශීය ණය වලින් සැළකිය යුතු ප්‍රතිශතයක් භාණ්ඩාගාර බැඳුම්කර වශයෙන් නිකුත් කරන ලදී. අලෙවි කළහැකි, කූපන් සහිත, මැදි හා දිගුකාලීන, අති සුරක්ෂිත ස්වරූපයෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රථමයෙන් හඳුන්වා දුන්නේ 1997 මාර්තු මාසයේදීය. 1999 දී අවුරුදු 2 සිට 6 දක්වා වූ පරිණත කාල පරාසයකින් යුක්ත වූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලද අතර වර්ෂ 5 හා 6 කින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රථම වරට නිකුත් කිරීම විශේෂ ලක්ෂණයක් විය. දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම තුළින් දිගුකාලීන ණය සුරැකුම්පත් වෙළඳපළේ වඩා ස්ථායීතාවක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1997 ප්‍රථම නිකුත් කිරීම කළ අවස්ථාවේ සිට භාණ්ඩාගාර බැඳුම්කර කෙටි කාලසීමාවක් තුළ ආයෝජන සඳහා වඩා ප්‍රචලිත ණය සුරැකුමක් බවට පත් වූ අතර, ද්විතීයික වෙළඳපොළේ ප්‍රාථමික වෙළෙඳුන් අතර ගණුදෙනු සඳහා නම්‍ය උපකරණයක් බවට පත්ව ඇත. වෙළඳපොළ සාධක මත ප්‍රාථමික හා ද්විතිය වෙළඳපළවල තීරණය වූ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ඵලද අනුපාත දිගුකාලීන ඵලද වක්‍රයක් නිර්මානය කිරීම සඳහා දායක වූ අතර, එය සාංගමික ණය සුරැකුම්පත් සඳහා පදනම් පොලී අනුපාතිකයක් විය.

## මෙහෙයුම් කටයුතු

නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණය 1999 වර්ෂය අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 1,004,822 ක් වූ අතර එය 1998 වර්ෂය හා සසඳනවිට රුපියල් දශ ලක්ෂ 117,271 ක් හෙවත් සියයට 13.2 ක වර්ධනයක් පෙන්නුම් කළේය. නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 491,937 (සියයට 49) ක් දේශීය ණය වූ අතර රුපියල් දශ ලක්ෂ 512,885 (සියයට 51) ක් විදේශ ණය වලින් සමන්විත විය. 1998 වසර හා සසඳ බලන කළ 1999 වසරේදී නොපියවූ දේශීය ණය රුපියල් දශ ලක්ෂ 72,437 කින් හෙවත් සියයට 17.3 කින් සහ නොපියවූ විදේශ ණය රුපියල් දශ ලක්ෂ 44,834 කින් හෙවත් සියයට 9.6 කින්ද වැඩි වීමක් පෙන්නුම් කළේය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සේවාකරණය කරනු ලැබූ රාජ්‍ය

ණයෙහි සංයුතිය II-18 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

**II - 18 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය ණය සංයුතිය**

| වර්ගය | 1998 අවසානයට | | 1999 අවසානයට | |
|---|---|---|---|---|
| | (රු.ද.ල.) | % | (රු.ද.ල.) | % |
| දේශීය රාජ්‍ය ණය | 419,500 | 47.3 | 491,937 | 49.0 |
| භාණ්ඩාගාර බිල්පත් | 119,996 | | 124,996 | |
| රුපියල් සුරැකුම්පත් | 250,570 | | 262,056 | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 48,915 | | 104,867 | |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 12 | | 11 | |
| බදු සංචිත සහතිකපත් | 7 | | 7 | |
| විදේශීය ණය | 468,051 | 52.7 | 512,885* | 51.0 |
| එකතුව | 887,551 | 100.0 | 1,004,822 | 100.0 |

* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## දේශීය ණය

### ප්‍රාථමික වෙළඳපොළ

### භාණ්ඩාගාර බිල්පත්

1998 වර්ෂය අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 119,996 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල නොපියවන ලද මුළු වගකීම් ප්‍රමාණය 1999 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 124,996 ක් විය. මෙම වැඩි වීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 5,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නව නිකුත් කිරීම්වල ප්‍රතිඵලයකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව රුපියල් දශ ලක්ෂ 125,000 ක් ලෙස 1999 වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි.

රාජ්‍ය ණය, බැංකු කටයුතු හා ආර්ථික පර්යේෂණ යන දෙපාර්තමේන්තු මගින් සේවාකරණය කරනු ලැබූ මූල්‍ය මෙහෙයුම් ඒකකය මගින් ප්‍රාථමික වෙළෙඳපොළට සතිපතා ඉදිරිපත් කරන බිල්පත් ප්‍රමාණය, එහි පරිණත කාල රටාව, මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් පූර්ව වෙනස් කිරීම් පිළිබඳව තීරණ ගැනීම 1999 නොවැම්බර් මාසය අවසානය දක්වා නොකඩවා සිදු කරගෙන යන ලදී. ප්‍රාථමික වෙන්දේසිවලදී මහ බැංකුව විසින් මිළදී ගනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාල ව්‍යුහය තීරණය කිරීමද ඉහත ඒකකය මගින් සිදු විය. එසේම මෙම ඒකකය විසින් රුපියල් ණය සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ වැඩපිළිවෙල මාසිකව සැලසුම් කර ඒ සඳහා මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමද කරන ලදී. මූල්‍ය මෙහෙයුම් ඒකකයේ කටයුතු 1999 දෙසැම්බර් මාසයේ සිට අළුතින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් සිදු කරන ලදී.

සතිපතා පැවැත්වෙන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලට සහභාගී වීම ප්‍රාථමික අලෙවිකරුවන්ට හා බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතය යටතේ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට අවසර දෙන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වලට පමණක් සීමා විය. 1999 වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙන්දේසිවල මුළු විකුණුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 214,290 ක් විය. වාණිජ බැංකු ප්‍රාථමික අලෙවිකරුවෝ භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළේ ප්‍රධාන ගැණුම්කරුවන් වූ අතර, ඔවුන් විසින් මුළු විකුණුම් වලින් සියයට 62.9 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 134,745 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගනු ලැබුනි. මුළු විකුණුම් වලින් සියයට 14.0 ක් මිලදී ගත් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවෝ දෙවැනි ප්‍රධාන ගැණුම්කරුවෝ වූහ. මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් මගින් වර්ෂය තුළදී මිලදී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය මුළු ලංසු ප්‍රමාණයෙන් සියයට 4.6 ක් විය. 1999 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගන්නා ලද මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 39,725 ක් හෙවත් සියයට 18.5 ක් විය. 1999 වර්ෂයේදී පිළි ගන්නා ලද ලංසු මූලාශ්‍ර අනුව බෙදී ගිය ආකාරය II-19 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ.

**II - 19 වන සංඛ්‍යා සටහන**
**භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වලදී පිළිගත් ලංසු - 1999**

(රුපියල් දශ ලක්ෂ)

| මූලාශ්‍රය | පරිණත කාලය (මාස) | | | | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| | 3 | 6 | 12 | වෙනත් | | |
| 1. දේශීය වාණිජ බැංකු | 58,995 | 26,739 | 39,337 | - | 125,071 | 58.4 |
| රාජ්‍ය බැංකු | 46,980 | 19,317 | 22,314 | - | 88,611 | 41.4 |
| පෞද්ගලික බැංකු | 12,015 | 7,422 | 17,023 | - | 36,460 | 17.0 |
| 2. විදේශීය බැංකු | 5,577 | 1,220 | 2,877 | - | 9,674 | 4.5 |
| 3. බැංකු නොවන (අ) | 8,344 | 6,249 | 15,305 | - | 29,898 | 14.0 |
| 4. ආයතනික ආයෝජකයන් (ආ) | 4,193 | 1,753 | 3,976 | - | 9,922 | 4.6 |
| 5. මහ බැංකු මිලදී ගැනීම් | - | - | - | - | 39,725 | 18.5 |
| එකතුව | 77,109 | 35,961 | 61,495 | 39,725 | 214,290 | 100.0 |

(අ) ජා.ඉ.බැ. ඇතුළත්ව
(ආ) මහ බැංකුව මගින් කළමනාකරණය වන අරමුදල්

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා ලද රුපියල් දශ ලක්ෂ 274,953 ක් වූ මුළු ලංසු ප්‍රමාණයෙන් සියයට 78.5 ක් වාණිජ බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන්ද, සියයට 17.9 ක් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන්ද, සියයට 3.6 ක් මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලැබූ අරමුදල් වලින්ද විය.

1999 අවසානයේ පැවති නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වලින් රුපියල් දශ ලක්ෂ 61,495 ක් (සියයට 49) පරිණත කාලසීමාව මාස 12 (දින 364) බිල්පත් වූ අතර රුපියල් දශ ලක්ෂ 16,794 ක් (සියයට 14) පරිණත කාලසීමාව මාස 6 (දින 182) බිල්පත් විය. ඉතිරි සියයට 37 හෙවත් රුපියල් දශ ලක්ෂ 46,707 න් පරිණත කාලසීමාව මාස 3 (දින 91) බිල්පත් සියයට 12 ක්ද, වෙනත් පරිණත කාලසීමා සහිත බිල්පත් සියයට 25 ක්ද විය. 1999 වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු සහතිකපත් ප්‍රමාණය 78,806 ක් විය.

වර්ෂය තුළදී පරිණත කාලය මාස 3 (දින 91), මාස 6 (දින 182) සහ මාස 12 (දින 364) භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකයන් පිළිවෙලින් සියයට 11.28-11.96, 11.79-12.29 සහ 12.29-12.77 යන පරාසයන්හි උච්චාවචනය විය. පරිණත කාලසීමා අනුව වාර්ෂිකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතිකයන් II-20 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. ඉකුත් වර්ෂය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 12,398 හා සසඳනවිට මෙම වර්ෂය තුළ නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් වූ මුළු පොලී බැදීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,085 කි.

1999 දී භාණ්ඩාගාර බිල්පත් සඳහා ලද ලංසුවල අවම හා උපරිම බර තැබූ සාමාන්‍ය වාර්ෂික ඵලද අනුපාතික

II - **20** සංඛ්‍යා සටහන

**භාණ්ඩාගාර බිල්පත්හි වාර්ෂිකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතික**

(වාර්ෂිකව ප්‍රතිශතය)

| වර්ෂය | පරිණත කාලය(මාස) * | | | සමස්ත |
|---|---|---|---|---|
| | 3 | 6 | 12 | සාමාන්‍ය |
| 1995 | 16.31 | 17.43 | 17.63 | 16.84 |
| 1996 | 16.04 | 16.46 | 17.17 | 16.46 |
| 1997 | 11.03 | 11.95 | 12.29 | 11.60 |
| 1998 | 11.77 | 12.13 | 12.20 | 11.98 |
| 1999 | 11.69 | 12.03 | 12.55 | 12.06 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* පරිණත කාලසීමාව මාස 3, මාස 6 සහ මාස 12 වෙනුවට පිළිවෙලින් දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම 1999 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ විය.

මාස 3 (දින 91) බිල්පත් සඳහා සියයට 11.18 ක් හා සියයට 12.00 ක්ද, මාස 6 (දින 182) බිල්පත් සඳහා සියයට 11.60 හා සියයට 12.36 ක්ද, මාස 12 (දින 364) බිල්පත් සඳහා සියයට 11.55 ක් හා 12.87 ක්ද විය.

## රුපියල් ණය

1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 22,986 ක් වටිනාකම ඇති රුපියල් ණය 15 ක් නිකුත් කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1999 වර්ෂයේදීද රුපියල් ණය වෙනුවෙන් ප්‍රධාන දයකයෝ වූහ. මෙම ආයතනික ආයෝජකයන් තිදෙනාගෙන් ලැබුණු මුළු දයකවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,934 ක් හෙවත් සියයට 95.4 ක් විය.

වර්ෂය තුළදී, නිකුත් කළ පරිණත කාලසීමාව වර්ෂ 2, 7/8 සහ 9/10 වශයෙන් වූ රුපියල් ණය සඳහා වාර්ෂික පොලී අනුපාතික පිළිවෙලින් සියයට 12.00, සියයට 12.25 සහ සියයට 12.50 විය. මෙයින් ණය 3 ක් වර්ෂ 2 ක ස්ථිර පරිණත කාලසීමාවක් සහිතව නිකුත් කළ ණය වූ අතර, ඉතිරියෙන් ණය 7 ක් වර්ෂ 7/8 කින්ද, ණය 5 ක් වර්ෂ 9/10 කින්ද වශයෙන් වූ වෛකල්පික කාලසීමාවන් සහිතව නිකුත් කළ ඒවා විය. නිකුත් කරන ලද හා ගෙවා නිම කරන ලද රුපියල් ණය පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව II-21 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

II - **21** සංඛ්‍යා සටහන

**රුපියල් ණය නිකුත් කිරීම සහ ආපසු ගෙවීම - 1999**

| වාර්ෂික පොලී අනුපාතිකය (සියයට) | පරිණත කාලය (වර්ෂ) | ණය සංඛ්‍යාව | නිකුත් කළ ප්‍රමාණය (රු.ද.ල.) |
|---|---|---|---|
| **නිකුත් කිරීම්** | | | |
| 12.00 | 2 | 3 | 7,486 |
| 12.25 | 7-8 | 7 | 8,500 |
| 12.50 | 9-10 | 5 | 7,000 |
| එකතුව | | 15 | 22,986 |
| **ආපසු ගෙවීම්** | | | |
| 14.00 | 5 | 1 | 3,000 |
| 14.00 | 2 | 1 | 3,000 |
| 13.10 | 2 | 1 | 2,500 |
| 15.00 | 5 | 1 | 3,000 |
| එකතුව | | 4 | 11,500 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 11,500 ක් වටිනා රුපියල් ණය 4 ක් ආපසු ගෙවන ලදී. ඒ අනුව, රුපියල් දශ ලක්ෂ 11,486 ක රුපියල් ණය සඳහා වූ ශුද්ධ දයකවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් නොපියවූ රුපියල් ණය වගකීම් ප්‍රමාණය 1998 අවසානයේ පැවති රුපියල් දශ ලක්ෂ 250,570 සිට 1999 අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 262,056 දක්වා වැඩි විය. නොපියවූ රුපියල් ණය වගකීම්වල පරිණත කාල රටාව II-22 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

II - **22** සංඛ්‍යා සටහන

**1999 අවසානයේදී රුපියල් ණයවල පරිණත කාල රටාව**

| පරිණත කාලසීමාව (වර්ෂ) | වටිනාකම (රු.ද.ල.) | ප්‍රතිශතය |
|---|---|---|
| 2 | 7,485 | 2.9 |
| 3 | 15,000 | 5.7 |
| 4 | 5,000 | 1.9 |
| 5 | 10,000 | 3.8 |
| 6 | 5,500 | 2.1 |
| 10 | 5,980 | 2.3 |
| 30 | 24,088 | 9.2 |
| 4-5 | 5,500 | 2.1 |
| 4-6 | 10,317 | 3.9 |
| 4-8 | 3,500 | 1.3 |
| 5-6 | 20,878 | 8.0 |
| 5-7 | 53,715 | 20.5 |
| 6-7 | 38,800 | 14.8 |
| 6-8 | 1,000 | 0.4 |
| 7-8 | 26,400 | 10.1 |
| 8-10 | 1,000 | 0.4 |
| 9-10 | 8,500 | 3.2 |
| 1-10 | 19,393 | 7.4 |
| එකතුව | 262,056 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 32,803 ක් වූ රුපියල් ණය සඳහා වූ පොලී ගෙවීම් ප්‍රමාණය ඊට පෙර වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 33,086 සමග සසඳනවිට රුපියල් දශ ලක්ෂ 283 ක (සියයට 0.9 ක) සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.

## භාණ්ඩාගාර බැඳුම්කර

1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 63,452 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. මෙම බැඳුම්කර අවුරුදු 2-6 කල් පිරීමේ කාලසීමා වලින් යුක්ත විය. වර්ෂය තුළදී වෙන්දේසි 62 ක් පවත්වන ලද අතර, මෙම වෙන්දේසි වසර 2 කින් කල් පිරෙන නිකුතු 13 කින්ද, වසර 3 කින් කල් පිරෙන නිකුතු 23 කින්ද, වසර 4 කින් කල් පිරෙන නිකුතු 18 කින්ද, වසර 5 කින් කල් පිරෙන නිකුතු 7 කින්ද, වසර 6 කින් කල් පිරෙන එක් නිකුතුවකින්ද සමන්විත විය. නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර, කල් පිරීමේ කාලසීමාව අනුව II-23 වන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

II - 23 සංඛ්‍යා සටහන
**භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාල රටාව අනුව**

| කල් පිරීමේ කාලසීමාව වර්ෂ | ප්‍රමාණය රු.ද.ල. | ප්‍රතිශතය |
|---|---|---|
| 2 | 11,100 | 17.5 |
| 3 | 26,448 | 41.7 |
| 4 | 18,904 | 29.8 |
| 5 | 6,000 | 9.4 |
| 6 | 1,000 | 1.6 |
| එකතුව | 63,452 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙන්දේසියක් පැවැත්වීමට පෙරාතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම වෙන්දේසියෙන් නිකුත් කෙරෙන භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාල කූපන් අනුපාතික ප්‍රකාශයට පත් කරන ලදී. කල් පිරීමේ කාලසීමාව වසර 2-6 දක්වා වූ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ වාර්ෂික කූපන් අනුපාත සියයට 11.00-12.00 දක්වා වූ පරාසයක විය. 1999 දී පවත්වනු ලැබූ සියළුම භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා අධි දායකත්වයක් ලැබුණු අතර, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 151,942 ක් විය. තරඟකාරී ලංසු සඳහා තීරණය වූ බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කළමනාකරණය කරනු ලබන අරමුදල් වලින් ලැබුණු ලංසු ප්‍රමාණයවූ රුපියල් දශ ලක්ෂ 1,600 සඳහා ගෙවන ලදී. 1999 වර්ෂය තුළ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික නිකුතු පිළිබඳ තෝරා ගත් තොරතුරු II-24 වන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

II - 24 සංඛ්‍යා සටහන
**භාණ්ඩාගාර බැඳුම්කරවල තෝරා ගත් තොරතුරු-1999**

| කාණ්ඩය | කල් පිරීමේ කාලසීමාව (අවුරුදු) | ලැබුණු ලංසු ප්‍රමාණය (රු.ද.ල.) | පිළිගත් ලංසු ප්‍රමාණය (රු.ද.ල.) | බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය (වර්ෂයකට සියයට) | කූපන් අනුපාතිකය (වර්ෂයකට සියයට) |
|---|---|---|---|---|---|
| 11.00% 2001 අ | 2 | 14,415 | 5,000 | 13.12-13.52 | 11.00 |
| 11.00% 2001 ආ | 2 | 7,655 | 3,000 | 12.75-13.17 | 11.00 |
| 11.00% 2001 ඇ | 2 | 7,516 | 2,000 | 12.75-13.15 | 11.00 |
| 11.00% 2001 ඇ | 2 | 2,885 | 1,100 | 12.89-12.97 | 11.00 |
| 11.25% 2002 අ | 3 | 10,157 | 6,000 | 13.02-13.43 | 11.25 |
| 11.25% 2002 ආ | 3 | 11,841 | 5,000 | 13.38-13.77 | 11.25 |
| 11.25% 2002 ඇ | 3 | 7,708 | 5,000 | 13.56-13.80 | 11.25 |
| 11.25% 2002 ඇ | 3 | 9,338 | 3,500 | 13.54-13.97 | 11.25 |
| 11.25% 2002 ඉ | 3 | 13,554 | 5,000 | 12.94-13.41 | 11.25 |
| 11.25% 2002 ඊ | 3 | 6,672 | 1,948 | 12.95-13.39 | 11.25 |
| 11.50% 2003 අ | 4 | 9,751 | 5,500 | 13.36-13.53 | 11.50 |
| 11.50% 2003 ආ | 4 | 7,530 | 4,000 | 13.55-13.79 | 11.50 |
| 11.50% 2003 ඇ | 4 | 6,201 | 4,000 | 13.85-14.06 | 11.50 |
| 11.50% 2003 ඇ | 4 | 6,420 | 2,500 | 13.68-13.71 | 11.50 |
| 11.50% 2003 ඉ | 4 | 14,111 | 2,904 | 13.32-13.74 | 11.50 |
| 11.75% 2004 අ | 5 | 6,815 | 4,000 | 13.97-14.03 | 11.75 |
| 11.75% 2004 ආ | 5 | 6,632 | 2,000 | 13.45-13.75 | 11.75 |
| 12.00% 2005 අ | 6 | 2,741 | 1,000 | 13.94 | 12.00 |
| එකතුව | | 151,942 | 63,452 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

බැඳුම්කර දරන්නන් විසින් ප්‍රාථමික අලෙවිකරුවන් මගින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද කූපන් පත්වලට අර්ධ වාර්ෂිකව පොලී ගෙවනු ලැබිණි. කලින් වසරේදී ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 2,108 සමග සසඳනවිට 1999 වසර තුළදී ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,487 ක් විය.

1997 දී නිකුත් කරන ලද වර්ෂ 2 කින් කල් පිරෙන රුපියල් දශ ලක්ෂ 7,500 වටිනා භාණ්ඩාගාර බැඳුම්කර 1999 වසර තුළ ගෙවා නිම කරන ලදී.

වර්ෂය තුළදී නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහතිකපත් ප්‍රමාණය 5,615 ක් විය. ඉන් 1,281 ක් වසර 2 කින්ද, 2,438 ක් වසර 3 කින්ද, 1,347 ක් වසර 4 කින්ද, 503 ක් වසර 5 කින්ද, 46 ක් වසර 6 කින්ද කල් පිරෙන ඒවා විය. අර්ධ වාර්ෂික පොලී ගෙවීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ලැබුණු කූපන්පත් ප්‍රමාණය 13,747 ක් වූ අතර, ආපසු ගෙවීම් සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබුණු භාණ්ඩාගාර බැඳුම්කර සහතිකපත් ප්‍රමාණය 387 ක් විය.

## භාණ්ඩාගාර තැන්පතු සහතික

1999 වර්ෂය තුළදී භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් නිකුත් කිරීමක් සිදු නොවිණි. වර්ෂය තුළදී ආපසු ගෙවන ලද භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1.8 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1.5 ක් මුල් මුදල් ආපසු ගෙවීම සඳහාද, රුපියල් දශ ලක්ෂ 0.3 ක් පොලී ගෙවීම සඳහාද යොදා ගැණිනි. 1999 වර්ෂය

අවසානයේදී නොපියවා පැවති භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 10.6 ක් විය.

## අනෙකුත් දේශීය ණය උපකරණ

1999 වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනයන්හි ණයකර නිකුත් කිරීම් හෝ ඒ සඳහා ආපසු ගෙවීම් සිදු නොවුණි. වර්ෂය අවසානයේදී මෙම බැඳුම්කරවල නොපියවූ ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 500, රුපියල් දශ ලක්ෂ 109 සහ රුපියල් දශ ලක්ෂ 83 ක් විය.

වර්ෂය තුළදී බදු සංචිත සහතිකපත්වල ආපසු ගෙවීමක් හෝ පොලී ගෙවීමක් සිදු නොවූ අතර, මෙම සහතිකපත්වල නොපියවූ ශේෂය 1999 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 7.2 ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

## ද්විතීයික වෙළඳපොළ

භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළඳපොළ 1999 වර්ෂය තුළදී සැළකිය යුතු ලෙස පුළුල් විය. ප්‍රාථමික අලෙවිකරුවන් අතරද, ඔවුන් හා ගණුදෙනුකරුවන් අතරද භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර අයිතිය පැවරීමේ මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු මෙන්ම, ප්‍රති මිලදී ගැනීම් හා ප්‍රතිවර්තිත මිලදී ගැනීම් කටයුතුද සැළකිය යුතු ලෙස සිදු කෙරිණි. අයිතිය පැවරීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් කරන ලද මුළු විකුණුම් හා මිලදී ගැනීම් ප්‍රමාණය භාණ්ඩාගාර බිල්පත් සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 128 ක් සහ රුපියල් බිලියන 23 ක් වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 59 ක් සහ රුපියල් බිලියන 27 ක් විය. 1999 අවසානයේදී ප්‍රාථමික වෙළෙඳුන් සතුව පැවති භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 33 ක් හෙවත් නොපියවන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 26 ක් වූ අතර, ඔවුන් සතුව පැවති භාණ්ඩාගාර බැඳුම්කරවල මුළු වටිනාකම රුපියල් බිලියන 38 ක් හෙවත් නොපියවන ලද මුළු භාණ්ඩාගාර බැඳුම්කර වලින් සියයට 36 ක් විය. 1999 වර්ෂය අවසානයේදී ද්විතීයික වෙළඳපොළේ ප්‍රාථමික වෙළෙඳුන් සතු ප්‍රති මිලදී ගැනීම් හා ප්‍රතිවර්තිත මිලදී ගැනීම්වල නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත් වගකීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් බිලියන 20 ක් සහ රුපියල් බිලියන 7 ක් විය.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද, ද්විතීයික භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළේ ප්‍රාථමික වෙළෙඳුන් විසින් ප්‍රකාශ කරන ලද ගැණුම් සහ විකුණුම් මිල ගණන් සාමාන්‍යයන් මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කරන ලදී. ප්‍රාථමික අලෙවිකරුවන් දක්වන ලද මිල ගණන් මත මේ සඳහා බර තබන ලද සාමාන්‍ය මිල ගණන් හා ඵලද අනුපාතිකයන් දිනපතා ගණනය කරනු ලැබිණ.

## විදේශීය ණය

1999 අවසානයේදී නොපියවූ මුළු විදේශීය රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 512,885 ක් වූ අතර 1998 අවසානය හා සසඳන කල එය රුපියල් දශ ලක්ෂ 44,834 (සියයට 9.6) ක වර්ධනයක් පෙන්වීය. වසර අවසානයේදී නොපියවූ මුළු ණයෙන් ද්විපාර්ශවීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 266,872 (සියයට 52) ක් වූ අතර බහුපාර්ශවීය ණය සහ වාණිජමය ණය ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 228,354 (සියයට 45) ක් සහ රුපියල් දශ ලක්ෂ 17,659 (සියයට 3) ක් විය. ප්‍රධාන ද්විපාර්ශවීය ණය හිමියන් වූයේ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජර්මනියයි. මුළු ද්විපාර්ශවීය ණය ප්‍රමාණයෙන් මෙකී මූලාශ්‍රයන්ගේ දායකත්වය රුපියල් දශ ලක්ෂ 248,484 ක් හෙවත් සියයට 93 ක් විය. බහුපාර්ශවීය අංශයේ විශාලතම ණය හිමියා වූ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුළු බහුපාර්ශවීය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 119,047 කට හෙවත් සියයට 52 කට හිමිකම් පෑවේය.

ණය මුදල් උපයෝජනය අනුව වර්ග කිරීමේදී ව්‍යාපෘති ණය, වැඩසටහන් ණය සහ භාණ්ඩ ණය රජයේ මුළු විදේශ ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 393,814 (සියයට 77) ක්, රුපියල් දශ ලක්ෂ 48,029 (සියයට 9) ක් සහ රුපියල් දශ ලක්ෂ 32,289 (සියයට 6) ක් විය. ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය කරන ලද ආකාරය අනුව 1999 අවසානයේදී රජයේ විදේශීය ණය සංයුතිය II-25 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

II - 25 සංඛ්‍යා සටහන
**1999 අවසානයේදී නොපියවූ දළ විදේශීය ණය**

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | % |
|---|---|---|
| (1) ණය දෙන්නන් අනුව | 512,885 | 100 |
| ද්වි පාර්ශවීය | 266,872 | 52 |
| බහු පාර්ශවීය | 228,354 | 45 |
| වාණිජමය | 17,659 | 3 |
| (2) ණය මුදල් උපයෝජනය අනුව | 512,885 | 100 |
| මුදල් | 8,607 | 2 |
| භාණ්ඩ | 32,289 | 6 |
| ආහාර | 29,977 | 6 |
| වැඩසටහන් | 48,029 | 9 |
| ව්‍යාපෘති | 393,814 | 77 |
| තාක්ෂණික ආධාර | 169 | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1999 වසර තුළදී විදේශීය රාජ්‍ය ණය මුල් මුදල් ආපසු ගෙවීම් හා පොලී සහ අනෙකුත් ගාස්තු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 17,449 ක් සහ රුපියල් දශ ලක්ෂ 9,390 ක් විය. වසරේ මුළු උපලබ්ධි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23,864 ක් වූ අතර එය ද්විපාර්ශවීය මූලයන්ගෙන් ලැබුණු රුපියල් දශ ලක්ෂ 13,560 (සියයට 57) කින්ද, බහුපාර්ශවීය මූලයන්ගෙන් ලැබුණු රුපියල් දශ ලක්ෂ 10,237 (සියයට 43) කින්ද, වාණිජ බැංකු වලින් ලත් රුපියල් දශ ලක්ෂ 67 කින්ද සමන්විත විය. 1999 හා සසඳනවිට පසුගිය වසරේ මුළු උපලබ්ධි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 38,091 ක් වූ

අතර එය සමන්විත වූයේ ද්විපාර්ශවීය, බහු පාර්ශවීය සහ වාණිජමය මූලයන් වෙතින් ලැබුණු පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 16,925 (සියයට 44), රුපියල් දශ ලක්ෂ 14,437 (සියයට 38) සහ රුපියල් දශ ලක්ෂ 6,729 (සියයට 18) ක උපලබ්ධීන් වශයෙනි. 1999 වසරේ උපලබ්ධීන් සියල්ලම වාගේ ව්‍යාපෘති ණය යටතේ ලැබුණි.

II-26 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙන්නේ ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය අනුව 1998 සහ 1999 වර්ෂවල උපලබ්ධි ප්‍රමාණයන්ය.

II - **26 සංඛ්‍යා සටහන**

**විදේශ ණය උපලබ්ධීන්**

| වර්ගය | 1998 | | 1999 | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය රු.ද.ල. | % | ප්‍රමාණය රු.ද.ල. | % |
| 1. ණය දෙන්නන් අනුව | 38,091 | 100 | 23,864 | 100 |
| ද්වි පාර්ශවීය | 16,925 | 44 | 13,560 | 57 |
| බහු පාර්ශවීය | 14,437 | 38 | 10,237 | 43 |
| වාණිජමය | 6,729* | 18 | 67 | - |
| 2. ණය උපයෝජනය අනුව | 38,091 | 100 | 23,864 | 100 |
| මුදල් | 6,729* | 18 | - | - |
| භාණ්ඩ | 313 | 1 | 6 | - |
| ආහාර | 641 | 2 | - | - |
| වැඩසටහන් | - | - | - | - |
| ව්‍යාපෘති | 30,387 | 79 | 23,856 | 100 |
| තාක්ෂණික ආධාර | 21 | - | 2 | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* එ.ජ.ඩො. දශ ලක්ෂ 100 ක විදේශ මුදල් බැංකු ඒකක ණය නියෝජනය කෙරේ.

1999 දී නව විදේශ ණය 23 ක් ගිවිසුම්ගත කරන ලද අතර වසර අවසානයේදී ක්‍රියාත්මක වූ මුළු ණය සංඛ්‍යාව 488 ක් දක්වා වර්ධනය විය. මෙම ණය අවුරුදු 1 සිට 17 දක්වා වූ සහන කාලයකින් යුක්ත වූ අතර ආපසු ගෙවීමේ කාලය අවුරුදු 40 දක්වා විය. වාර්ෂික පොලී අනුපාතිකය සියයට 0 සිට සියයට 10.85 අතර විය. ණය තුළ අන්තර්ගත ප්‍රදාන ප්‍රතිශතය සියයට 1 සිට 91 දක්වා වූ පරාසයක පැවතින. ණය දෙන්නන් අනුව 1999 අවසානයේදී රජයේ විදේශීය ණය සහන කාල, පරිණත කාල, පොලී අනුපාතික සහ ප්‍රදාන ප්‍රතිශතය පිළිබඳ පරාසයන් II-27 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

II - **27 සංඛ්‍යා සටහන**

**විදේශ ණයවල පරිණත කාල, පොලී අනුපාතික හා ප්‍රදාන ප්‍රතිශත**

| වර්ගය | පරිණත කාලය (අවුරුදු) | | පොලී අනුපාතිකය/සේවා ගාස්තු වාර්ෂිකව % | ප්‍රදාන ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | සහන කාලය | ආපසු ගෙවීම් කාලය | | |
| ද්වි පාර්ශවීය | 1-17 | 7-40 | 0.00-7.39 | 5-91 |
| බහු පාර්ශවීය | 3-11 | 9-40 | 0.75-8.25 | 5-88 |
| වාණිජමය | 1-10 | 0-20 | 4.00-10.85 | 1-61 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

# බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය

වෙනස්වන පරිසරයේ අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය වන නිපුණතාවයන් මූල්‍ය අංශයේ නිලධාරීන්ට ලබාදීම සඳහා පුහුණු පාඨමාලාවන් පැවැත්වීම බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විසින් තවදුරටත් කරගෙන යන ලදී. එමෙන් ම රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතුවල නිරත නිලධාරීන් සඳහා ද පුහුණු පාඨමාලාවන් පවත්වන ලදී. 1999 වර්ෂයේ දී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පුහුණුලාභීන් 1,842 ක් සඳහා පුහුණු පැය 2,328 කින් සමන්විත වූ පාඨමාලා 71 ක් පවත්වන ලදී. මෙම පුහුණුලාභීන්ගෙන් අඩක් ම එනම් 924 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් වූ අතර, සියයට 29 ක් වාණිජ බැංකුවල නිලධාරීන් විය. සෙසු පුහුණුලාභීහු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු වලින් (සියයට 6) සහ රජයේ අමාත්‍යාංශ සහ අනෙකුත් මූල්‍ය ආයතන වලින් (සියයට 15) පැමිණිය හ. 1999 වසරේදී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ පාඨමාලාවන් සඳහා සාක් කලාපයේ මහ බැංකුවල නිලධාරීන් කිහිප දෙනෙක්ද සහභාගි වූහ.

1999 වර්ෂය සඳහා පුහුණු පාඨමාලා සකස් කිරීමේ දී ශක්තිමත් මූල්‍ය පද්ධතියක් සහ කළමනාකාරිත්වයක් ඇති කිරීම සඳහා බැංකු අධීක්ෂණය සහ පරිපාලනය පිළිබඳව වැඩි අවධානය යොමු කරන ලදී. එබැවින් බැංකු අධීක්ෂණ ශිල්පීය ක්‍රම, අවදානම් පදනම් කරගත් අධීක්ෂණය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන යන මාතෘකා ආවරණය කරනු පිණිස පාඨමාලාවල විෂය ක්ෂේත්‍රය පුළුල් කරන ලදී. ඒ සඳහා කෙටිකාලීන සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලාවන් යොදා ගැනිණි. මීට අමතරව නව සහ කාලීන අවශ්‍යතා අනුව යළි සැකසූ තේමා යටතේ පුහුණු පාඨමාලා ගණනාවක් පවත්වන ලදී.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් දෙවන වසරටත් මහ බැංකු කටයුතු සහ වාණිජ බැංකු කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලැබීය. මූලික වශයෙන් මහ බැංකු සේවකයින්ට පරිගණක භාවිතා කිරීම පිළිබඳව පුහුණුව ලබාදීම සඳහා සකස් කරන ලද පරිගණක පුහුණු පාඨමාලා 16 ක් 1999 දී පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවට බඳවා ගනු ලැබූ නවක සේවකයන් සඳහා වූ මෘදුකාංග භාවිතය පිළිබඳව සහතික පත්‍ර පරිගණක පාඨමාලාව සහ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට අලුතින් බඳවා ගනු ලැබූ අරමුදල් කළමනාකරුවන් සඳහා වූ විශේෂිත පරිගණක පාඨමාලාව ද මීට ඇතුළත් ය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් නිපුණතා වැඩිදියුණු කිරීමේ පාඨමාලාවන් 15 ක් පවත්වනු ලැබූ අතර, එයින් තුනක් මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විය.

එමෙන්ම ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන හා ප්‍රාදේශීය

සංවර්ධන බැංකු උදෙසාම සකස් කරනු ලැබූ පාඨමාලාවන් ද විය. මෙම පාඨමාලාවලින් "ස්වර්ණාභරණ උකස් මත ණය දීම", "ව්‍යාපෘති අගැයීම", "දුබල ව්‍යාපෘති හඳුනා ගැනීම සහ පුනරුත්ථාපනය කිරීම" සහ "ගිණුම්කරණය" යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරන ලදී. සෙසු පුහුණු පාඨමාලාවන් පොදුවේ මූල්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා සකසන ලද අතර, ඒවායින් පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කෙරිණ. "ආයෝජන සහ වණික් බැංකු කටයුතු", "අරමුදල් කළමනාකරණය", "කුලීපිට මිලදී ගැනීම් සහ කල්බදු", "සඵල ණය කළමනාකරණ" "වාණිජ බැංකු කටයුතු සහ පරිචය", "විදේශ විනිමය ගණුදෙනු", "ජාත්‍යන්තර වෙළඳම මූල්‍යකරණය", "රාජ්‍ය ණය සුරැකුම් වෙළඳපොළ", "පොලී අනුපාතවල ව්‍යුහය සහ තීරකයන්", "කොළඹ කොටස් වෙළඳපොළ : උපනතීන් සහ අපේක්ෂා", "ජාතික ආර්ථික කළමනාකරණය", "මූල්‍ය අංශයේ මෑතකාලීන වර්ධන" යන මාතෘකා එම විෂය ක්ෂේත්‍රයේ අඩංගු විය.

1999 වර්ෂයේ දී විශේෂිත පාඨමාලාවන් 16 ක් පවත්වන ලද අතර, ඉන් 7 ක්ම බැංකු හා මූල්‍ය සේවා (පුහුණු) බැංකු උපදේශකයින් විසින් පවත්වනු ලැබිණ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ සඳහා සහභාගි වූහ. "විනිමය හුවමාරු ව්‍යුත්පන්න", "බදු සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති", "ලෝක බැංකුවේ සැපයුම් ලබාගැනීම පිළිබඳ නීති රෙගුලාසි" හා "මුදල් විශුද්ධිකරණය" යන විෂයයන් පිළිබඳ සම්මන්ත්‍රණ සහ ශ්‍රී ලංකා මහ බැංකුවට අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් හා මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් උදෙසා නවීකරණ පුහුණු පාඨමාලාවන් ඉතිරි පාඨමාලා නවයට අඩංගු විය. මහ බැංකුවේ අනුග්‍රහය යටතේ 1999 දී කොළඹ දී පැවැත් වූ "සියසන් රටවල සංස්ථාතික මූල්‍ය අංශ ප්‍රතිව්‍යුහකරණය සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති", පිළිබඳ සියසන් සම්මන්ත්‍රණයේ සම්බන්ධීකරණ කටයුතු බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් ලැබීය.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් 1999 වර්ෂයේ දී ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ සහ සමරු දේශන ගණනාවක් පවත්වන ලදී. ආර්ථික සහ මූල්‍ය අංශයේ වර්ධනයන් පිළිබඳව අදාළ විෂය ක්ෂේත්‍රයන්හී විද්වතුන්ට සහ වෘත්තිකයන්ට සිය අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් බිහි කිරීමේ අරමුණින් සමරු දේශන සකස් කරන ලදී. 1999 දී සමරු දේශන තුනක් පවත්වන ලදී. ඒවා නම් දේශමාන්‍ය එන්.යූ.ජයවර්ධන මහතා විසින් "ආර්ථික වර්ධනයේ උත්ප්‍රේරකය ලෙස මහ බැංකු කටයුතු" යන මාතෘකාව යටතේ පවත්වන ලද **ශ්‍රී ලංකා ජනරජ සමරු දේශනය,** ඉන්දීය සංචිත බැංකුවේ අධිපති ආචාර්ය බිමල් ජාලන් මහතා විසින් "ජාත්‍යන්තර මූල්‍ය ස්ථායිතාවය: සංවර්ධනය වන රටවල දෘෂ්ටියෙන් " යන මාතෘකාව යටතේ පවත්වන ලද **මහ බැංකුවේ 49 වෙනි සංවත්සර දේශනය** සහ ඉන්දීය මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ආර්ථික උපදේශක ආචාර්ය සංකර් ආචාර්ය මහතා විසින් පවත්වන ලද **බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ සංවත්සර දේශනය යි.**

වර්තමාන ආර්ථික ප්‍රතිපත්ති හා ගැටලු පිළිබඳව පොදු ජනතාවගේ දැනුම පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් 1999 වර්ෂයේදී ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ සහ දේශන 6 ක් පවත්වන ලදී. එම සම්මන්ත්‍රණවල මාතෘකා සහ එම දේශකයන්ගේ නම් පහත දැක්වේ.

1. " ජාත්‍යන්තර මූල්‍ය ප්‍රතිසංස්කරණ පිලිබඳ වත්මන් විවාදය"
   එම්.ආර්.සිවරාමන් මහතා, විධායක අධ්‍යක්ෂ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
2. "ඉදිරි සියවසේ තොරතුරු සහ ඥාන ගතිකය : ආර්ථිකය, තාක්ෂණය සහ සමාජය"
   ආචාර්ය සුසන්ත ගුණතිලක
3. "නව විශ්ව ආර්ථිකය සහ සංවර්ධනය වන රටවල් :"
   මහාචාර්ය ඩැනී රොඩ්රික්, හාවඩ් විශ්ව විද්‍යාලය
4. "රාජ්‍ය මූල්‍ය විමධ්‍යගත කිරීම පිළිබඳ අත්දැකීම්"
   ආචාර්ය අශෝක් ලහිරි, රාජ්‍ය මූල්‍ය සහ ප්‍රතිපත්ති ආයතනය, ඉන්දියාව
5. "1998 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය තත්වය සහ 1999 වසර සඳහා අපේක්ෂා : මහ බැංකු වාර්තාවෙන් අවධාරණය කළ කරුණු"
   ආර්.ඒ.ජයතිස්ස මහතා, අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
6. "ලෝක දරිද්‍රතාවය පහත හෙළීම හා සුභසාධනය ඉහළ නැංවීම අරභයා මූල්‍ය අංශය සතු භූමිකාව"
   මහාචාර්ය ආර්.එල්.මාරිස්, කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය (හිටපු),එංගලන්තය

1998 සහ 1999 වර්ෂ සඳහා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලැබූ පුහුණු පාඨමාලාවන් හා පුහුණුලාභීන් පිළිබඳව වර්ගීකරණයක් II-28 වන සංඛ්‍යා සටහන් මගින් දක්වා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩිදියුණු කිරීම සඳහා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ ස්වයං අධ්‍යයන පිවිසුම දිගටම පහසුකම් සලසන ලදී. මෙයට පරිපූරක වශයෙන් වාචික සංනිවේදනය සහ වාර්තා ලිවීම සඳහා පංති ද පවත්වනු ලැබීය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ පුස්තකාලය මගින් මහ බැංකු කාර්ය මණ්ඩලයට හා අනිකුත් ආයතනයන් හි පර්යේෂණ නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ පුස්තකාලයට අලුතින් පොත් 325 ක් එකතු කරනු ලැබූ අතර, කාලීන සඟරා 52 කට දායක වී ඇත.

II - 28 සංඛ්‍යා සටහන
**බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් 1998 සහ 1999 වර්ෂවල පවත්වන ලද පුහුණු පාඨමාලාවන්**

| පුහුණු පාඨමාලා වර්ග | 1998 | | | | 1999 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පාඨමාලා ගණන | ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණුලාභීන් | අනිකුත් පුහුණු ලාභීන් | පුහුණු ලාභීන්ගේ මුළු ගණන | පාඨමාලා ගණන | ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණුලාභීන් | අනිකුත් පුහුණු ලාභීන් | පුහුණු ලාභීන්ගේ මුළු ගණන |
| තොරතුරු තාක්ෂණ හා පරිගණක පුහුණු පාඨමාලා | 12 | 111 | 48 | 159 | 16 | 186 | 39 | 225 |
| වාණිජ බැංකු කටයුතු | 13 | 30 | 291 | 321 | 12 | 37 | 279 | 316 |
| ආයෝජන සහ වණික් බැංකු කටයුතු | 1 | 4 | 19 | 23 | 1 | 5 | 22 | 27 |
| මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ | 4 | 21 | 62 | 83 | 3 | 22 | 43 | 65 |
| මහ බැංකු කටයුතු | 5 | 28 | 83 | 111 | 4 | 18 | 87 | 105 |
| බැංකු අධීක්ෂණය හා පරිපාලනය | - | - | - | - | 4 | 105 | 130 | 235 |
| මූල්‍ය අංශය : නිපුණතා වර්ධනය | 8 | 164 | 98 | 262 | 15 | 411 | 5 | 416 |
| මූලික අදියර | 3 | 58 | 98 | 156 | 10 | 307 | 2 | 309 |
| මධ්‍යම අදියර | 4 | 66 | 0 | 66 | 4 | 59 | 3 | 62 |
| ජ්‍යෙෂ්ඨ අදියර | 1 | 40 | - | 40 | 1 | 45 | - | 45 |
| වෙනත් පාඨමාලා | 11 | 38 | 160 | 198 | - | - | - | - |
| ග්‍රාමීය බැංකු කටයුතු | 3 | - | 67 | 67 | - | - | - | - |
| කළමනාකරණය | 5 | 19 | 69 | 88 | - | - | - | - |
| වෙනත් | 3 | 19 | 24 | 43 | - | - | - | - |
| විශේෂ පාඨමාලා | 11 | 176 | 87 | 263 | 16 | 140 | 313 | 453 |
| බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශකවරුන් විසින් පවත්වන ලද ගෘහස්ථ පුහුණු පාඨමාලාවන් | 10 | 172 | 51 | 223 | 7 | 68 | - | 68 |
| ජාත්‍යන්තර පාඨමාලා | 0 | - | - | - | 1 | 5 | 14 | 19 |
| වෙනත් | 1 | 4 | 36 | 40 | 8 | 67 | 299 | 366 |
| එකතුව | 65 | 572 | 848 | 1,420 | 71 | 924 | 918 | 1,842 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

# ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව මගින් බැංකුවෙහි මුදල්, සැපයුම්, සහ ගමනා ගමන වැනි කේෂත්‍රයන් සියළු පරිපාලන සේවාවන් ලබාදීම ක්‍රියාත්මක කරන ලදී.

බැංකුවේ දෙපාර්තමේන්තු වෙත ගතයුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳ මාර්ගෝපදේශක නිකුත් කරමින් දෙපාර්තමේන්තු වියදම් පිළිබඳ ස්ව නිරීක්ෂණ ක්‍රමයක් 1999 වසරේදී හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය හඳුන්වා දෙනු ලැබුයේ බැංකු අයවැය ගිණුමෙහි කරන ලද වියදම් පාලන වලට අමතරවය. සවිස්තරාත්මක සංස්ථාපිත සැලැස්මක් යටතේ වියදම් මත දැඩි පාලනයක් පැවැත්වෙන බව බැංකු අයවැය මගින් තහවුරු කෙරිණි. අරමුදල් හි කාර්‍යක්ෂම උපයෝජනය සහ වියදම් ඵලදයීත්වය යන අරමුනු සපුරාලනු පිණිස බැංකුවෙහි වියදම් කටයුතු, අයවැය ගිණුම හා අනුකූලව සිදුවේදැයි නිරීක්ෂණය කරනු ලැබිණි.

ප්‍රාග්ධන හා පරිපාලන යන දෙඅංශය සඳහාම ආදයම් හා වියදම් ලේඛනයක් පිළියෙල කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම වසර තුළදී සිදු කිරීමට අපේක්ෂිත වියදම් හා අදළ තොරතුරු පදනම් කොට ගෙන මෙම ලේඛනය පිළියෙළ කෙරේ. බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත අයවැය විවරන කමිටුවක් මගින් අයවැයට පෙර දෙපාර්තමේන්තු වලින් කෙරෙන ඉල්ලීම් සලකා බලා අවසන් තීරණ ගන්නා අතර මේ සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතියද ලබා ගනී. අයවැයෙන් පරිබාහිරව පැන නැගිය හැකි ඕනෑම වියදමක් සඳහා මූල්‍ය මණ්ඩලයේ විශේෂ අනුමැතිය ලබා ගත යුතුව ඇත.

1999 වසරේ මුළු පරිපාලන වියදම රුපියල් දශ ලක්ෂ 1,567 ක් වූ අතර මුදල් නෝට්ටු හා කාසි නිකුතුව සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 772 ක් විය. මුළු පරිපාලන වියදමින් වේතන, දීමනා අතිකාල ගෙවීම් වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුලත් කාර්ය මණ්ඩලය සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 1,203 නැතහොත් සියයට 76.8 ක්වූ අතර පරිපාලන හා ආයතනික වියදම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 170 ක් නැතහොත් සියයට 10.8 ක් හා රුපියල් දශ ලක්ෂ 194 ක් නැතහොත් සියයට 12.4 ක් විය.

1999 අවසානයේදී මහ බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය 2,026 ක් වූ අතර ඉන් 546 ක් මාණ්ඩලික නිලධාරින් විය. වසර තුළදී මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ලත් සේවක සංඛ්‍යාව 60 ක් විය.

1998 වසරේ රුපියල් දශ ලක්ෂ 1,622 සමග සසඳන කල 1999 වසරේදී ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 2,909 ක් විය. වියදම් වලින් විශාල කොටසක් වූ රුපියල් දශ ලක්ෂ 2,872 ක් වැය වූයේ ජනාධිපති මාවතේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු හා පැරණි ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන කටයුතු සඳහාය. නව හා පැරණි ගොඩනැගිලි

සඳහා වූ වියදම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 1,275 ක් හා රුපියල් දශ ලක්ෂ 1,597 කි. සෑම වසරකම ලාභ වෙන් කරන අවස්ථාවේදී වාර්ෂික ලාභයෙන් යම් කොටසක් වෙන්කොට ස්ථාපනය කළ ගොඩනැගිලි සංචිත ගිණුම මගින් මෙම ව්‍යාපෘතීන්ගේ වියදම පියවා ගත හැකි විය. බැංකුව විසින් ආරම්භ කරන ලද තවත් ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතීන් වූයේ බැංකුවෙහි නව පීඒබීඑක්ස් (PABX) ක්‍රමයක් ඉදිරිකිම හා ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරයට උපස්ථ අංශයක් ස්ථාපනය කිරීමය.

## නීති

මීට ඉහතදී ලේකම් දෙපාර්තමේන්තුවේ කොටසක් වශයෙන් පැවති නීති අංශය 2000 අප්‍රේල් 15 දින සිට වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස පිහිටුවනු ලැබිණි.

නීතිමය කටයුතු සම්බන්ධව බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට නීතිමය උපදෙස් දීම මෙන්ම බැංකුවේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමද, මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරේ. අධිකරණ හා වෙනත් අධිකරණමය ආයතන ඉදිරියේ බැංකුව වෙනුවෙන් පෙනී සිටීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙවැනි සාමාන්‍ය කටයුතුවලට අමතරව 1998 අංක 30 දරණ බැංකු පනත හා මුදල් නීති පනත (පරිච්ඡේද 422) සංශෝධනය කිරීම සඳහා මූලික කෙටුම්පත් පිළියෙල කිරීමද කල්බදු හා මුදල් පවිත්‍රකරණය වැළැක්වීම සඳහා නව නීති සැකසීමේ කටයුතුද 1999 වර්ෂය තුළදී සිදුකර ඇත.

## පරිශ්‍ර

ශ්‍රී ලංකා මහ බැංකු නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සහ පැරණි මහ බැංකු මූලස්ථාන ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන කටයුතු අවසන් වන තෙක් මහ බැංකු ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුලියට ගෙන තිබූ පරිශ්‍රයන්හි සහ මහ බැංකුවට අයත් අනිකුත් පරිශ්‍රයන්හි මූලික නඩත්තු කටයුතු සහ ඒවා පවත්වාගෙන යාමේ කටයුතුවල පරිශ්‍ර දෙපාර්තමේන්තුව වර්ෂය තුළදී තවදුරටත් යෙදී සිටින ලදී. 1999 නොවැම්බර්/ දෙසැම්බර් මාසයේ සිට නව ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සහ ඒවා පවත්වාගෙන යාමද දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මීට අමතරව, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අවශ්‍ය ප්‍රවාහන සහ පණිවුඩ හුවමාරු පහසුකම් වැනි උපකාරක සේවා සැපයීමද දෙපාර්තමේන්තුව විසින් දිගටම කරගෙන යන ලදී.

1999 දෙවන කාර්තුවේදී බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ දෙවැනි නේවාසිකාගාර ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ උපදෙස් යටතේ වැතම් වීදියේ පිහිටි ප්‍රදීපාගන් ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීමේ කාර්යයන්ද දෙපාර්තමේන්තුව විසින් 1999 අවසාන කාර්තුවේදී අරඹන ලදී. මෙම කාර්ය භාර ගැනීම නිසා එය පිටස්තර පාර්ශවයක් විසින් කරගෙන යාමේදී බැංකුවට ඇතිවිය හැකි ආරක්ෂාව පිළිබඳ අවදානම ඉවත් කෙරින.

## නව ගොඩනැගිලි

1997 නොවැම්බර් මස 18 වැනි දින පිහිටුවන ලද නව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිලි ව්‍යාපෘතිය සහ කොළඹ ජනාධිපති මාවතේ පිහිටි බෝම්බ ප්‍රහාරයට ලක් වූ ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදල වැඩ කටයුතු කිරීමේ විශේෂ කාර්ය භාරය පැවරී ඇත.

### මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිල්ල

මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිලි ව්‍යාපෘතියට අදල ඉදි කිරීමේ කටයුතු 1999 වසර තුළදී නිම විය. 1999 ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ස්ථානගත කර තිබූ සියළුම දෙපාර්තමේන්තු 1999 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හිදී ව්‍යාප්ත ගොඩනැගිල්ල වෙත ගෙනයන ලදී.

මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිල්ල ප්‍රධාන කුළුණු දෙකකින් සමන්විත වන අතර සෑම කුළුණකම මහල් 15 කින් (බිම් මහල් සහ අතුරු මහල් ඇතුළු) යුක්ත වේ. ගොඩනැගිල්ලෙහි කාර්යාල සහ ඊට සම්බන්ධිත කොටස් සඳහා වෙන් වූ භූමි ප්‍රමාණය වර්ග අඩි 2,02,360 ක් පමණ වන අතර, එහි මගීන් ගෙන යාම සඳහා විදුලි සෝපාන 4 ක්ද, විශේෂ කටයුතු සඳහා වූ තවත් සෝපාන 3ක් ද සවි කර ඇත. ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල නවතම ඒකාබද්ධ දුරකථන පද්ධතියකින් සම්බන්ධකර තිබේ. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය සහ ශ්‍රී ලංකා ස්වයංකෘත නිශ්කාෂනාගාරයද එම ජාලයට සම්බන්ධ කර ඇත. ගොඩනැගිල්ලේ බිම් මහලේ මුදල් කෞතුකාගාරයක් ඉදිකිරීමට නියමිතය.

### ආපදවට පත් වූ මූලස්ථාන ගොඩනැගිල්ල

ආපදවට පත් වූ මහ බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 1997 දෙසැම්බර් මස ආරම්භ වූ අතර, 1999 වර්ෂය මුළුල්ලේම එම කාර්යයන් සිදු විණ. ප්‍රතිසංස්කරණය කෙරෙන මූලස්ථාන ගොඩනැගිල්ල නව ගොඩනැගිල්ල හා සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කෙරෙන අතර නවතම පහසුකමින් සමන්විත සම්මන්ත්‍රණ ශාලාවක් ද එහි ඉදිකෙරෙනු ඇත.

1999 අවසානය වනවිට ව්‍යාපෘතියට අදල ප්‍රධාන ක්ෂේත්‍රයන්හි පහත දක්වෙන පරිදි ප්‍රගතියක් දක්නට ලැබිණ.

(අ) කඩා ඉවත් කිරීමේ කටයුතු - සියයට 100 ක් නිම විය.

| | |
|---|---|
| (ආ) අලුත්වැඩියා කටයුතු | - සියයට 100 ක් නිම විය. |
| (ඇ) නව කොන්ක්‍රීට් වැඩ | - සියයට 100 ක් නිම විය. |
| (ඈ) කාර්මික සහ විදුලි කටයුතු | - සියයට 75 ක් නිම විය. |
| (ඉ) නිම කිරීමේ කාර්යයන් | - සියයට 80 ක් නිම විය. |
| (ඊ) සමස්ත කාර්යයන් | - සියයට 75 ක් නිම විය. |

ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු 2000 මැද භාගය වනවිට නිම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ආරක්ෂක සේවා

නව ගොඩනැගිල්ලෙහි කාර්යාල ස්ථානගත කිරීම, ප්‍රාදේශීය කාර්යාල සහ ව්‍යවහාර මුදල් කටයුතු සිදු කෙරෙන අනෙකුත් ස්ථාන වෙත මුදල් ප්‍රවාහනය වැනි විශේෂ කාර්යයන්ද ඇතුලත්ව බැංකුවෙහි සියළුම කාර්යයන් සඳහා ආරක්ෂාව සැපයීම ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරිණි. අනුරාධපුරය සහ මාතර ප්‍රාදේශීය කාර්යාලද ඇතුලත්ව බැංකු කටයුතු සිදු වූ විවිධ පරිශ්‍රයන් ආරක්ෂක සේවා නිළධාරින් සේවයේ යොදවනු ලැබීය.

රජයේ ආරක්ෂක සේවා සහ බුද්ධි අංශය සමග එකතුව අමතර ආරක්ෂක පියවර ගනු ලැබිණි. තවද ගොඩනැගිලි ඉදි කිරීම් පරිශ්‍රයට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය හා ජලය ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු ආරක්ෂක වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කරනු ලැබිණි.

## ප්‍රවෘත්ති

බැංකුව හා අදාළ තොරතුරු බැංකු කාර්ය මණ්ඩලය අතර ද, මහ ජනතාව අතරද, විවිධ මාධ්‍ය මගින් බෙදාහැරීම ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. තොරතුරු එක්රැස් කරගන්නා, ගබඩා කරන්නා සහ බෙදාහරින්නා ලෙස දෙපාර්තමේන්තුව සිය කටයුතු කරගෙන යන ලදී.

බැංකුව තුළ තොරතුරු බෙදාහරින්නා ලෙස කටයුතු කරමින් වසර පුරාම දෙසතියකට වරක් අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශය පළකර ඇත.

බාහිර ලෝකය වෙත තොරතුරු බෙදාහරින්නෙකු ලෙස දෙපාර්තමේන්තුව විසින් දෛනික විනිමය අනුපාත, ආර්ථික දර්ශක (සතිපතා සහ මාසිකව), පාරිභෝගික මිල දර්ශක, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා රුපියල් ණය වැනි දේශීය ණය උපකරණ පිළිබඳ දැන්වීම් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් වෙත නිකුත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. එමෙන්ම පුවත්පත් නිවේදන නිකුත් කිරීම සහ මහජනතාවට බලපාන කරුණු පිළිබඳ පුවත්පත් සාකච්ඡා සංවිධානය කිරීම දෙපාර්තමේන්තුවේ වගකීමක් විය. මහබැංකු වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, මාසික විවරණිකා, Consumer Finance and Socio Economic Survey සහ Economic and Social Statistics යන සටහන සහ News Survey ද ප්‍රකාශයට පත් කෙරිනි. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව යටතේ වන ඉසුරු ණය ව්‍යාපෘතිය පිළිබඳව කාන්තා බලමුළු ගැන්වීම තේමාව කර ගනිමින් ඉසුරු මාගම නමින් වාර්තා වීඩියෝ වැඩසටහනක් නිපදවන ලදී.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සපයන ලද අනෙකුත් සේවා අතර බැංකුවේ සහ රජයේ ඇතැම් ප්‍රකාශන බැංකු මුද්‍රණාලයෙහි මුද්‍රණය කිරීම ද ඡායාරූප සේවාව ද චිත්‍ර ශිල්ප සේවාව ද වේ.

බැංකුවෙහි සියළුම මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම තව දුරටත් බැංකුවෙහි මුද්‍රණාලය මගින් සිදුකරන ලද අතර වාර්ෂික වාර්තාව (ඉංග්‍රීසි මුද්‍රණය), සටහන, News Survey සහ වෙනත් මහ බැංකු ප්‍රකාශනවලට අමතරව මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් Trends in Public Finance ප්‍රකාශනය ද මුද්‍රණය කරන ලදී. එමෙන්ම බැංකු හා මූල්‍ය අංශයට බලපාන සියලුම නීති කෙටුම්පත් එකතුවක් ලෙස වෙළුම් 7කින් යුත් Laws Relating to Banking and Finance in Sri Lnaka ප්‍රකාශනය ද මුද්‍රණය කෙරිනි.

ඓතිහාසික වශයෙන් බැංකුවට වැදගත් වන දෑ එක්රැස් කිරීම සඳහා වන මහ බැංකු උරුමය ව්‍යාපෘතියට දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව සහභාගී විය.

## පුස්තකාලය

1996 ජනවාරි මාසයේ විනාශවී යාමෙන් පසු නැවත ගොඩනැංවිය යුතුව තිබූ පුස්තකාලය 1999 නොවැම්බර් මාසයේදී නව මහ බැංකු මූලස්ථාන ගොඩනැගිල්ලේ ස්ථාපිත කෙරින. මහ බැංකු කාර්ය මණ්ඩලයට තොරතුරු අවශ්‍යතා සහ පර්යේෂණ සහාය ලබා දීම මෙන්ම දිවයිනේ ආර්ථික පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම සඳහා නව තාක්ෂණික අංශයන් ගෙන් සමන්විත නවීන පුස්තකාලයක් ගොඩනැංවීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව දියත් කරන ලද ව්‍යාපෘතියේ කටයුතු වසර අග වන විට අවසන් අදියරෙහි පැවතිනි.

1999 දෙසැම්බර් වන විට පුස්තකාලය, පොත් 7,862 කින් සහ වාර ප්‍රකාශන 385 කින් ද CD ROMS 131 කින්ද සමන්විත වෙමින් මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පහසුකම් සැලසීය.

* කාලීන දැනුවත් කිරීමේ විවරණිකා සේවාව
* වෙබ් ඇලර්ට් සේවාව
* ලොව වටා බැංකු සහ මූල්‍ය අංශයේ නව තොරතුරු
* විශේෂ ග්‍රන්ථ ලේඛන පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම.

එමෙන්ම පුස්තකාලය මගින් ප්‍රති කෘති ශිල්ප සේවා, විමර්ශන සේවා, පොත් බැහැර දීමේ සේවා, අන්තර්ජාලය පිරික්සුම් සහ අන්තර් පුස්තකාල පිරුළුම් යනාදී සේවා

බැංකු කාර්ය මණ්ඩලය වෙත සැපයීය.

විමර්ශනයට ලක්වන වසර තුළ, LIBSYs නම් වූ මෘදුකාංග පද්ධතියක් යොදාගෙන පුස්තකාලය නවීකරණය කිරීමේ හා ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන සඳහා උපදේශකයන් දෙදෙනෙකු ගේ සේවාව ලබාගන්නා ලදී. එමෙන්ම පුස්තකාලය අව පැතුරුම් ජාලයකට සම්බන්ධකර ඇති අතර පුස්තකාල මෙහෙයුම් ස්වයංක්‍රෘත බවට පත්කර ඇත.

## තොරතුරු තාක්‍ෂණ

විමර්ශනයට ලක්වූ වර්ෂය තුළදී තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු වූ ප්‍රධාන කාර්යයන් වූයේ පරිගණක තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් මහ බැංකුවේ එදිනෙද කටයුතු වඩාත් කාර්යක්‍ෂම ලෙස කරගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම හා වාණිජ බැංකු, විශේෂිත බැංකු හා මහ බැංකුව සම්බන්ධ වසර 2000 ට අනුගත වීමේ ව්‍යාපෘතිය අධීක්‍ෂණය කිරීමත් වේ.

දෙපාර්තමේන්තුව ඒ එස් 400 හා පෞද්ගලික පරිගණක පදනම් කර ගත් පද්ධතීන් කීපයක් වර්ධනය කිරීමේ කාර්යයේ දිගටම නිරත විය. බැංකු කටයුතු දෙපාර්තමේන්තුව සඳහා සකස් කරන ලද සම්බන්ධිත තත්කාල ජංගම ගිණුම් පද්ධතිය 1999 ජනවාරි මාසයේදී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලදී. මෙම පද්ධතිය රජයේ ණය සුරැකුම් වෙළෙඳපළ දියුණු කිරීම සඳහා අවශ්‍ය විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමය හඳුන්වා දීමට උවමනා වූ පූර්ව අවශ්‍යතාවයක් විය. විනිමය පාලන දෙපාර්තමේන්තුව සඳහා විදේශ විනිමය මුද්‍ර හැරීම් අධීක්‍ෂණය කිරීමේ පද්ධතියක්ද සකස් කරන ලදී.

## වසර 2000 ව්‍යාපෘතිය

මහ බැංකුවේ වසර 2000 ට අනුගත වීමේ ව්‍යාපෘතියට ඒ.එස්.400 හා පෞද්ගලික පරිගණක පදනම් කර ගත් සියළුම පරිගණක පද්ධතීන් පරීක්‍ෂා කිරීම ඇතුළත් විය. පෞද්ගලික පරිගණක පදනම් කර ගත් සමහර පද්ධතීන් අවශ්‍ය නවීකරණයන් සිදු කිරීම මගින් වසර 2000 සඳහා අනුගත කරන ලදී.

දෙපාර්තමේන්තු සඳහා මෙන්ම මහ බැංකුවම ආවරණය වන සාර්ව මට්ටමේ හදිසි අවශ්‍යතා සැලසුමක් සකස් කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම විය. මෙම හදිසි අවශ්‍යතා සැලසුම් ප්‍රධාන වැඩ බිමට ලඟා වීමට නොහැකි වූ විටකදී ප්‍රයෝජනයට ගතහැකි වෙයි.

තවද දෙපාර්තමේන්තුව, බැංකු අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවේද සම්බන්ධතාවය ඇතිව වසර 2000 ට මාරු වීම සඳහා ප්‍රමාණවත් සූදානමක් තිබෙන බවට සහතික කිරීම සඳහා සියළු බැංකුවල හා විශේෂිත බැංකුවල වසර 2000 කටයුතු අධීක්‍ෂණය කරන ලදී.

එංගලන්ත බැංකුවේ උපදෙස් මත පදනම් වූ වර්ෂ 2000 පරීක්‍ෂා කිරීම් සඳහා පිළි ගත් පොදු ක්‍රියා මාර්ගයක් වර්ධනය කර ගැනීම සඳහා සියළු බැංකු වලින් නිලධාරීන් 60 දෙනෙක් සහභාගී වූ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

හදිසි අවශ්‍යතා සැලසුම් සකස් කිරීම සඳහා බැංකු නිලධාරීන් 40 දෙනෙක් සහභාගී වූ තවත් වැඩමුළුවක්ද සංවිධානය කරන ලදී. ලෝක බැංකුව වියදම් සපයන ලද මෙම වැඩමුළු දෙකට සහභාගී වූ උපදේශකයින් වූයේ අයර්ලන්තයේ උපදේශක සමාගමකට සම්බන්ධ අයයි. තවද, ලෝක බැංකුවේ මූල්‍ය ආධාර මගින් දේශීය බැංකු, විශේෂිත බැංකු හා මහ බැංකුවේ වසර 2000 ව්‍යාපෘතීන් විගණනය කිරීම සඳහා කීර්තිමත් ජාත්‍යන්තර සමාගම් දෙකක සේවාව ලබාගත් අතර කලින් කලට එම ව්‍යාපෘතියේ තත්ත්වය පිළිබඳ වාර්තා කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් බැංකු ක්ෂේත්‍රය සඳහා හදිසි අවශ්‍යතා සැලසුමක් සකස් කරන ලද අතර දේශීය බැංකු වසර 2000 ට මාරු වීම හා ඒ හා සම්බන්ධ සිදු වීම් අධීක්‍ෂණය කිරීම සඳහා සිදු වීම් කළමනාකරණ මධ්‍යස්ථානයක්ද දෙපාර්තමේන්තුව තුළ කරන ලදී. මෙම මධ්‍යස්ථානයට අවශ්‍ය කාර්ය මණ්ඩලය, බැංකු අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගති.

## සේවක අර්ථසාධක අරමදල (සේ.අ.අ.) පද්ධතිය

විද්‍යුත් මාධ්‍යයෙන් සේවකයන්ගේ සේ.අ.අ. දායක මුදල් එකතු කිරීමේ ක්‍රමයක් සකස් කොට ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී සේව්‍යයන් සපයන තොරතුරු අනුව ස්වයංක්‍රෘත චෙක්පත් නිෂ්පාදනාගාරයේදී ස්ලිප්ස් ක්‍රමය උපයෝගී කර ගනිමින් සේව්‍යයන්ගේ බැංකු ගිණුම් වලින් සෘජුව හර කරන මුදල් සේ.අ.අ. අරමුදලේ සේවකයන්ගේ ගිණුමට බැර කරයි. මෙය සෘජු හර කිරීමේ ක්‍රමය ප්‍රථම වරට යොද ගැනීමයි. එමගින් සේ.අ.අ. ගිණුම් හිමියන්ගේ ගිණුම් වල දායකත්ව මුදල් ලැබීම කාර්යක්‍ෂම කිරීමට හා නිවැරදි කිරීමට අපේක්‍ෂා කෙරේ. ප්‍රතිලාභ අයදුම්පත් කටයුතු කිරීමටත්, අර්ථලාභීන්ට ගෙවීම් සිදු කිරීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීම සඳහා පරිගණක පද්ධතියක් කම්කරු දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කරන ලදී. මෙය කම්කරු දෙපාර්තමේන්තුව හා සේවක අර්ථසාධක අරමුදල අතර දත්ත හුවමාරු කිරීම සඳහා විදුලි සංදේශ මාර්ග භාවිතා කරනු ඇත. පළමු වතාවට අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන මුද්‍රණය කිරීමේ කටයුතුද ක්‍රියාත්මක කරන ලදී.

## ස්වයංක්‍රෘත චෙක්පත් නිශ්කාෂණාගාරය

විමර්ශණයට ලක් වූ වර්ෂය තුළ නිෂ්කාශණය කරන ලද චෙක්පත් ප්‍රමාණය 32,764,350 කි. දිනක සාමාන්‍ය නිෂ්කාෂිත ප්‍රමාණය 134,833 ක් වේ. මෙය 1998 සිට චෙක්පත් 1,407,810 ක වාර්ෂික වැඩි වීමකි. නිෂ්කාශණය කරන ලද චෙක්පත් ප්‍රමාණයේ ඉහළ යෑමක් ඇති වී තිබුණද

ස්වයංකෘත චෙක්පත් නිෂ්කාශණාගාරයට තම කටයුතු පවත්වාගෙන යාමේ වියදම් අඩු කර ගනිමින් දනට සිටින කාර්ය මණ්ඩලය උපයෝගී කර ගනිමින්ම කරගෙන යාමට හැකි වී තිබේ.

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවුම් ක්‍රමය (ස්ලිප්ස්), ක්‍රියාත්මක කරන ලද ගනුදෙණු ප්‍රමාණයේ සියයට 68 ක සැළකිය යුතු වර්ධනයක් දක්නා ලදී. තවදුරටත් කෙනෙකුගෙන් මුදල් ස්ලිප්ස් ක්‍රමය හරහා සීමාවක් දක්වා හර කිරීමටත්, අර්ථලාභියාගේ ගිණුමට බැර කිරීමටත් අවසර දෙන සෘජු හර කිරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලද අතර සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සේව්‍යයන්ගේ දයක මුදල් එකතු කිරීම සඳහා එය භාවිතා කරනු ලැබේ.

ස්වයංකෘත චෙක්පත් නිශ්කාෂණාගාරය සිය කටයුතුවල තිබෙන අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් ප්‍රධාන වැඩ බිමේ කටයුතු අවහිර වූ අවස්ථාවක කටයුතු කරගෙන යාම සහතික කිරීම සඳහා දෙවන වැඩබිමක් 1999 ඔක්තෝබර් මාසයේදී ස්ථාපනය කරන ලදී.

ස්වයංකෘත චෙක්පත් නිශ්කාෂණාගාරය වසර 2000 අනුගත වීම අත් කර ගන්නා ලද අතර බැංකු ක්ෂේත්‍රයට වසර 2000 ට මාරු වීම සඳහාද උපකාර කරන ලදී.

## කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 1999 වර්ෂය තුළදී මහ බැංකු කටයුතුවල කාර්යක්ෂමතාවය, සකසුරුවම සහ ඵලදයීතාවය දියුණු කිරීමේ අරමුණින් බැංකුවේ වාර්ෂික විගණන වැඩසටහනට අනුව, අභ්‍යන්තර විගණන සහ කළමනාකාරිත්ව සේවා කටයුතු ඉටු කරන ලදී.

වර්ෂය තුළදී, සංසරණයට නුසුදුසු සහ පලුදු වූ මුදල් නෝට්ටු දශ ලක්ෂ 85 ක් පමණ විනාශ කිරීමට පෙර විගණනය කරන ලද අතර, අභාවිත මගින් නෝට්ටු කැබලි කිරීම සහ පිලිස්සීම නිසිපරිදි ඉටුකිරීම සහතික කරනු පිණිස, එම කටයුතු අධීක්ෂණය කරන ලදී.

මහ බැංකුවේ කොළඹ සහ ප්‍රාදේශීය කාර්යාලවල පිහිටි සුරක්ෂිතාගාරවල ඇති මුදල් හා කාසි තොග පිළිබඳ වාර්ෂික භෞතික පරීක්ෂණද දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මුදල් තොග ලැබීම් හා නිකුත් කිරීම් සැසඳීමෙන් පසුව මුදල් තොග ලේඛණ පරීක්ෂා කර විගණන නිලධාරීන් විසින් සහතික කරන ලදී. තවද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට අයිති මුදල් කවුන්ටර් 15 වාරයක් හදිසි පරීක්ෂාවන්ට ලක් කරන ලදී. සීමාසහිත ඩිලාරු ලංකා කරන්සි ඇන්ඩ් සිකියුරටි ප්‍රින්ට් (පෞද්ගලික) සමාගම විසින් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමෙන් පසුව ඉවත ලන ද විනාශ කිරීම අධීක්ෂණය කරන ලද අතර මුදල් නෝට්ටු සැපයීම පිළිබඳව එම සමාගමට ගෙවිය යුතු මුදල්, පෙර විගණනය කරන ලදී. නිරවද්‍යතාවය සහතික කරනු වස් බැංකු කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යයන්ද පසු විගණනයට ලක් කෙරිනි.

මහ බැංකු සේවකයින්ට කරන ලද සියළුම ගෙවීම් විගණනය කිරීමට අමතරව ලේකම් දෙපාර්තමේන්තුව සහ සුභසාධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන මහ බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල, අර්ථසාධක අරමුදල, වැන්දඹු අනන්දරු සහ වැන්දඹු පුරුෂ අනන්දරු අරමුදල් සහ අනෙකුත් සුභසාධන යෝජනා ක්‍රමවලට අදල වාර්ෂික ගිණුම් වාර්තා පෙර විගණනය කරන ලදී. මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයට සහ ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරයේ ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමට පෙර විගණනයට ලක් කෙරිනි. මෙම වාර්තාවල තිබූ ඌණතා පෙන්වා දීමෙන් පසු ඒවා නිවැරදි කරන ලද අතර පැන නැගුනු ක්‍රියාපටිපාටිමය සහ ප්‍රතිපත්තිමය ගැටළුද අවුරුද්ද තුළදී නිරාකරණය කරන ලදී.

නිරවද්‍යතාවය සහ මහ බැංකුවට ගෙවීමට ඇති ණය තුරුස් අය කර ගත් බව සහතික කිරීමේ අරමුණින්, මහ බැංකු සේවය අවසන් කිරීමේදී සේවකයින්ට ගෙවන ලද අර්ථසාධක අරමුදල් ශේෂ සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීම් විගණනය කරන ලදී. සුභසාධන ණය ක්‍රම යටතේ දෙන ලද සියළුම ණය සහ සහනදයී ගමන් පහසුකම්, වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ මහ බැංකු භෝජනාගාරයට අදල සියළුම වාර්තා විගණනය කරන ලදී.

තවද, සේවක අර්ථසාධක අරමුදලේ අර්ථලාභීන්ට ගෙවන ලද සියළුම ගෙවීම් පෙර විගණනය කරන ලද අතර අර්ථසාධක අරමුදලේ වාර්ෂික ගිණුම්ද විගණනය කරන ලදී.

මහ බැංකුවේ නව ගොඩනැගිල්ලට හා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමට අදළ සියළුම ගෙවීම් සහ ලේකම් දෙපාර්තමේන්තුව හා පරිග්‍ර දෙපාර්තමේන්තුව විසින් මිළදී ගන්නා ලද භාණ්ඩ හා සේවාවන් වෙනුවෙන් කරන ලද ගෙවීම්ද, වාහන නඩත්තු සඳහා දරන ලද වියදම්ද විගණනය කරන ලදී.

මහ බැංකුවේ සියළුම සේවකයන්ගේ නිවාඩු වාර්තා පසු විගණනය කරන ලදී.

අදළ වර්ෂය තුළදී රත්රන් තොග, වාහන සහ මහ බැංකු මුද්‍රණාලය විසින් පාවිච්චි කරන තොග භෞතික පරීක්ෂාවට භාජනය කරන ලදී. සතිපතා පවත්වන, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා විද්යුත් ලංසු ඉදිරිපත් කිරීම පිණිස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සකසන ලද පරිඝණක වැඩසටහන පරීක්ෂා කර, එම ක්‍රමය ක්‍රියාවට නැංවීමට පෙර කළයුතු වෙනස්කම් පිළිබඳව අදහස් දන්වා යවන ලදී. තවද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන කාර්යයන් පිළිබඳ පසු විගණනයන් වර්ෂය තුළදී කරන ලදී.

කළමනාකාරිත්ව සේවා අංශය විසින් අධ්‍යයනයන් ගණනාවක් කරන ලද අතර, මාතර ප්‍රාදේශීය කාර්යාලය ඉටු කරන කාර්යයන් සහ කාර්ය මණ්ඩලය යෙදවීම පිළිබඳ අධ්‍යයනය, මහ බැංකුවේ ලසු/යතුරු ලේඛකයන් මාණ්ඩලික පංතියට උසස් කිරීම සහ ලසු/යතුරු ලේඛකයන් මහ බැංකු සේවාවට බඳවා ගැනීම පිළිබඳ කරන ලද අධ්‍යයනයන්ද ඒ අතර විය.

## පුහුණු වැඩකටයුතු

මුදල් නීති පනතේ 27 වගන්තියට අනුව මහ බැංකුව විසින් බැංකුවට අදළ විෂයයන්ගෙන් දක්ෂතා පෙන්නුම් කළ සේවකයින් ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි පුහුණු කිරීම් සම්බන්ධව දිරි ගැන්වීම් හා අනුග්‍රහය දක්වීම් කරනු ලබයි.

අධ්‍යාපනික අංශය ගත්විට මෙරට හා විදේශයන්හි පිළිගත් විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව පිළිබඳව සහ අනුබද්ධිත ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල පුහුණු කිරීම් අදළ වේ. විමසුමට ලක් කරන වර්ෂය තුළ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් හය (6) දෙනෙකු විදේශගත වූ අතර, එක් නිලධාරියෙක් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාවකට සහභාගී විය. ඊට අමතරව එක් නිලධාරියකු කල්කටාවේ ජාත්‍යන්තර සංඛ්‍යාන අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉන්දියාවට යවනු ලැබීය.

1999 දෙසැම්බර් මස අවසානය වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් පහළොස් දෙනෙක් විදේශ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටියහ. අනෙක් අතට විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු නැවත සේවයට වාර්තා කළ නිලධාරීන් අට (8)දෙනෙක්ද විය.

II -29 සංඛ්‍යා සටහන

**නිලධාරීන් පුහුණු කිරීම්: පශ්චාත් උපාධි අධ්‍යයන**

**1998/1999**

| වර්ෂය | පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පිටත් වූ සංඛ්‍යාව | පශ්චාත් උපාධි අධ්‍යයනයෙන් පසු පැමිණි සංඛ්‍යාව | 1999 දෙසැ. 31 දිනට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියුක්තව සිටි සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | ආචාර්ය උපාධි | ශාස්ත්‍රපති/පශ්චාත් උපාධි ඩිප්ලෝමා |
| 1998 | 06 | 09 | 04 | 12 |
| 1999 | 07 | 08 | 02 | 13 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## කෙටිකාලීන පුහුණුකිරීම්

විමසුමට ලක් කරන වර්ෂය තුළ අධ්‍යාපන නොවන පුහුණු කිරීම් සඳහාද බැංකුවේ නිලධාරීන් නම් කරනු ලැබීය. බැංකුවට ප්‍රයෝජනවත් විෂය ක්ෂේත්‍රයන්ට අදාලව දේශීය හා විදේශයන්හි පවත්වන ලද කෙටිකාලීන පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු වලින් මේවා සමන්විත විය. 1999 වර්ෂය තුළ විදේශයන්හි පවත්වන ලද එවැනි කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් සඳහා නිලධාරීන් 127 දෙනෙකු සහභාගී වූ අතර බැංකු අධ්‍යයන කේන්ද්‍රය විසින් පවත්වනු ලැබූ පාඨමාලා 48 ක් සඳහා නිලධාරීන් 573 ක් සහභාගී විය.

1999 වර්ෂය තුළ කෙටිකාලීන පුහුණුව ලද නිලධාරීන්ගේ සංඛ්‍යාව 1998 වර්ෂයේ දත්ත සමග සංසන්දනාත්මකව II-30 වන සංඛ්‍යා සටහනෙහි දක්වේ.

II - 30 සංඛ්‍යා සටහන

**නිලධාරීන් පුහුණුකිරීම්**

**කෙටිකාලීන පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණ**

**1998/1999**

(පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව)

| දෙපාර්තමේන්තු | විදේශීය | | දේශීය (බැං. අ.කේ. මගින් පවත්වන ලද) | |
|---|---|---|---|---|
| | 1998 | 1999 | 1998 | 1999 |
| 1. බැංකු කටයුතු | 24 | 21 | 39 | 28 |
| 2. ආර්ථික පර්යේෂණ | 17 | 21 | 20 | 29 |
| 3. බැංකු අධීක්ෂණ | 17 | 20 | 26 | 104 |
| 4. තොරතුරු තාක්ෂණ | 7 | 15 | 17 | 12 |
| 5. ලේකම් | 7 | - | 39 | 32 |
| 6. සේ.අ.අ. | 3 | 5 | 13 | 11 |
| 7. රාජ්‍ය ණය | 2 | 8 | 20 | 23 |
| 8. බැංකු සංවර්ධන* | 1 | 6 | 17 | 23 |
| 9. ග්‍රාමීය ණය | - | 6 | 12 | 24 |
| 10. බැංකු අධ්‍යයන කේන්ද්‍රය | 1 | 2 | 10 | 6 |
| 11. ව්‍යවහාර මුදල් | 1 | 3 | 16 | 132 |
| 12. සංවර්ධන මුදල් | 1 | 2 | 5 | 10 |
| 13. ආයතන | 1 | 2 | 15 | 12 |
| 14. විනිමය පාලන | - | 3 | 6 | 8 |
| 15. මූල්‍ය වෙළෙඳපොළ | 1 | 1 | 3 | 2 |
| 16. කළමනාකාරිත්ව විගණන | 1 | 2 | 4 | 8 |
| 17. පරිශ්‍ර | - | 1 | 5 | 8 |
| 18. සංඛ්‍යාන | 2 | 5 | 13 | 20 |
| 19. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 2 | 3 | 16 | 37 |
| 20. සුභසාධන | 1 | 1 | 15 | 11 |
| 21. පුහුණු වැඩකටයුතු | 1 | - | 1 | 4 |
| 22. ආරක්ෂක සේවා | - | - | 1 | 7 |
| 23. නව ගොඩනැගිලි | - | - | 1 | 2 |
| 24. නීති | - | - | - | 2 |
| 25. ප්‍රවෘත්ති | - | - | 8 | 18 |
| එකතුව | 90 | 127 | 322 | 573 |
| පුහුණු කටයුතු සඳහා පිරිවැය (රු. දශලක්ෂ) | 25.1 | 24.1 | 1.5 | 2.8 |

** ප්‍රාදේශීය කාර්යාලද ඇතුළත්ව

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## නේවාසික පුහුණු කිරීම්

මෙම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ප්‍රතිහුවමාරු ගිවිසුම් සහ මූල්‍ය ව්‍යුත්පන්නයන් පිළිබඳ නේවාසික පුහුණු පාඨමාලාවක් නිව්යෝර්ක් මූල්‍ය ආයතනය (එන්වයිඅයිඑෆ්) විසින් 1999 අගෝස්තු 09 සිට 13 දින දක්වා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේදී පවත්වන ලදී. මේ පාඨමාලාව සඳහා මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් 4 ක් හා මහ බැංකුවේ නිලධාරීන් 21 ක් සහභාගී වූ අතර වියදමෙන් කොටසක් ලෝක බැංකුවෙන් දරන ලදී.

II - 31 සංඛ්‍යා සටහන

**පෞද්ගලික ආයතන විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණ වැඩමුළු සඳහා සහභාගීවීම් (දේශීය)-1999**

| දෙපාර්තමේන්තුව | නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුවීම් ක්ෂේත්‍රය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | මානව සම්පත් කළමනාකරණය | ආර්ථික සංවර්ධනය | පරිගණක | ගණකාධිකරන හා විගණන | බැංකු කටයුතු | සංනිවේදන | නීතිය |
| බැං.ස. | 3 | - | - | - | - | 3 | - | - |
| බැං.ක. | 20 | - | 3 | 1 | 4 | 11 | 1 | - |
| බැං.ක.අ.කෝ. | 2 | 1 | - | 1 | - | - | - | - |
| බැං.අ. | 8 | 2 | 1 | - | - | 5 | - | - |
| සං.මු. | 1 | - | 1 | - | - | - | - | - |
| ක.වි. | 4 | - | - | 1 | 3 | - | - | - |
| වි.පා. | 3 | - | 1 | - | - | 1 | - | 1 |
| සේ.අ.අ. | 4 | - | - | 1 | - | 2 | 1 | - |
| ආ.ප. | 18 | 2 | 11 | 1 | - | 3 | - | 1 |
| ආයතන | 14 | 12 | - | - | - | 2 | - | - |
| මූල්‍ය වෙළඳපළ | 2 | - | 1 | - | 1 | - | - | - |
| ප්‍රවෘත්ති | 5 | - | - | 2 | - | - | 3 | - |
| තො.තා. | 36 | - | - | 36 | - | - | - | - |
| නීති | 7 | - | - | 1 | - | - | - | 6 |
| න.ගොඩනැගිලි | 3 | - | - | 1 | 2 | - | - | - |
| රා.ණ | 7 | 1 | - | - | 1 | 5 | - | - |
| ග්‍රා.ණ. | 6 | - | 1 | - | 5 | - | - | - |
| ලේකම් | 20 | 8 | - | 1 | 8 | - | - | 3 |
| බැ.තො.මු.ආ.අ. | 2 | 2 | - | - | - | - | - | - |
| සංඛ්‍යාන | 10 | 1 | 3 | - | - | 2 | 4 | - |
| පු.වැ.ක | 1 | 1 | - | - | - | - | - | - |
| සුභසාධන | 2 | - | - | 1 | 1 | - | - | - |
| එකතුව | 178 | 30 | 22 | 47 | 25 | 34 | 9 | 11 |

## පුහුණු කිරීම්/දේශීය (වෙනත් ආයතන)

සේවා සම්මේලනය, සින්ටෙක්, එන්අයිබීඑම්, සීඅයිඑම්ඒ වැනි ආයතන විසින් පවත්වන ලද කෙටිකාලීන සම්මන්ත්‍රණ/වැඩමුළු/පාඨමාලා සඳහා නිලධාරීන් 178 දෙනෙක් සහභාගී විය.

මෙම පාඨමාලාවන්ට දෙපාර්තමේන්තු මට්ටමින් සහභාගී වූ සංඛ්‍යාව හා අදාළ පුහුණුවීම් ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තර II-31 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## අනෙකුත් කාර්යයන්

### (අ) සම්මන්ත්‍රණ :

1999 වර්ෂය තුළ විදේශීය සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ සම්මන්ත්‍රණ/දේශන 6 ක් පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. අදළ ක්ෂේත්‍රයන් පිළිබඳව බැංකුවේ නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය කෙරුණි. මෙම සම්මන්ත්‍රණ/දේශන පිළිබඳ මාතෘකා පහත දැක්වේ.

* ගෙවීම් ක්‍රම
* අර්බුදකාරී විශ්‍රාම වැටුප් ක්‍රම ; අභියෝගයන් හා විකල්පයන්
* මූල්‍ය අංශය සඳහා පරිගණක ජාලයන් ; සිංගප්පූරුවෙන් ඉගෙනගත හැකි පාඩම්
* රාජ්‍ය ණය කළමනාකරණය
* ලෝක වෙළඳ සංවිධානය සහ ශ්‍රී ලංකාව කෙරෙහි එහි බලපෑම

ආරාධිත කථිකයන් විසින් දේශන දෙකක්ද පවත්වන ලදී.

* දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ ලෝක බැංකු වැඩසටහන (මයිකල් ෆෝලේ, කළමනාකරු, දුරස්ථ අධ්‍යාපන ඒකකය, ලෝක බැංකු ආයතනය)
* මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ හා ආර්ථික වර්ධනය කෙරෙහි එහි බලපෑම (ආචාර්ය අයුනුල් හසාන්, ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ආකේඩියා විශ්ව විද්‍යාලය, කැනඩාව)

### (ආ) තෝරා ගත් කියවීම් :

විමසුමට ලක් කරන වර්ෂය තුළ පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් තෝරා ගත් විෂයයන්ට අදළව

නවතම ලිපි ඇතුළත් තෝරා ගත් කියවීම් පිළිබඳ ලිපි කාණ්ඩයක් ඉදිරිපත් කරන ලදී. මෙම කාණ්ඩය යටතේ දෙපාර්තමේන්තුව විසින් පහත දක්වෙන ලිපි ඇතුළත් කරමින් කාණ්ඩ අංක 4 ක් නිකුත් කරන ලදී.

* පරිණත වෙළඳපළවල මෑතකාලීන උච්චාවචන-යන්ගේ ක්‍රමික දක්ම - ජෙරී මිනාසි (ජා.මු.අ.)
* ආර්ථික අර්බුද පුරෝකථනය කිරීමේ අභියෝග - සුනිල් ෂාමා (ජා.මු.අ.)
* ණය යෝග්‍යතා වර්ගීකරණයේදී දේශපාලනික හා ආර්ථික විචල්‍යයන්හි සාපේක්ෂ වැදගත්කම - නදීම් අල් හක් (ජා.ම.අ.)
* ආර්ථික අර්බුදවලට ප්‍රතිචාර දක්වීම ආර්ථිකයන් සාධාරණව යථා තත්ත්වයට පත් වීම සහ සංවර්ධනය උදෙසා ප්‍රතිපත්තිමය විකල්පයන් - ජෝශප් ස්ටිග්ලිට්ස් (ලෝක බැංකුව)

### (ඈ) පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා පංති :

දෙපාර්තමේන්තුව විසින් විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කිරීම සඳහා අදහස් කරන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ආර්ථික විද්‍යාව සහ ගණිතය විෂයයන් පිළිබඳ පංති පැවැත්වීම තවදුරටත් කරගෙන යන ලදී. පශ්චාත් උපාධි සුදුසුකම් ලත් බැංකුවේ නිලධාරීන් විසින් පවත්වන ලද මෙම පංතිවලට නිලධාරීන් 30 දෙනෙක් සහභාගී විය.

### (ඇ) දැනුවත් වීමේ වැඩසටහන් :

විමසුමට ලක් කරන වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ස්වයංකෘත නිෂ්කාශනායතනය සමග එක් වී මහ බැංකුවේ නිලධාරීන් සඳහා දැනුවත් වීමේ වැඩසටහනක් නිෂ්කාශනායතනයේදී පවත්වනු ලැබීය. මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු වලින් නිලධාරීන් 54 දෙනෙක් මෙම වැඩසටහනට සහභාගී විය.

පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙනත් අදාළ ආයතන සමග එක් වී බැංකු කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා මෙවැනි වැඩසටහන් අනාගතයේදී පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ.

## සුභසාධන

බැංකුව විසින් කාර්ය මණ්ඩලය වෙත සපයනු ලබන සුභසාධක පහසුකම් පරිපාලනය කරනු ලබන්නේ සුභසාධක දෙපාර්තමේන්තුව මගිනි. කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හා ඔවුන්ගේ ලියාපදිංචි යැපෙන්නන්ට, විශ්‍රාමිකයන්ට, වැන්දඹු අනන්දරු විශ්‍රාමිකයන්ට සහ බෝම්බයෙන් විපතට පත් අයට සපයන වෛද්‍ය පහසුකම් දිගටම පැවතිණි. සේවකයින්ට නිවාස, වාහන මිළදී ගැනීම් සහ වෙනත් කටයුතු සඳහා වන සහනදායී ණය ක්‍රම කිහිපයක් ක්‍රියාත්මකව පැවතිණි. වර්ෂය තුළදී වාහන ණය මුදලේ ප්‍රමාණය සහ කාර්ය මණ්ඩල සුභසාධණ 'බී' කාණ්ඩයේ ණය මුදලේ ප්‍රමාණය වැඩි කරන ලදී.

සහනදායී දුම්රිය සහ බස් ප්‍රවේශ පත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර ලබා දීමේ ක්‍රමය පෙර පැවති පරිදිම ක්‍රියාත්මක විය. කෙසේ වුවද, බැංකුවේ දෙපාර්තමේන්තු විවිධ ස්ථානයන්හි ස්ථානගතවී තිබීම නිසා ආපනශාලා පහසුකම් සැපයීම විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී සීමා විය. අවශ්‍යතාවන්ට අනුව හැකිතාක් දුරට ආපනශාලා පහසුකම් සපයන ලදී.

මහ බැංකු වෛද්‍ය මධ්‍යස්ථානය මගින් රාජකාරි වේලාව තුළදී ගෘහස්ථ වශයෙන් සේවා සැපයීම දිගටම කරන ලදී.

ගිනුම්කරණය සහ ගෙවීම් ක්‍රම සඳහා වැඩි පහසුකම් සපයා දෙමින් සුභසාධන පරිපලනය පරිගණකගත කිරීම දිගටම සිදු කරන ලදී. මෙමගින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වර්ධනය වූ අතර, සුභසාධන කළමනාකරණය සඳහා වන වියදම අඩුකර ඇත.

## කාර්ය මණ්ඩල පුවත්

ආයතන දෙපාර්තමේන්තුව සිය දර්ශනය සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගෙන තම කාර්ය භාරයන් සහ වගකීම් පැහැදිලිව අවබෝධ කර ගනිමින් ඒවා කාර්යක්ෂමව හා ඵලදායී අන්දමින් ඉටු කිරීමටත්, මතු විය හැකි අවශ්‍යතාවයන්ට හා අභියෝගයන්ට නොපැකිලව මුහුණ දීමටත් හැකි, සිය හැකියාවන් නියමාකාරයෙන් වර්ධනය කර ගන්නා දක්ෂ හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සඳහා 1999 වර්ෂය තුළදීත් සිය කාර්යයන් වන බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්වලට අදළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

1999 වර්ෂය තුළදී බැංකුවේ ප්‍රධාන පුස්තකාලයාධිපති තනතුර සහ සහකාර පුස්තකාලයාධිපති තනතුරු දෙකක් සඳහා පත් කිරීම් සිදු කරන ලදී. බැංකුවේ මුදල් කෞතුකාගාරයේ සහ මහ බැංකු උරුමය ව්‍යාපෘතියේ විශේෂිත කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා උපදේශකයන් දෙදෙනකු පත් කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව මගින් 1999 ජනවාරි මස 16 සහ 17 දිනවල බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේදී නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා වැඩ මුළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. මෙම වැඩ මුළුවෙහිදී, 2000 වසර හා ඉන් ඔබ්බට ඇති අභියෝගයන් සහ අපේක්ෂාවන්, ආයතනය තුළ යටත් සේවකයිනට නායකත්වය ලබා දීම

සහ කාර්ය විස්තර පිළියෙල කිරීම් හා කාර්ය සාධන ඇගයීම් සඳහා යොද ගැනෙන විද්‍යාත්මක ප්‍රවේශයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

පුවත්පත් නිවේදනයකට ප්‍රතිචාර වශයෙන් අයැදුම් කරනු ලැබූ අපේක්ෂකයන්ගෙන් මාණ්ඩලික පංතියට සුදුසු නිලධාරීන් තෝරා ගැනීම සඳහා 1999 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය මගින් විවෘත තරහ විභාගයක් පවත්වන ලදී.

1998 වර්ෂයේදී අත්හද බැලීමේ පදනමක් මත හඳුන්වා දෙන ලද නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමය මෙම වර්ෂය තුළදීද සේවකයින් ඇගයීම සඳහා අඛණ්ඩව යොද ගන්නා ලදී.

මහබැංකු අධිපති ඒ. එස්. ජයවර්ධන මහතා 1999 වර්ෂය තුළදී පහත දැක්වෙන රැස්වීම් වලට සහභාගී විය.

1. 1999 ජනවාරි 28 වැනි දින සිට පෙබරවාරි 2 වැනි දින දක්වා ස්විට්සර්ලන්තයේ, ඩාවෝස් හි පවත්වන ලද ලෝක ආර්ථික සමුළුව සහ 1999 පෙබරවාරි 6 සිට 12 වැනි දින දක්වා ජැමෙයිකාවේ මොනටෙගෝවේ නගරයේ පවත්වන ලද 15 කණ්ඩායමේ සමුළුව හා ආර්ථික සහ වෙළඳ ඇමතිවරුන්ගේ රැස්වීම.
2. 1999 අප්‍රේල් 21 සිට 28 වැනි දින දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. නගරයේ දී පවත්වන ලද ජා. මූ. අ./ ලෝක බැංකු වසන්ත රැස්වීම්.
3. 1999 මැයි 20 සිට 22 වැනි දින දක්වා දකුනු කොරියාවේ සොල් නගරයේ පැවති 34 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු (සියසන්) අධිපතිවරුන්ගේ සමුළුව.
4. 1999 ජුනි 1 සිට 2 වැනි දින දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් නගරයේ පැවැත්වුණු මූල්‍ය සේවා ලිහිල් කරනය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය සමුළුව, 1999 ජුනි 4 දින ලන්ඩන් නගරයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව සහ 1999 ජුනි 5 සිට 7 වැනි දින දක්වා ස්විට්සර්ලන්තයේ බැසල් නගරයේ පැවැත්වුනු ජාත්‍යන්තර ගනුදෙනු පියවීමේ බැංකුවේ වාර්ෂික රැස්වීම.
5. 1999 සැප්තැම්බර් 23 සිට 30 වැනි දින දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. නගරයේ දී පවත්වන ලද 1999 ජා. මූ. අ./ ලෝක බැංකු අධිපති මණ්ඩලයේ වාර්ෂික රැස්වීම්.

## පත් කිරීම්

1. අතිරේක ලේකම් සී.කේ.පරණවිතාන මහතා 1999 ජනවාරි මස 1 වැනි දින සිට ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.
2. පහත සඳහන් නිලධාරීන් 1999 අප්‍රේල් මස 15 වැනි දින සිට මාණ්ඩලික පංතියේ 4 වන ශ්‍රේණියට උසස් කර අදළ තනතුරු වලට පත් කරන ලදී.
   - i. ප්‍රාදේශීය කළමණාකරු, අනුරාධපුරය - සී.එම්.ආරියරත්න මිය වැඩ බලන අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන්,
   - ii. නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, එම්.එම්.අත්තනායක මහතා වැඩ බලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්,
   - iii. නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, ආචාර්ය අනිලා ඩී.බණ්ඩාරනායක මිය වැඩ බලන අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන්,
   - iv. නියෝජ්‍ය රාජ්‍ය ණය අධිකාරී, කේ.ජී.ඩී.ඩී.ධීරසිංහ මහතා වැඩ බලන අතිරේක රාජ්‍ය ණය අධිකාරී වශයෙන්,
   - v. නියෝජ්‍ය අධ්‍යක්ෂ සංඛ්‍යාන, පී.ඩී.ජේ.ප්‍රනාන්දු මහතා වැඩ බලන අතිරේක සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන්,
   - vi. නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, එල්.කේ.ගුණතිලක මිය වැඩ බලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්,
   - vii. නියෝජ්‍ය ලේකම්, කේ.ජෙගනාදන් මහතා වැඩ බලන අතිරේක ලේකම් වශයෙන්,
   - viii. නියෝජ්‍ය ලේකම්, එස්.කදුරුගමුව මිය නීති දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන්,
   - ix. නියෝජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී, ඒ.ආර්.ඒ.මිහිඳුකුලසූරිය මහතා වැඩ බලන අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන් සහ ඉන් අනතුරුව 1999 ජූලි මස 1 වැනි දින සිට වැඩ බලන නව ගොඩනැගිලි අධ්‍යක්ෂ වශයෙන්,
   - x. නියෝජ්‍ය අධ්‍යක්ෂ ග්‍රාමීය ණය, සී. කේ. නානායක්කාර මිය වැඩ බලන අතිරේක ග්‍රාමීය ණය අධ්‍යක්ෂ වශයෙන්,
   - xi. නියෝජ්‍ය ලේකම්, ජේ.එල්.ට්.පීරිස් මහතා වැඩ බලන අතිරේක ලේකම් වශයෙන්,
   - xii. නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී, එන්. ජේ.පෙරේරා මහතා වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන්,

xiii. නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ, කේ.ඒ.ඩී.රූපසේන මහතා වැඩ බලන අතිරේක ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වශයෙන් සහ ඉන් අනතුරුව 1999 ජූලි මස 1 වැනි දින සිට වැඩ බලන අතිරේක ආයතන අධ්‍යක්ෂ වශයෙන්,

xiv. නියෝජ්‍ය අධ්‍යක්ෂ, බැංකු සංවර්ධන එම්.ජී.සේනානායක මහතා වැඩ බලන අතිරේක බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන්,

xv. නියෝජ්‍ය විනිමය පාලක, පී.පී.සිරිසේන මිය වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන්.

3. අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී එම්.එස්.සිරිපාල මහතා 1999 අප්‍රේල් මස 15 වැනි දින සිට අතිරේක පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

4. අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සී.අයි.ප්‍රනාන්දු මෙනෙවිය 1999 අප්‍රේල් මස 15 වැනි දින සිට වැඩ බලන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද අතර, ඉන් අනතුරුව, 1999 ජූලි මස 14 වැනි දින සිට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

5. පහත සඳහන් පත් කිරීම් 1999 ජූලි මස 1 වැනි දින සිට සිදු කරන ලදී.

i. විනිමය පාලක එම්.ආර්.ප්‍රනාන්දු මහතා ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන්,

ii. අධ්‍යක්ෂ, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය, එච්.ඒ.ජී.හෙට්ටිආරච්චි මහතා විනිමය පාලක වශයෙන්,

iii. ව්‍යවහාර මුදල් අධිකාරී, ජේ.එම්.ටී.බී.ජයසුන්දර මහතා පරිග්‍ර අධ්‍යක්ෂ වශයෙන්,

iv. සංවර්ධන මුදල් අධ්‍යක්ෂ, ආචාර්ය එන්.එල්.සිරිසේන බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වශයෙන්,

v. අතිරේක ආයතන අධ්‍යක්ෂ, එම්.රාමනාදන් මහතා සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන්.

6. බැංකු සංවර්ධන අධ්‍යක්ෂ, සී.අබේනායක මෙනෙවිය 1999 සැප්තැම්බර් මස 16 වැනි දින සිට මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කර, අධිපතිගේ සහකාර වශයෙන් නිල නම් කරන ලදී. මීට අමතරව ඇය බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද ක්‍රියා කරනු ලැබේ. 1999 සැප්තැම්බර් 16 දින සිට මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන්ද පත් කරන ලදී.

7. විධායක අධ්‍යක්ෂ, පී.එම්.නාගහවත්ත මහතා 1999 සැප්තැම්බර් මස 23 වැනි දින සිට නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

## විශ්‍රාම ගැනීම්

1. ලේකම්, ටී.ජී.සෞන්ද්‍රනායගම් මහතා 1999 ජනවාරි මස 09 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

2. විධායක අධ්‍යක්ෂ, එච්.එම්.ආර්.ඇල්ලෙපොල මහතා 1999 මාර්තු මස 28 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

3. පරිග්‍ර අධ්‍යක්ෂ සහ නව ගොඩනැගිලි අධ්‍යක්ෂ, ටී.එච්.ඩී.පීරිස් මහතා 1999 ජූනි මස 01 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

4. අතිරේක ප්‍රධාන ගණකාධිකාරී, ඒ.ෂන්මුගසාමි මහතා 1999 ජූලි මස 08 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

5. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ, වයි.ඒ.පියතිස්ස මහතා 1999 ජූලි මස 14 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

6. නියෝජ්‍ය අධිපති, එස්.ඊස්පරදසන් මහතා 1999 සැප්තැම්බර් මස 23 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

7. අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, ආචාර්ය පී.බී.ජයසුන්දර 1999 නොවැම්බර් මස 05 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

8. විධායක අධ්‍යක්ෂ, ජී.එම්.පී.ඩී. ද සිල්වා මහතා 1999 නොවැම්බර් මස 08 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

## මුද හරිනු ලැබ සිටි නිලධාරීන් (1999.12.31 වැනි දිනට)

1. ආචාර්ය රාණි ජයමහ මිය ලන්ඩනයේ පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත.

2. එම්.ඒ.ආර්.සී.කුරේ මිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

3. ආචාර්ය ඒ.ජී.කරුණාසේන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන්.

4. ආචාර්ය යූ.විදනපතිරණ අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) වශයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත.

5. ආචාර්ය ඩී.ජේ.පී.ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

6. එම්.ජේ.එස්.අබේසිංහ මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

7. ඒ.අබයරත්න මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

8. ආර්.ධර්මකීර්ති මහතා සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත.

9. පී.ජී.ජයතුංග මහතා වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය වෙත.